
පළමු කාණ්ඩය - සිව්වැනි-පස්වැනි කලාප

අගෝස්තු - සැප්තැම්බර්

ද්විත්ව කලාපය



# ශ්‍රී ලංකාවේ මානව හිමිකම්

**නවී පිල්ලේ ට දැන් තේරෙයි !** 2

*- ඉතිහාසයේ ප්‍රථම වතාවට ජගත් සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම්වල සොදාපාළුවට හේතු වූ සැබෑ හේතුව - කාරණත්ව දාමයේ සැබෑ ආරම්භය සොයාගෙන ඇත්තා සේ ය.*



**කෙමෙන් වැඩිවන ඒකාධිපතිත්වයේ ලක්ෂණ සහ එහි ආනිශංස** 5


**අලුත් පොත් - සාහිත්‍ය මාසය වෙනුවෙන් ආසියානු මානව හිමිකම් කොමිසම විසින් එළිදැක්වූ ප්‍රකාශන** 23

**අඩු වී තිබුණේ මෙච්චරයි!** – අලුතෙන් වැඩ ඇල්ලූ නීතිය හා සාමය අමාත්‍යාංශය 24

**ශ්‍රී ලංකාව: ඔප්පු කිරීමේ භාරය ජනතාවට මාරු කිරීම** 27

**Killology ඝාතනවේදය** 71 ජවිපෙ කැරැල්ලේ සිට රතුපස්වල දක්වා සිදුකළ ඝාතනවලදී සන්නද්ධ හමුදාවේ මානසිකත්වය අධ්‍යයනය කළ යුතු නම් ඝාතනවේදය හෙවත් ඝාතන විද්‍යාව නමැති විෂයය ලංකාවේ පර්යේෂකයන්ට විෂය විය යුතුය. 30






BBC සංදේශය 38

**අපේ ඝාතක භාරකාරයෝ** 40

**නීතියේ ආධිපත්‍යය බිඳ වැටුණු දා** 41

**අඳුරුතම යුගයකදී පහන් දැල්වූ ගැහැනිය** 48

**ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ව්‍යූහය විනාශ වීම** අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝගය සම්බන්ධයෙන් ආචාර්ය මාක් කුරේගේ විත්තිවාචකයට ප්‍රතිචාරයක් 50



සංස්කරණ උපදේශකත්වය - බැසිල් ප්‍රනාන්දු

*ආසියානු මානව හිමිකම් කොමිසම* කලාපීය වශයෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානයක් වන අතර ආසියාවේ මානව හිමිකම් සුරක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා ඒවා අධීක්ෂණය, කඩවීම් ලේඛනගත කිරීම හා යුක්තිය සහ ආයතනයික ප්‍රතිසංස්කරණ සඳහා උපදේශන ලබාදීම සිදුකරයි. හොංකොං හි පිහිටා තිබෙන ආසියානු මානව හිමිකම් කොමිසම 1984 වසරේ පිහිටුවනු ලැබීය.



# නවී පිල්ලේ ට දැන් තේරෙයි !

*ඉතිහාසයේ ප්‍රථම වතාවට ජගත් සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම්වල සොදාපාළුවට හේතු වූ සැබෑ හේතුව - කාරණාත්ව දාමයේ සැබෑ ආරම්භය සොයාගෙන ඇත්තා සේ ය. මානව හිමිකම් පිළිබඳ ජගත් සංවිධාන මහකොමසාරිස්වරිය සිය නිල කාලය තුළ රටක යෙදුණු දීර්ඝතම සංචාරය නිමා කරමින් අගොස්තු 31 වැනිදා පුවත්පත් සාකච්ඡාවක් පැවැත්වූවාය. එහිදී ඈ පැහැදිලි ලෙසම කියා සිටියේ ශ්‍රී ලංකාව ඒකාධිපතිත්වය වෙත ගමන් කරමින් සිටින බවයි. සැබවින්ම ආසියානු මානව හිමිකම් කොමිසම බොහෝ කලකට පෙර සිටම නොයෙක් වර මේ බව අවධාරණය කර තිබිණි. ඒ ඒකාධිපතිත්වයේ බීජ 1978 ආණ්ඩුක්‍රමය මගින් වැපිරුණු ආකාරය ද ආසියානු මානව හිමිකම් කොමිසම ඉතා පැහැදිලිව නොයෙක් වර විශ්ලේෂණය කර තිබිණි. පහත දැක්වෙන්නේ ආසියානු මානව හිමිකම් කොමිසම විසින් සැප්තැම්බර් 2 දා WORLD/SRI LANKA: Navi Pillay has made the most meaningful statement ever made by the UN on the human rights situation **"නවී පිල්ලේ මානව හිමිකම්වල තත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එදාමෙදාතුර කර ඇති වඩාත්ම අරුත්බර ප්‍රකාශය සිදුකරයි"** යන මැයෙන් ඒ පිළිබඳ නිකුත් කළ විශේෂ ප්‍රකාශයයි.*

**- ආසියානු මානව හිමිකම් කොමිසම විසිනි**

තම සතියක සංචාරය නිමා කර ශ්‍රී ලංකාවෙන් පිටත්ව යාමට පෙර එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් නවනීදන් පිල්ලේ, ශ්‍රී ලංකාව වැඩි වැඩියෙන් අධිකාරීමය දිශාවක් වෙත" යොමුවී තිබීම පිළිබඳ සිය දැඩි කණස්සල්ල පළ කරමින් මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වූවා ය. එහිදී ඈ මෙසේ කීවාය.

*'යුද්ධය අවසන් වීම මගින් නැවුම්, උද්දීප්ත, සකලාංගයෙන් යුත් රාජ්‍යයක් බිහිකිරීමට අවස්ථාවක් සැපයී තිබෙන්නේ වුවද, ශ්‍රී ලංකාව වැඩි වැඩියෙන් අධිකාරිවාදී දිශාවක් වෙත යොමුවන බවට සලකුණු පෙන්වීම ගැන මම දැඩි ලෙස කණස්සල්ලට පත්වන්නෙමි."*

තමන්ට පැවරී තිබූ කාර්ය සීමාව අතික්‍රමණය කිරීමක් ලෙස ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් මේ ප්‍රකාශය විවේචනයට ලක් කර ඇත. නමුත් මෙය දැනුම් තේරුම් සහිත අන්තර්ජාතික සිවිල් සේවිකාවක් විසින් මූලික වශයෙන් ගත් විට නිරීක්ෂණය කෙරෙන දෙයකි. අධිකාරිමය ආණ්ඩු, ඒකාධිපතිත්වය පිළිබඳ ගැටලුව හැම විටෙකම නිරූපණය කිරීමට වෑයම් කරන්නේ මානව හිමිකම් ගැටලුවකට වඩා දේශපාලනමය ගැටලුවක් වශයෙනි. අධිකාරිමය භාවයේ කේන්ද්‍රය, තනි පුද්ගලයාගේ සිවිල් ස්වාධීනත්වය විනාශ කිරීම වන හෙයින් මෙය මනා ලෙස අවබෝධ කර ගත හැකිය.

කෙසේ නමුත්, අධිකාරීමය භාවය මානව හිමිකම්වල වඩාත්ම තීරණාත්මක ගැටලුව වන අතර එය ඉස්මතු වන විට මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ රැකගැනීම සිය විධිපත්‍රය කර ගත් කිසිවෙකු හට සහ අන්තර්ජාතික හෝ වෙනත් ආකාරයක කිසිම දැනුම් තේරුම් සහිත සිවිල් සේවකයෙකු හට එය නොතකා සිටිය නොහැක. පිල්ලේ මහලේකම්වරිය පැහැදිලි ලෙස මේ ගැටලුව ඉස්මතු කිරීම මගින් ශ්‍රේෂ්ඨ මානව හිමිකම් සුරකින්නියක ලෙස සිය පරිණත භාවය පෙන්වා ඇති අතර මානව හිමිකම් නිෂේදනය කරන අසීරුතම ගැටලුව වන අධිකාරිමයභාවය සමග කටයුතු කරමින් මානව හිමිකම් ක්ෂේත්‍රයේ නායකත්වය සඳහා සිය හැකියාව ඔප්පු කර සිටියාය.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අධිකාරිමය භාවය පිළිබඳ ගැටලුව නැගීම මගින් ඇය එක්සත් ජාතීන්ට සහ මානව හිමිකම් පිළිබඳ එහි පරිශ්‍රමයන්ට මෙන්ම අන්තර්ජාතික සහ ශ්‍රී ලංකාවේ සිවිල් සමාජයන්ට සදිසි ලෙසම නව දිශානතියක් ලබාදී තිබේ. මෙතැන් පටන්, ශ්‍රී ලංකාවේ මානව හිමිකම්වලට සම්බන්ධ සියලු පරිශ්‍රමයන්, අධිකාරීමයභාවයේ ආකාරයෙන් සිදුවන මූලික නිෂේදනයන් වෙත කේන්ද්‍රීය වීම අවශ්‍ය වේ.

එල්ටීටීඊ ය සහ ශ්‍රී ලංකාව අතර වසර ගණනාවක් පැවති යුද්ධය මගින් සිදුකර තිබෙන්නේ ශ්‍රී ලංකාවේ දේශපාලන සංවර්ධනයේ සැබෑ ස්වරූපය පිළිබඳ දැවැන්ත ව්‍යාකුලතාවයක් නිර්මාණය කිරීමකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හරහා නව සාමයක් පතවාලීමේ ආකාරයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය විතැන් කිරීමේ 1978 ව්‍යාපෘතිය සියුම් සහ විචක්ෂණ ලෙස සිදුකෙරුණු අතර අධිකාරිමයභාවය හඳුන්වාදීමේ සැබෑ අරමුණ සැඟවීම සඳහා සෑම උත්සාහයක්ම ගනු ලැබීය.



**" එවකට 'යුද්ධය' යැයි කියූ, මේ අරගලයෙන් ප්‍රතිඵල වූ දැවැන්ත ප්‍රචණ්ඩත්වය සෑම කෙනෙකුගේම අවධානය වෙනතකට හැරවීය. "**

එවකට 'යුද්ධය' යැයි කියූ, මේ අරගලයෙන් ප්‍රතිඵල වූ දැවැන්ත ප්‍රචණ්ඩත්වය සෑම කෙනෙකුගේම අවධානය වෙනතකට හැරවීය. මේ වාතාරවණය මගින් සාධාරණ වැදෑරීමකට සෑහෙන තරම් අවකාශයක් ඉතිරි නොකළ අතර එබඳු වැදෑරීමක් නොපැවතීමද අධිකාරීමයභාවය වෙත සිදුවෙමින් තිබූ සමස්ත පරිණාමනය සැලකිල්ලට බඳුන් නොවීමට බලපෑ හේතුවලින් එකක් විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කළ ජේ.ආර්. ජයවර්ධන, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය අවතැන් කිරීම සඳහා වූ සිය උත්සාහයට ජනප්‍රිය ප්‍රතිරෝධයක් ඇතිවීම වළක්වාලීම සඳහා ඉතා බුද්ධිමත් ලෙස එම 'යුද්ධය' යොදාගත්තේය.

හමුදාමය අර්ථය තුළ බොහෝ දේවල් ධ්‍රැවීකරණය වූයේ එම දේශපාලන ව්‍යාපෘතිය ඇසට නොපෙනෙන දෙයක් බවට පත් කරමිනි. එල්ටීටීඊ ය ද තත්වයෙන් වාසිය ගත් අතර ශ්‍රී ලංකාවේ මූලික අරගලය වාර්ගිකත්වය පිළිබඳ දෙයක් ලෙසට ආලේඛ්‍ය කිරීමට උත්සාහ කළේය. ප්‍රචාරණවාදී උපක්‍රම අත්‍යවශ්‍යයෙන්ම සැකසුණේ වෙනම රාජ්‍යයක් ඉල්ලා සිටීම සාධාරණීකරණය කිරීම පිණිස සහ එය ලබාගත හැකි එකම ක්‍රමය සන්නද්ධ අරගලය ලෙසට සාධාරණීකරණය කරමිනි.

'යුද්ධය' විසින් දේශීය ජනතාව වික්ෂිප්ත වූවා පමණක් නොව එය ජාත්‍යන්තර ප්‍රජාව ද සම්පූර්ණයෙන්ම ව්‍යාකුල කළේය. ශ්‍රී ලංකාව ඒකාධිපතිත්වයක් වෙතට පරිණාමනය වන ආකාරය කිසිවෙකු නුදුටු අතර එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන ද ඇතුළු අන්තර්ජාතික ප්‍රජාවගේ ඉල්ලීම්, සන්නද්ධ අරගලය සඳහා විසඳුම් සෙවීම කෙරෙහි විය. 25 වසරකට ආසන්න කාලයක වැදෑරීම අවසානයේ සම්පූර්ණ වශයෙන්ම වාර්ගික වැදෑරීම සහ සාම වැදෑරීමේ වරනැගීම තුළ සිර විය.


1978 ආණ්ඩුක්‍රමයට පිටුපසින් වූ වැඩපිළිවෙළ හෙළිදරව් කිරීම සහ රට වැඩි වැඩියෙන් අධිකාරීමයභාවය වෙත යොමුවීම කෙරෙහි කේන්ද්‍රීයකරණය වී සිටි ආසියානු මානව හිමිකම් කොමිසම වැනි අනාගතය කල්තබා දැක හඬනැගුවන් කිහිප දෙනෙක් ද වූහ. නමුත් සෑම අයෙකුගේම සිත්වල යුද්ධය සහ ප්‍රචණ්ඩත්වය අරක් ගෙන තිබූ හෙයින් එබඳු හඬවල් එතරම් විශාල අවධානයක් දිනාගත්තේ නැත.

තමන් මුළාවී ඇති බවත් ශ්‍රී ලංකාවේ මූලික ප්‍රශ්නය, සියල්ලන්ගේම මානව හිමිකම්වලට බලපාන ගැටලුවක් වන ප්‍රජාතන්ත්‍රවාදයට සහ නීතියේ ආධිපත්‍යයට පීඩා කිරීම වූ බව, ලෝකයට තේරුම් යන්නට පටන් ගැනීම සඳහා ද වසර 4 ක කාලයක් ගත විය.

නවනීදන් පිල්ලේ මහකොමසාරිස්වරියගේ මැදිහත්වීම, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ගැටලු පිළිබඳ දෘෂ්ටිකෝණයක් පිළිබඳ ලෝකයට දැනුම් දෙනු ඇත. අනුක්‍රමිකව වැඩිවෙමින් පවතින ඒකාධිපතිභාවය සහ එබඳු ඒකාධිපතිභාවයක් පිළිබඳ ජනතාව තුළ වර්ධනය වෙමින් පවතින ධ්‍රැවීකරණයේ සමස්ත දෘෂ්ටිකෝණය තුළ නව ක්‍රමෝපායයන් හඳුන්වාදීම අවශ්‍ය වේ. **ප්‍රශ්නයේ අරටුව ඇය විසින් හඳුනාගෙන ඇත. දැන් අවශ්‍ය වන්නේ මේ ගැටලුව මැඬපැවැත්වීම සඳහා පිළියම් සෙවීමයි.**

'යුද්ධය' විසින් දේශීය ජනතාව වික්ෂිප්ත වූවා පමණක් නොව එය ජාත්‍යන්තර ප්‍රජාව ද සම්පූර්ණයෙන්ම ව්‍යාකුල කළේය. ශ්‍රී ලංකාව ඒකාධිපතිත්වයක් වෙතට පරිණාමනය වන ආකාරය කිසිවෙකු නුදුටු අතර එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන ද ඇතුළු අන්තර්ජාතික ප්‍රජාවගේ ඉල්ලීම්, සන්නද්ධ අරගලය සඳහා විසඳුම් සෙවීම කෙරෙහි විය.

1978 ආණ්ඩුක්‍රමයට පිටුපසින් වූ වැඩපිළිවෙළ හෙළිදරව් කිරීම සහ රට වැඩි වැඩියෙන් අධිකාරීමයභාවය වෙත යොමුවීම කෙරෙහි කේන්ද්‍රීයකරණය වී සිටි ආසියානු මානව හිමිකම් කොමිසම වැනි අනාගතය කල්තබා දැක හඬනැගුවන් කිහිප දෙනෙක් ද වූහ. නමුත් සෑම අයෙකුගේම සිත්වල යුද්ධය සහ ප්‍රචණ්ඩත්වය අරක් ගෙන තිබූ හෙයින් එබඳු හඬවල් එතරම් විශාල අවධානයක් දිනාගත්තේ නැත.



දේශීය සිවිල් සමාජය සහ අන්තර්ජාතික ප්‍රජාව, මේ අවස්ථාවේදී නැගී සිට මහකොමසාරිස්වරියගේ කැඳවුමට ප්‍රතිචාර දක්වා ඒකාධිපතිත්වය මැඩපැවැත්වීමටත් ප්‍රජාතන්ත්‍රවාදයේ රාමුව තුළ නීතියේ ආධිපත්‍යය නැවත ස්ථාපනය කිරීමටත් ක්‍රම සොයාබැලීමට ආරම්භ කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.



# කෙමෙන් වැඩිවන ඒකාධිපතිත්වයේ ලක්ෂණ

2013 අගෝස්තු 31 වැනිදා එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්වරිය නවී පිල්ලේ විසින්, ශ්‍රී ලංකාව පැහැදිලිවම ඒකාධිපතිත්වය වෙත ගමන් කරන බවටත් තමන් ඒ පිළිබඳ මහත් අවධානයෙන් සිටිනා බවටත් කළ ප්‍රකාශයෙන් පසුව ආසියානු මානව හිමිකම් කොමිසම SRI LANKA: A short report on the features of the increasing authoritarianism හෙවත් "කෙමෙන් වැඩිවන ඒකාධිපතිත්වයේ ලක්ෂණ පිළිබඳ කෙටි වාර්තාවක්' යනුවෙන් සැප්තැම්බර් 8 වැනිදා විශේෂ ප්‍රකාශයක් නිකුත් කළේය. පහත දැක්වෙන්නේ එහි සිංහල පරිවර්තනයයි.

## කෙමෙන් වැඩිවන ඒකාධිපතිත්වයේ ලක්ෂණ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ සිදුකළ හැක.

## 1

**මේ ඒකාධිපතිත්වය තුළ නීතියට ඉඩක් නැත.** 1815 සිට 1945 දක්වා වූ ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමය තුළ සමාජයේ සමස්ත සංවිධාන සාධකය ලෙසට නීතිය සංස්ථාපනය විය. සෑම දෙයක් සඳහාම අඩුවැඩි වශයෙන් නීතියක් විය. ක්‍රියාත්මක භාවයේ යෙදවුණු ප්‍රතිපත්තිය වූයේ, ඕනෑම නීත්‍යානුකූල අධිකාරියක් විසින් සිදුකරනු ලබන ඕනෑම දෙයක් නීතිය තුළ අර්ථගැන්විය යුතු බවයි. ආණ්ඩු සියවසකට අධික කාලයක් නීතිය මත පදනම් ව පැවති හෙයින් නීතිය ශ්‍රී ලංකා විඥාණය තුළට එබ්බවී තිබූ බව සහ ඒ අනුව නීතියේ ආධිපත්‍යයේ මූලික පදනමක් ශ්‍රී ලංකාව තුළ මනා ලෙස සංස්ථාපනය වී තිබූ බව කිව හැක.

කෙසේ නමුත් 1972 සහ 1978 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වෙනස්කම් සහ ගතවූ වසර 40 තුළ සිදුවූ සිදුවීම් මගින් ආණ්ඩුවේ ක්‍රියාවන්ට නීත්‍යානුකූලභාවය හා සාධාරණීකරණය ලබාදී තිබූ කෘත්‍යාත්මක ක්‍රම පද්ධතියට පීඩා පමුණුවා තිබේ. යම්කිසි මොහොතක නීත්‍යානුකූල වන්නේ මොනවාද සහ නීති විරෝධී වන්නේ මොනවාද යන්න නිශ්චය කිරීම අසීරු ය. මෙම අවිනිශ්චිතතාවය සහ උභයාර්ථ සහිත බව අපරාධ නීතිය, පොදු නීතිය සහ විශාල වශයෙන් දේපළ නීතිය ද ඇතුළත් සෑම දෙයක්ම තුළට දිවගොස් තිබේ.

මෙම අවිනිශ්චිතතාවය සහ උභයාර්ථ බව විසින් අධිකරණ ඉතාමත් අසීරු තත්වයකට පත් කර තිබේ. අධිකරණවල වැදගත්භාවයට ඉතාම සුවිශේෂී අන්දමට පීඩා කර ඇත. අධිකරණ පිළිබඳ සමස්ත මහජන



අවබෝධය ට අනුව මේ වන විට ඒවා සැලකෙන්නේ අදාළ නැති දේ වශයෙනි.

තමන් විඳවන වැරදිවලට නෛතික ප්‍රතිකර්ම ලැබීමේ හැකියාව පිළිබඳ විශ්වාසය පුරවැසියාට අහිමි ව ගොස් තිබේ. ඇත්ත වශයෙන්ම, නෛතික තත්වයේ අවිනිශ්චිතතාවය මගින් නීතිමය වශයෙන් වරද ලෙස පිළිගන්නේ මොනවාද යන්න ගැන ද ඇතිව තිබෙන්නේ උභයාර්ථ බවකි. මීට පෙර ද සඳහන් කර ඇති පරිදි මෙය අපරාධ නීතිය සහ පොදු නීතිය තුළට මෙන්ම දේපළ නීතිය තුළට ද පැතිරී තිබේ.

**මේ අනුව, නීතිය, නීතිමය වැරදි සහ නෛතික ප්‍රතිකර්ම පිළිබඳ නිර්මාණය වී තිබෙන අවිනිශ්චිතතාවය සහ උභයාර්ථ බව ජීවිතයේ සෑම අංගයක් වෙතම පැතිරී තිබේ.**

## 2

**උක්ත ඡේදයේ සඳහන් කළ දෙයෙහි ප්‍රතිඵලය ලෙස,** සියලු මහජන ආයතනයන්හි ද අවිනිශ්චිතතාවයක් සහ උභයාර්ථ බවක් තිබේ. පාර්ලිමේන්තුව යනු කුමක්ද සහ එයින් කිරීමට බලාපොරොත්තු වන්නේ කුමක්ද යන්න, පුරවැසියන්ට පිළිතුරු සෙවීමට අසීරු ගැටලු බවට පත්ව ඇත. ප්‍රායෝගික අත්දැකීම්වලින් පෙන්වන දෙය නම්, පාර්ලිමේන්තුව හුදෙක් විධායක ජනාධිපතිවරයා හට අවශ්‍ය දෙය කරමින් සිටිනා බව සහ විධායක ජනාධිපතිවරයාට අවශ්‍ය නොවන දෙයක් කිරීමට පාර්ලිමේන්තුවට

කොහෙත්ම නොහැකි බවයි. මහජන කැමැත්ත සමග ඒකානුකූල වන සේ නීති සෑදීම පිළිබඳ සංකල්පය එහි ඉතාම දුරස්ථ අර්ථය තුළ පවා නැත.

තමන්ට අවශ්‍ය ඕනෑම දෙයක් කිරීමට විධායක ජනාධිපතිවරයා සතු හැකියාව සහ එබඳු ක්‍රියාවන්ට පෙර සහ පසුව ඒවාට අනුමැතික මුද්‍රාව ලබාදීමට ඔහු සතු බලය, ඔහු කරන ඕනෑම දෙයකට නීත්‍යානුකූලභාවය ලබාදෙයි. නියත වශයෙන්ම, නීත්‍යානුකූලභාවයේ මෙකී මුහුණුවර සැබෑ අවශ්‍යතාවයක් නොවූවද නීත්‍යානුකූලභාවයේ පදනම මත කිසිවකට අභියෝග කිරීමට සැබෑ හැකියාවක් නැත. මේ අනුව, නීත්‍යානුකූලභාවයේ සංකල්පය පවා බොහෝ ගැටලුවලදී සැබෑ සුවිශේෂීතාවයක් ලබා නොදෙයි.



Photo Courtesy :BBC

තමන්ට අවශ්‍ය ඕනෑම දෙයක් කිරීමට විධායක ජනාධිපතිවරයා සතු හැකියාව සහ එබඳු ක්‍රියාවන්ට පෙර සහ පසුව ඒවාට අනුමැතික මුද්‍රාව ලබාදීමට ඔහු සතු බලය, ඔහු කරන ඕනෑම දෙයකට නීත්‍යානුකූලභාවය ලබාදෙයි.

# 3

## අධිකරණයේ ස්වාධීනත්වයට පීඩා පැමිණවීම-

සියල්ලට ම පෙර, නීතියට පීඩා පැමිණවීම සහ පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් පවතින ගැටලු අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ අදහසට බලපෑම් සිදුකර තිබේ. මේ හැරුණු විට, උපරිමාධිකරණයෙන් විනිසුරන් ඉවත් කිරීම සහ ඔවුන් පත් කිරීම කරන ක්‍රමවේදය ද නීතීඥයන් ඇතුළු පුරවැසියන්ගේ සිත්වල දැවැන්ත සැකසංකා ඇති කර තිබෙනුයේ නඩු කීමේදී කුමන ආකාරයේ ප්‍රතිඵලයන් ලැබේදැයි සැක සහිත බැවිනි. යෝග්‍යතාවය මත අවසන් ප්‍රතිඵලය ලැබේ ය යන විශ්වාසය මත පදනම් ව නඩුකීම නොනැවතී කර ගෙන යාමේ අදහස මේ වන විට විශාල වශයෙන් හීන වී ගොස් ඇත. දේශපාලන බලපෑම මත නඩුවකට බලපෑම් සිදුකළ හැකි ක්‍රම බොහෝ තිබේ ය යන මතය ජනතාව අතර මෙන්ම නීතීඥවරුන් අතර පවා ගැඹුරු ලෙස පැතිර පවතියි. නඩුකීම පිළිබඳ අදහස ද වෙළඳපොළ පරිචයක් පිළිබඳ ගැටලුවක් වී තිබේ. මේ සියල්ලෙන් මතු කරන ගැටලුව වන්නේ අධිකරණවලින් කුමක් බලාපොරොත්තු විය යුතුද යන්නයි.



# 4

**සිවිල් පොලිස් ක්‍රමය අවතැන් වීම-** මහජන ආයතන පිළිබඳ ඉහතින් පවසා ඇති කරුණු සහ ඔවුන්ගේ භූමිකාව හා හැකියාව ද්වීඅර්ථ වීම, ශ්‍රී ලංකාවේ පොලිස් ක්‍රමය ක්‍රියාත්මක වන ස්වභාවය මගින් දරදඬු ලෙස විදහා දක්වයි. එහි උදාසීන බවට හේතුවී තිබෙන්නේ හුදෙක් පොලිස් බලකායේ හැකියාවක් නොමැති කම ම පමණක් නොවේ. ඊටත් වඩා මේ උදාසීන කම, නෛතික සහ දේශපාලන ක්‍රමවේදයන්ගේ සමස්ත අර්බුදයේ ප්‍රතිඵලයකි. ඉහළ නිලයන්ට අයත් වූවන් ඇතුළු පොලිස් නිලධාරීන් නිතරම 'බලයක් නැති' අය ය.

බාහිර බලවේගයන් විසින් නිරන්තරයෙන්ම කළ යුතු දේ සහ නොකළ යුතු දේ තීරණය කිරීමෙහිලා භූමිකාවක් රඟපාන විට, සත්‍ය වශයෙන්ම තමන් කළ යුතු දේ සහ නොකළ යුතු දේ සොයාගැනීම ඕනෑම නිලධාරියෙකු හට දුෂ්කර ය. වැඩි වශයෙන්ම, මහජන ආයතනයන්ගේ ක්‍රියාවන් පාලනය වන්නේ පිටස්තරව සිටිමින් වන අතර මේ බලපෑම්වලට නතුනොවී සිටීමේ ප්‍රායෝගික ක්‍රමයක් සොයාගැනීම මේ නිලධාරීන් ට ඉතා අසීරු ය.



Photo Courtesy :The Sunday Leader

මේ හැරුණු විට, ඔත්තු සේවා, විශේෂ ආරක්ෂක අංශ සහ සන්නද්ධ බලකායන් ද, නීතියේ ආධිපත්‍යය පැවති පෙර කාලයේ සිවිල් පොලීසියට අයත් ව තිබූ ක්‍රියාවන්වලට සම්බන්ධ වීම සඳහා කැඳවා තිබේ. මෙකී බාහිර බලකායන් ඍජු ලෙසම ආරක්ෂක අමාත්‍යාංශය විසින් පාලනය කරනු ලබන අතර එය වගකියන්නේ එම අමාත්‍යාංශය තුළ බලයේ සිටිනවුන්ට පමණි. ඉහත සඳහන් කළ නීතිය සහ අධිකරණ පිළිබඳ අර්බුදය ආරක්ෂක අංශ අතර පවතින මේ සම්බන්ධතාවයට බලපෑම් ඇති කරයි.



Photo Courtesy : COLOMBO_TELEGRAPH

පොලීසියේ හැසිරීමට බලපාන තවත් සාධකයක් වන්නේ අපරාධ නීතියට සහ නඩු විධානයට අන් කවරදාටත් වඩා අඩු වැදගත් කමක් ලබාදී තිබීමයි. පොලීසියට දී තිබෙන බලය සහ සම්පත් යන දෙයාකාරයෙන්ම සලකන විට (විශේෂයෙන්ම අපරාධ විමර්ශනමය කාර්යය සඳහා වෙන් කර තිබෙන අයවැය ප්‍රතිපාදන අනුව සලකා බලන විට) පොලිස් ආයතනයට සලකා තිබෙන්නේ අඩුම වැදගත්කමක් සහිත ආයතනය වශයෙනි. ශ්‍රී ලංකා පොලීසිය, පුහුණුව සහ හැකියාව අතින් මෙන්ම සිය කාර්යයන් ස්වාධීනව කරගෙන යාමට තිබෙන ඉඩකඩ අතින්ද අද වන විට අතිශයින්ම පසුගාමී ආයතනයකි.

මෙම ආයතනය ට පීඩාකිරීමේ එක් ප්‍රතිඵලයක් වන්නේ පොලීසිය විසින් සැකකරුවන් වෙත අතිශය ම්ලේච්ඡ ලෙස සැලකීමයි. පොලිස් ස්ථාන වෙත ගෙන යන සෑම කෙනෙකුම පාහේ භාජනය කරන වධ හිංසා දින චර්යාව පිළිබඳ දැවැන්ත ලේඛනගත කිරීම් ප්‍රමාණයක් තිබේ.

මෙකී සාධකවලින් ප්‍රතිඵල වී තිබෙන විනය බිඳවැටීමක් ද පොලිස් ආයතනය තුළ ඇත. අතීතයේ භාවිතා කළ විනයානුකූල පාලනය තවදුරටත් එහි නොපවතියි. ඉහළ නිලධාරීහු මෙන්ම ඔවුන් යටතේ සිටිනවුන් ද, දේශපාලන ගැතිභාවය තුළින් මෙන්ම දූෂණය අතින් ද විශාල වශයෙන් වැරදි ක්‍රියාවන්ට සම්බන්ධ වී සිටිති. පොලිස් ශ්‍රේරාවලිය, අතීතයේ ඔවුන්ට පෙර සිටියවුන් භුක්තිවිඳි අධිකාරිමය බලය අතින් හීන ය.

පොලිස් ආයතනයේ මෙම බිඳවැටීම මගින් මීට පෙර ඡේදයන්හිදී විස්තර කළ පරිදි නීතිය ට සම්බන්ධ වාතාවරණය තවදුරටත් උග්‍ර කරවයි.

## 5

## නීතිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ දේශපාලනමය පාලනය -

බ්‍රිතාන්‍යයන්ගෙන් ලැබුණු එක් දායාදයක් වූයේ බ්‍රිතාන්‍ය අද්වකාත් ජනරාල් කාර්යාලයේ ආකෘතිය අනුව සකස් කළ නීතිපති දෙපාර්තමේන්තුවයි. දීර්ඝ කාලයක් මුළුල්ලේ මේ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍යය වෙනුවෙන් ඉතාම ශක්නුවත් අභිචෝදකයන් සහ ප්‍රමුඛ පෙළේ නීතීඥවරුන් නිපදවනු ලැබීය. ස්වකීය ස්වාධීනත්වය ඔවුන් විසින් රැකගත් අතර මූලික සම්ප්‍රදායයන් පිළිබඳ ඔවුහු දැනුවත්ව සිටියහ. ආණ්ඩුවේ අමාත්‍යාංශ සමග ගනුදෙනු කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව ඉතා දැඩි න්‍යායපත්‍රයක් සකස් කර ගෙන තිබුණේය. ආණ්ඩුවේ ප්‍රධාන නීති උපදේශකයා වශයෙන් නීතිපතිවරයා, යෝජිත නීති සහ ක්‍රියාවන්ගේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ආණ්ඩුවට උපදෙස් ලබාදුන්නේය. සමස්ත ක්‍රමය සැකසී තිබුණේ ආණ්ඩුව නීතිය පිළිපදින බව සාක්ෂාත් කිරීම සඳහා ය.

අවාසනාවකට මෙන්, මේ තත්වය මේ වන විට ආපස්සට හැරවී තිබෙන අතර එම ක්‍රියාවලිය දශක කිහිපයක් වෙත දිවගොස් තිබේ. දැන් එය පවතින්නේ දරුණු බිඳවැටීමකට පත්වූ තත්වයේ ය.



**මෙම දෙපාර්තමේන්තුව දැන් සෘජුවම ජනාධිපති ලේකම් යටතේ පවතියි. ස්වාධීනත්වය සහතික කළ න්‍යායපත්‍රයන් අත්හැර දමා ඇත. දෙපාර්තමේන්තුව සෘජු දේශපාලන පාලනය යටතට ගෙන තිබේ. කෙළින්ම දේශපාලන උපදෙස් මත, දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව අභිචෝදනා ගොනු කරනු ලැබේ. අනෙක් අතට, ස්ථිර නෛතික පදනම් මත ගොනු කළ චෝදනා පත්‍ර, ප්‍රබල දේශපාලනඥයන්ට ගැළපෙන සේ එක්කෝ ඉවත දමනු ලබයි. නැතිනම් වෙනස් කම් වලට ලක් කරනු ලබයි.** නීතියේ ආධිපත්‍යයට එරෙහි සහ නීති විරෝධී වන යෝජිත ව්‍යවස්ථාකරණයන් ට නීතිපතිවරයා එරෙහි වනු ඇතැයි තවදුරටත් අපේක්ෂා කෙරෙන්නේ නැත. අගවිනිසුරුවරිය, ආචාර්ය ශිරානි බණ්ඩාරනායක නීතිවිරෝධී ලෙස ඉවත් කිරීම පිළිබඳ ගැටලුවේදී වුව නීතිපති දෙපාර්තමේන්තුව, ආණ්ඩුවට සහාය දැක්වීමේ සිය මාර්ගයේම ගමන් කළේය. දැන් නීතිපතිවරයාම, ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කළ පාර්ලිමේන්තු තේරීම් කාරක කමිටුවේ තීන්දුවකට එරෙහි අභියාචනාධිකරණ තීන්දුවකට විරුද්ධව නඩු දමා තිබේ. නීතිපතිවරයාගේ එකල සම්ප්‍රදාය වූයේ, මානව හිමිකම්, විශේෂයෙන්ම මූලික අයිතිවාසිකම් උල්ලංඝකයන් යැයි චෝදනා ලද්දවුන් ට සහයෝගය නොදැක්වීමයි. නමුත් මේ පිළිවෙත මේ වන විට අත්හැරී ඇති අතර පුරවැසියන් විසින් ගොනුකරන මූලික අයිතිවාසිකම් අයදුම්පත්වලට විරුද්ධ වීමට දෙපාර්තමේන්තු නීතීඥයෝ සක්‍රිය ව දායක වෙති. ජනතාව අතර නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ගැඹුරු සෘණාත්මක අප්‍රසාදයක් පවතියි.

## 6

**රාජ්‍යයේ සකල බලවත් ප්‍රචාරණ යාන්ත්‍රණයක නිර්ගමනය -** නෛතික භාවය සහ නීත්‍යානුකූලභාවයේ තැන ලබාදී තිබෙන්නේ අසාමාන්‍ය ලෙස බලවත් ප්‍රොපගැන්ඩා හෙවත් ප්‍රචාරණ යාන්ත්‍රණයකට ය. එමගින්, ආණ්ඩුව විසින් කරනු ලබන ඕනෑම දෙයක් නිවැරදි බවත්, එකී ක්‍රියාවන්ට එරෙහි වන්නන් දුෂ්ටයන් බවත් ජනතාවට ඒත්තු ගැන්වීමට උත්සාහ කරයි. ඕනෑම ආකාරයක තාර්කික විරෝධයන් මත එල්ල වන මෙකී ප්‍රහාරයන් වඩාත්ම දුෂ්ට ප්‍රචාරණ ව්‍යාපාරයක කොටස් වන අතර ඒ පිළිබඳ මාධ්‍ය ඔස්සේ මුදා හැර රටේ සෑම නිවසක් වෙතම එම පණිවුඩය ගෙනයනු ලබයි.



*අගවිනිසුරුවරිය සිය ධුරයේ සිටින කාලය තුළදීම ඇයට විරුද්ධව එල්ල වූ ප්‍රහාර, මීට පෙර කිසිදා නොදුටු මෙවැනි එක් හෙළාදැකීමේ ව්‍යාපාරයකි.*

ආණ්ඩුවේ ක්‍රියාවන්ගෙන් බහුතරය කල්තබා සූදානම් කළ ප්‍රචාරණවාදී ක්‍රමවේදයන්ගෙන් සමන්විත වන අතර ආණ්ඩුවට යම්කිසි කෙනෙකුට එරෙහිව පියවරක් ගැනීමට අවශ්‍ය ද එම පුද්ගලයන් ඉලක්ක කරගෙන ඒවා ක්‍රියාත්මක වේ. අගවිනිසුරුවරිය සිය ධුරයේ සිටින කාලය තුළදීම ඇයට විරුද්ධව එල්ල වූ ප්‍රහාර, මීට පෙර කිසිදා නොදුටු මෙවැනි එක් හෙළාදැකීමේ ව්‍යාපාරයකි.

එම ව්‍යාපාරය ආරම්භ වූයේ ඇයටම සිය ධුරයෙන් ඉල්ලා අස්වන ලෙස බලකරමිනි. එය සිදුනොවූ විට, ආණ්ඩුව නිවැරදි බවත්, ඇය ඉවත් කිරීම සඳහා ආණ්ඩුව ගන්නා සෑම පියවරක්ම නිවැරදි වූ බවටත් මතයක් නිර්මාණය වන පරිදි ප්‍රචාරණ යාන්ත්‍රණය උත්සන්න කරන ලදී. එම ප්‍රචාරණ යාන්ත්‍රණයේ අන්තර්ගතය, යොදාගත් භාෂාව අතින් පවා ඉතාමත් දුෂ්ට සහ කුරිරු ලෙස තමන්ගේ වාසියට යොදාගත් ඒවා විය.

භාෂාවේ පහත්ම මට්ටම් සිය විරුද්ධවාදීන් ව අවමානයට පත්කිරීම සඳහා යොදාගන්නා ලදී. විරුද්ධවාදීන් ඔවුන්ගේ පාර්ශවයෙන් කියූ කරුණුවලට කිසිවිටෙක ඇහුම්කන්දීමක් සිදුකෙරුණේ නැත. විරුද්ධවාදීන් ට එරෙහිව ගෙන ගිය එම වෛරී සහගත ව්‍යාපාර, මධ්‍යතන යුගයේ එවැනි ව්‍යාපාර ගැන බටහිර ඉතිහාස පොත්වලින් අප කියවූ දෑ සිහිපත් කරවයි.

නිදහස් මාධ්‍යයට එරෙහිව එල්ල කරන බරපතළ ප්‍රහාරයන්ද ශ්‍රී ලංකාවේ නිත්‍ය ලක්ෂණයක් බවට පත්ව තිබේ. ඝාතන, පැහැරගැනීම්, බලහත්කාරයෙන් සිදුකරනු ලබන අතුරුදන්කිරීම්, භෞතික තුවාළ සිදුකිරීම සහ මාධ්‍යවේදීන් ව ඝාතනය කරන බවට තර්ජනය කිරීම මගින් භීතියේ සහ උත්තර්ජනයේ සමස්ත වාතාවරණයක් ජනිත කර තිබේ. දක්ෂ මාධ්‍යවේදීන් විශාල සංඛ්‍යාවක් පිටුවහල් ජීවිත ගත කිරීම සඳහා රටෙන් පළාගොස් තිබේ. මාධ්‍යවේදීන් හැරුණු විට මාධ්‍ය ස්ථාපිත සහ ප්‍රකාශකයන් ද ප්‍රහාරවල ඉලක්ක බවට පත්ව ඇත. පාලක දේශපාලන රෙජීමය සමග සමීප සබඳතා පවත්වන පුද්ගලයන්ට මෙම මාධ්‍ය ස්ථාපිත විකිණීමට බල කරන වාතාරවණයක් නිර්මාණය කිරීම ද මේ නූතන තත්වයේම තවත් ලක්ෂණයකි. මෙකී මර්දනයේ ප්‍රතිඵලයක් ලෙසට පොදු වැදගත්කමක් සහිත ගැටලු සම්බන්ධයෙන් විකල්ප මතයන් ට ඇහුම්කන්දීමේ අවස්ථාව ජනතාවට අහිමි ව ගොස් තිබේ.



පහරකෑමට ලක්වූ මාධ්‍යවේදී පෝද්දල ජයන්ත රෝහලේදී

Photo Courtesy : dbsjeyaraj.com

# මෙකී රැඩිකල් අපගමනයන්ගේ ආනිශංස

*රටේ පැවති තත්වයෙන් වෙනස් වූ මෙකී සියලු අපගමනයන් මගින් දැනටමත් අතිශයින්ම විපත්තිදායක ප්‍රතිඵල ජනිත කර තිබේ. ඒවායින් සමරහක් පහත දැක්වේ.*

## අ) සෘජු ප්‍රචණ්ඩත්වය ඇති කිරීම

ප්‍රචණ්ඩත්වයේ මෙකී සෘජු භාවිතයට විවිධ සංවර්ධනයන්ගෙන් උපකාර ලැබී තිබේ. ඒවායින් එකක් නම් අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබාගැනීම සම්බන්ධ පරිචයන්ගේ ඇතිවී තිබෙන වෙනස්කම් ය. පුද්ගලයන් රඳවාතබාගැනීමෙන් පසුව ඔවුන්ව ඝාතනය කිරීමේ මහා පරිමාණ පුරුද්දක් තිබේ. මෙය ඇරඹුණේ, සාමාන්‍ය ගණන් බැලීම අනුව පුද්ගලයන් දස දහසක් පමණ දෙනා මරා දැමුණු 1971 ජවිපෙ කැරැල්ලෙන් පසුව ය. මෙකී ඝාතන, සටන් බිමේදී සිදුවූ මරණ නොවීය. ජනතාව අත්අඩංගුවට ගත් අතර, නිතරම ප්‍රශ්න කර ඉන්පසුව මරා දමන ලදී. මේ පරිචය නැවතත්, 1987 සිට 1991 දක්වා ද දකුණේ ක්‍රියාත්මක විය. මෙකී ස්වෙච්ඡා සහගත නොවූ අතුරුදන්වීම් පිළිබඳ විමර්ශනය කිරීම සඳහා ආණ්ඩුව පත් කළ කොමිෂන් සභාවලට අනුව 30,000 කට ආසන්න පිරිසක් එම කාලයේදී අතුරුදන් ව තිබේ. එම කොමිෂන් සභාවන් විසින් දක්වන පරිදි, 'අතුරුදන්වීම්' යන වදන මගින් අදහස් වූයේ අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පැහැරගැනීම සහ ඉන්පසු සිදුවන ප්‍රශ්න කිරීම්, ඝාතන සහ ශරීර බැහැරකිරීම් ය. මේ හා සමාන පරිචයක් එල්ටීටීඊ ය සහ ආණ්ඩුව අතර පැවති 27 වසරක යුද්ධයේදී උතුරු නැගෙනහිර පුරා ද ක්‍රියාත්මක විණි.



Photo Courtesy : srilankabrief.org



> " ශ්‍රී ලංකාවේ දේශපාලන සිරකරුවන් තබාගැනීම යන්න (දුර්ලභ අවස්ථාවන්හිදී හැර), විශේෂයෙන්ම 1983 ජූලි කලබල කාලයේදී සිරකරුවන් කිහිප දෙනෙක් ඝාතනය කිරීමෙන් පසුව, නොපවතින දෙයක් ලෙස පෙනේ. ඒ වෙනුවට නිරන්තරයෙන් සිදුවන දෙය බවට පත්ව තිබෙන්නේ අත්අඩංගුවට ගැනීමෙන් පසුව මරා දැමීමයි. මේ තත්වය ඇතිවීමට බලපෑ හේතු රාශියක් තිබීමට පුළුවන. මේ ක්‍රමය වඩාත් විශ්වාසනීය වීමත්, ප්‍රවර්ධනීය හා පරිපාලනමය බැඳීම් වැඩිපුර ඇති නොවීමත් යන කරුණ මත මේ ක්‍රමය පිහිටුවාගන්නට ඇතැයි සිතිය හැක. කෙටි කාලයක් තුළ- මළ සිරුර වළ දැමීමෙන් පසුව සකල ගැටලුවම අවසන් වෙයි. "

ශ්‍රී ලංකාවේ දේශපාලන සිරකරුවන් තබාගැනීම යන්න (දුර්ලභ අවස්ථාවන්හිදී හැර), විශේෂයෙන්ම 1983 ජූලි කලබල කාලයේදී සිරකරුවන් කිහිප දෙනෙක් ඝාතනය කිරීමෙන් පසුව, නොපවතින දෙයක් ලෙස පෙනේ. ඒ වෙනුවට නිරන්තරයෙන් සිදුවන දෙය බවට පත්ව තිබෙන්නේ අත්අඩංගුවට ගැනීමෙන් පසුව මරා දැමීමයි. මේ

තත්වය ඇතිවීමට බලපෑ හේතු රාශියක් තිබීමට පුළුවන. මේ ක්‍රමය වඩාත් විශ්වාසනීය වීමත්, ප්‍රවර්ධනීය හා පරිපාලනමය බැඳීම් වැඩිපුර ඇති නොවීමත් යන කරුණු මත මේ ක්‍රමය පිහිටුවාගන්නට ඇතැයි සිතිය හැක. කෙටි කාලයක් තුළ- මළ සිරුර වළ දැමීමෙන් පසුව සකල ගැටලුවම අවසන් වෙයි. දේශපාලන සිරකරුවන් රඳවා තබාගත්තේ නම්, ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීමට සහ සෙසු ගැටලු සම්බන්ධයෙන් පිළියම් යෙදීමට අවැසි වන අතර මෙහිදී අපරාධ නඩු විධානය යටතේ එන බැඳීම් පිළිපැදිය යුතුය. ඇතැම්විට මේ සම්බන්ධ අසීරුතම බැඳියාව වන්නේ, අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබාගැනීම අධිකරණ ඉදිරියේ සාධාරණීකරණය කරන සාක්ෂි ඉදිරිපත් වන ආකාරයේ විමර්ශනයක් සිදුකරන බවට සහතික වීමයි. අනෙක් අතට, ජනතාව අත්අඩංගුවට ගැනීමෙන් පසුව අතුරුදන් වන විට මහා පරිමාණයේ පරිපාලනමය සැකසුම් අවශ්‍ය නොකෙරේ. මේ ආකාරයෙන් මිය යන පුද්ගලයන්ගේ මළ සිරුරු බැහැර කිරීම මගින් ඔවුන් බන්ධනාගාරවල රඳවා තබාගැනීමේ බැඳියාව ද ඉවත් වෙයි. දේශපාලන සිරකරුවන් බන්ධනාගාරවල තබාගැනීම ඉතා බරැති බැඳියාවකි. සිරකරුවන්ට ආහාර, අවකාශය සහ නිදාගැනීමේ, සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් ලබාදිය යුතු යැයි සාමාන්‍ය බැඳියාවන් තිබේ. දැඩි ආරක්ෂක බැඳියාවන් ද මේ හා සමානවම වැදගත් ය. දේශපාලන සිරකරුවන් වශයෙන් ඔවුන් ට සිය සංවිධාන තිබිය හැකි නිසා ඔවුන්ව බන්ධනාගාරවලින් සහ අධිකරණයට යාම් ඊම් කරන විටදී බේරාගැනීමේ උත්සාහයන් සිදුවිය හැකිය. දේශපාලන සිරකරුවන් තබාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස, බරපතළ දේශපාලන ප්‍රචාරණයන්ගෙන් ද විවිධ දුෂ්කරතා සිදුවිය හැකිය. සිරකරුවන් සිය භාරයේ සිටින තාක් දුරට දේශපාලන සංවිධානවලින්, මානව හිමිකම් කණ්ඩායම්වලින් සහ සිරකරුවන්ගේ පවුල්වලින් උද්ඝෝෂණ ඇතිවිය හැකිය. මැතිවරණ සමයන්හිදී ද දේශපාලන සිරකරුවන් පිළිබඳ ගැටලු, බලයේ සිටින ආණ්ඩුවලට බරපතළ ලෙස බලපෑම් සිදුකළ හැකිය. මාධ්‍යයේ ඇසින් බලන විටද දේශපාලන සිරකරුවෝ බොහෝ පුවත් සහ දේශපාලන මතවාදයන් ජනනය කරති. මේ සෑම සංකීර්ණ ප්‍රශ්නයක්ම, පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමෙන් පසුව වළ දැමීම මගින් විශ්වාසනීය ලෙස වළක්වා ගැනීමට පුළුවන.

ජනතාව තුළ දැවැන්ත උත්තර්ජනයක් ඇති කිරීම සඳහා ද මේ ක්‍රමයට හැකියාවක් තිබේ. මෙවැනි උත්තර්ජන නිසා බොහෝ අය දේශපාලන කැළඹිලි සහ විරෝධතාවන්ගේ කොටස්කරුවන් වීමෙන් වැළකී සිටිති. ආණ්ඩුවේ අධිකාරිවාදී ආකෘතියක් පවත්වාගෙන යාමේදී මේ ආකාරයේ ඉහළ උත්තර්ජනාත්මක මට්ටමක් පවත්වාගෙන යාම ඉතාම වාසිදායක ය.

අධිකරණයට පිටතින් සිදුවන මෙබඳු ඝාතනවලට අදාළ තීරණ ගනු ලබන්නේ ආරක්ෂක අංශ සහ පොලීසිය විසිනි. මෙබඳු ඝාතනවලදී අත්අඩංගුවට ගැනීම, ප්‍රශ්නකිරීම, ඝාතනය සහ ශරීරය වළ දැමීම යන ක්‍රියාවන් සම්බන්ධ තීරණ, එම ඝාතන සිදුකරන අයටම පැවරේ. නිසි ක්‍රියාදාමය සහ අධිකරණ විසින් සිදුකරන තීරණ ගැනීම් මේ අනුව ඉවත දැමේ. ඇත්ත වශයෙන්ම, අභියාචන කිරීමේ හැකියාවක් කිසිවිටෙක පැන නගින්නේ නැත.

## බොරු චෝදනා

සමහරවිට අධිකරණ ඉදිරියේ ගොනුකෙරෙන චෝදනාවලටත් සමහරවිට අධිකරණ වලට පිටතින් සිදුකරනු ලබන ඝාතනවලටත් මග පෙන්වන අත්අඩංගුවට ගැනීම් හා රඳවාතබාගැනීම්, හැම විටම සිදුවන්නේ, පරිසිද්ධි පදනමකින් තොර වූ බොරු චෝදනා නැගීමෙන් පසුව ය. ඇතැම්විට මෙබඳු චෝදනා පොලීසිය සහ ආරක්ෂක අංශ විසින්ම නගනු ලබන අතර ඇතැම් අවස්ථාවන්හිදී බොරු සාක්ෂිකරුවන් ඉදිරිපත්ව අත්අඩංගුවට ගැනීමට හැකිකරවන ආකාරයේ පැමිණිලි සිදුකරන ආකාරය දැකිය හැක. ඇතැම්විට මෙබඳු බොරු චෝදනා නගනුයේ දේශපාලන අරමුණු උදෙසා ය. අල්ලස් ගැනීම හෝ පුද්ගලයන් උත්තර්ජනයන්ට ලක් කිරීම වැනි සෙසු අරමුණු සඳහා මෙසේ කරනු ලබන අවස්ථාවන් ද තිබේ. නිතරම, අහිංසක තැනැත්තන්, සිය මානව හිමිකම් උල්ලංඝනය වීම්වලට අදාළව පොලීසිය ට හෝ ආරක්ෂක අංශවලට විරුද්ධව පැමිණිලි කරන විට ඔවුන් ට විරුද්ධව මත්ද්‍රව්‍ය සන්තකයේ තබාගැනීම පිළිබඳ බොරු චෝදනා නගයි. මෙවැනි චෝදනා නගන බවට තර්ජනය කිරීම් ද පුද්ගලයන් උත්තර්ජනයන්ට ලක් කිරීම පිණිස නිරන්තරයෙන්ම සිදුකරනු ලැබේ.

## ආ) නීතිය, නෛතික කාර්යපටිපාටි සහ නෛතික ප්‍රතිකර්ම පිළිබඳ මතකය නැති වීම.

වැඩිදුර ප්‍රතිවිපාක වශයෙන්, නීතිය, නෛතික කාර්යපටිපාටි සහ නෛතික ප්‍රතිකර්ම පිළිබඳ මතකයක් නැතිවීම යනුවෙන් විස්තර කළ හැකි දෑ ඇතුළත් ගැටලු පැන නගියි. යටත්විජිත නීතිය යටතේ පැවති සියවසකටත් අධික කාලයක් තුළ, නීතියේ ක්‍රමයක් හඳුන්වා දුන් අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මානසික සහ සමාජයීය හැසිරීම් සංවර්ධනය විය. ගතවූ 40 වසර තුළ, නෛතික ක්‍රියාදාමයට පීඩා පැමිණවීමත් සමග මේ මතකයෙන් වැඩි කොටස අතුගෑවී ගොස් තිබේ. නීතියේ අර්බුදයක් ඇති කරමින් - වත්මන් විනිසුරුවරුන්ට තිබෙනුයේ පෙර පරම්පරාවන්වල විනිසුරුවරුන්ට වඩා අඩු ගුණාත්මයෙන් යුත් නෛතික අවබෝධයක් යැයි නීතීඥවරු පැමිණිලි කරති. නීතීඥවරුන් අතර ද නෛතික දැනුම සහ ආචාරධර්ම පරිචයන් පිළිබඳ දැඩි හායනයක් තිබෙන අතර එය නඩු කියන්නන් වෙත ද පැතිරේ.




ඇත්ත වශයෙන්ම පවසන්නේ නම්, නීතිය පිළිබඳ මතකය සමස්ත ජනගහනය තුළින්ම මැකී යමින් තිබේ. කාලයත් සමග මෙම මතකය අහිමි වීම තවදුරටත් දැඩි වනු ඇත. එපමණක් නොව, ගැටුම් නිරාකරණය සඳහා අධිකරණයට පිටතින් වන ක්‍රමවේදයන් භාවිතා කිරීම වැඩිවිය. මේ හරහා නව මානසික පුරුදු සහ ආකල්ප ඇතිවී තිබේ. මේවා සාමාන්‍ය ජනතාව, නීතීඥවරුන්, විනිසුරුවරුන්, දේශපාලනඥයන්, අභිචෝදකයන් සහ එවැනි අය යන සෑම අයෙක් වෙතම පැතිරුණේය. මේ අනුව, නීතිය පිළිබඳ ධනාත්මක දැනුම නැති වන විට නීතිවිරෝධී ලෙස විවිධ දේවල් කිරීමේ සෘණාත්මක දැනුම පැතිරී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙසට සෘජු ලෙස ප්‍රචණ්ඩත්වය යොදාගනිමින් ප්‍රශ්න විසඳීමට මැදිහත්වීම සඳහා වැයම් කරන පාතාලය හා එවැනි මූලධාතුවල වර්ධනයක් තිබේ.

ගුරුතුමිය දණ ගැස්වූ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආනන්ද තිලකරත්න වෙනුවට ඔහුගේ ඥාති පුත්‍රයා හට මෙවර පළාත් සභා මැතිවරණය සඳහා නාමයෝජනා ලබා දී තිබිණි

Photo Courtesy : gossiplanka

## ඇ) පරිපාලන යාන්ත්‍රණය තුළ නොසැලකිල්ල පැතිර යාම.

නීතියේ අදාළත්වය නොමැති වී යාමේ ප්‍රතිඵලයක් ලෙසට සහ නීතිය පදනම් කර ගත් පරිපාලනමය පරිචයන් අහිමි වීමේ ප්‍රතිඵලයක් ලෙසට දේශීය ආණ්ඩු පරිපාලනය ද ඇතුළුව පරිපාලනයේ සියලු ක්ෂේත්‍ර තුළ නොසැලකිල්ල පැතිර පවතියි. අතීතයේ සියලු ව්‍යාපෘති හා වැඩසටහන් තුළ අධීක්ෂණ සහ පාලනමය යාන්ත්‍රණ තිබිණි. කෙසේ නමුත්, මේ වන විට එබඳු පාලනයන් සහ අධීක්ෂණයන් දුර්වල වී තිබෙන අතර බොහෝ

ඍණාත්මක වර්ධනයන් දැකිය හැකිය. තවද, ඒවායින් ඇතිවන බරපතළ සහ දරුණු ප්‍රතිවිපාක වළක්වාගැනීම සඳහා උත්සාහයන් ද ගනු නොලැබේ.

මෙයින් උද්ගත වූ බරපතළ ගැටලු ද මේ වන විට පැහැදිලිව දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන්, උතුරු පළාතේ මුලතිව්, කිලිනොච්චි සහ වව්නියා යන ප්‍රදේශවල පිරිසිදු පානීය ජලය හිඟකමට අදාළ දරුණු ගැටලුවක් තිබේ. ජනතාව දැඩි දුෂ්කරතාවලට ලක්වන අතර අපිරිසිදු ජලය පානය කිරීම නිසා ජනතාව අතර සෞඛ්‍යමය ගැටලු ඇතිවීම ද දැකිය හැක. උතුරුමැද සහ ඌව පළාත්වලින් ද මේ හා සමානව පිරිසිදු පානීය ජලය නොමැති කම පිළිබඳ පැමිණිලි තිබේ. නිදන්ගත වකුගඩු රෝගීන් විහාල සංඛ්‍යාවක් ද මෙම ප්‍රදේශවලින් වාර්තා වේ. පානීය ජලය පිළිබඳ ප්‍රශ්නය ඉතාම මෑතකදී වැලිවේරිය රතුපස්වලින් (බටහිර පළාතේ) වාර්තා වූ අතර විශ්වාස කෙරෙන්නේ, රබර් නිෂ්පාදන කම්හලේ අපජලය ඒ ආශ්‍රිත භූමියට මුදාහැරීම නිසා භූගත ජලයේ අම්ල මට්ටම වැඩි වූ බවයි. මීට පෙර පැවති ආණ්ඩුව යටතේ මෙබඳු කම්හල් නිරන්තරයෙන් පරීක්ෂාවට ලක්කළේ ඒ ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ සෞඛ්‍ය තත්වයන්ට එයින් බලපෑම් එල්ල විය හැකි නිසා ය. නමුත් මේ වන විට එවැනි අධීක්ෂණයන් නොතකා හැර තිබේ. තවද, දැන් වසර ගණනාවක් මුළුල්ලේ ඩෙංගු රක්තපාත උණ පැතිර යන අතර මේ වන විට එය වසංගත තත්වය දක්වා උත්සන්න වී ඇත. අතීතයේ මදුරු මර්දනය සඳහා ඵලදායී ක්‍රමයක් පැවති අතර එබඳු සෙසු පලිබෝධ මර්දන ක්‍රම මගින් සැලකිය යුතු සාර්ථකත්වයක් ද ළඟා කර ගන්නා ලදී. කෙසේ නමුත්, වත්මන් පරිපාලන ක්‍රමයේ නොසැලකිල්ල මගින් ඇති කර තිබෙන ගැටලු, මෙම ගැටලු ජය ගැනීම සඳහා ඒකාත්මික පරිශ්‍රමයක් දැරීමෙන් වළක්වා තිබේ.




වැලිවේරිය පානීය ජල ප්‍රශ්නය රටේ පැතිර පවත්නා බරපතළ මානව හිමිකම් අර්බුදය පිළිබඳ පෙන්වා දුන්නේය

නීතිවිරෝධී මත්ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා ගත් උත්සාහයන් ද බරපතළ ලෙස අසාර්ථක වී ඇත. නගර පුරා මෙන්ම රටේ සෙසු ප්‍රදේශවල ද පැතිර පවත්නා මත්ද්‍රව්‍ය වෙළඳාම පිළිබඳ වාර්තා බොහෝ ය. සසිරිමත් මත්ද්‍රව්‍ය වෙළඳාම විනිර්මුක්තිය ද සමග ක්‍රියාත්මක වන අතර දැනටමත් දුර්වල වී තිබෙන රටේ නීති පද්ධතිය එය විසින් මෙහෙයවයි. එහි ප්‍රතිඵලයක් ලෙසට, මත් ඇබ්බැහිය බරපතළ ප්‍රශ්නයක් බවට පත්ව තිබේ.

මේ ගැටලුව සමග, නීති විරෝධී ලෙස ඉපැයූ මුදල් වසං කිරීමේ පැතිර පවත්නා ගැටලුව මතුවී තිබේ. වාර්තාවන්ට අනුව ශ්‍රී ලංකාව කළු සල්ලි ජාවාරමේ කලාපීය මධ්‍යස්ථානයක් බවට පත්ව තිබේ.

පරිපාලනය පුරා මේ වන විට නොසැලකිල්ලේ ප්‍රකෘතිය පැතිර තිබෙන ස්වභාවය සඳහා ඉහතින් දැක්වූයේ උදාහරණ කිහිපයක් පමණි. මේ නොසැලකිල්ල හේතුවෙන් රටේ සියලු ප්‍රදේශවල සහ ජීවිතවල සියලු අංශවල පෙර අනාවැකි කිව නොහැකි ගැටලු උද්ගත විය හැකි බව නොකිව මනා ය.

## ඈ) පෙර නොවූ විරූ දූෂණ මට්ටමක්.





Photo Courtesy : sundaytimes.lk

ල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් අත්කර ගෙන තිබෙන සාර්ථකත්වය ඉතා සීමිත ය. අතීතයේ මෙම ගැටලු ඉතා විශාල ඒවා නොවුවත් මේ වන විට නීතිය අතිශයින්ම නිෂ්ක්‍රිය ලෙස බලාත්මක කරන එක් ක්ෂේත්‍රයක් බවට අල්ලස සහ දූෂණය පත්ව තිබේ. කොමිෂන් සභාවේ වත්මන් පරිපාලනය, වත්මන් පාලක රෙජිමය සහ එයට සම්බන්ධිත පුද්ගලයන්ට එරෙහිව කිසිදු ප්‍රතිඵලදායී පියරවක් ගැනීමට එය සමත්ව නැත. ඒ වෙනුවට කොමිසම දේශපාලන අරමුණු වෙනුවෙන් මෙහෙයවනු ලබයි. ආණ්ඩුව විසින් දේශපාලනමය වශයෙන් ඉලක්ක කර තිබෙන අයට එරෙහිව පළිගැනීමේ අංගයක් වශයෙන් එය භාවිතා කරනු ලබයි. මේ සඳහා පැහැදිලි උදාරහණයක් වන්නේ ආචාර්ය ශිරානි බණ්ඩාරයනායක අගවිනිසුරුවරියට එරෙහිව ගනු ලැබූ පියවරයි. විදේශ ආයෝජන ක්ෂේත්‍රය ඇතුළු රටේ ව්‍යාපාර අංශය දක්වාම දූෂණය පැතිර තිබෙන අතර එම අංශ මේ ගැටලුව හේතුවෙන් දැඩි ලෙස බලපෑමට ලක් ව ඇත.

නියම වටිනාකමට වඩා බොහෝ අඩු අගයකට සිය දේපළ විකුණන ලෙසට බොහෝ පුද්ගලයන්ට තර්ජනය කෙරෙන බවට වාර්තා තිබේ. එසේ තර්ජනය කෙරුණු විට මේ පුද්ගලයන්ට එයට අවනත වීම හැර වෙනත් කළ හැකි දෙයක් නැත. නීති සාධක නිලධාරීහු එවැනි දූෂණ ජාලයන්ගේ නිරන්තර කොටස් කරුවෝ වෙති. තමන්ට ලබාදුන් කොන්ත්‍රාතුවක් අනුව ව්‍යාපාරිකයෙකු මරා දැමීම සහ තමන් යටතේ මිනීමරු කල්ලියක් පවත්වාගෙන යාම සඳහා චෝදනා ලැබූ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු පසුගිය දා අත්අඩංගුවට ගැනීම, නීති සාධක ඒජන්සි සහ දූෂනය ට සම්බන්ධ ජාලයන් කොතරම් දුරකට එකිනෙකට සම්බන්ධ ද යන්න පෙන්වා දෙයි. කොටස් වෙළඳපොළ සම්බන්ධයෙන් මහජනයා හට දැනගන්නට ලැබී ඇති බොහෝ අපවාදයන්ද දූෂණය කොතරම් දුරකට පැතිර පවතින්නේද යන්න පිළිබඳ උදාහරණ සපයයි. ඉහතින් පැහැදිලි කර තිබෙන නීතියේ අර්බුදයෙන් මෙකී දූෂනයේ ගැටලුව සඳහා ප්‍රතිකර්මයක් නොලැබේ. එය මිනිස් ජීවිතවල සෑම අංගයක් කෙරෙහිම සෘණාත්මක ලෙස බලපෑම් සිදුකරමින් වඩ වඩාත් පැතිරෙන්නා සේ ය.

මතකය අහිමි වීම සිවිල් පරිපාලනයේ සමස්ත වෙත ද බලපායි. මීට පෙර, සිවිල් සේවය තුළ තාර්කික පරිපාලනය සාක්ෂාත් කිරීම සඳහා සම්ප්‍රදායයන් සංස්ථාපනය කරනු ලැබීය. කෙසේ නමුත්, මෙකී සියලු පුරුදු, සිවිල් සේවකයන් ප්‍රතිරෝධය දැක්වීමට අපොහොසත් වන දේශපාලන මෙහෙයවීම් හේතුවෙන් මේ වන විට නැතිවී ගොස් තිබේ. දීර්ඝ කාලයක උගැනුම තුළින් සංස්ථාපනය කළ විනය අහිමිවීම සහ තාර්කික පරිපාලනයේ විශිෂ්ටතම අංගයන් පුද්ගලායිත කළ අයවලුන් අහිමි වී යාම රට අනාගතයේදී මුහුණ දෙන විශාලතම ගැටලුවලින් එකක් වනු ඇත.

සිවිල් පරිපාලනය තුළ විනය බිඳවැටීමේ එක් ප්‍රතිඵලයක් වන්නේ මහා පරිමාණ බුද්ධි ගලනයයි. උගත්, මනා පුහුණුවක් ලද සහ පරිපාලනයේ දූෂිත ක්‍රමයක කොටස්කරුවන් වීම ට අවශ්‍ය නොවන ඉහළ අභිප්‍රේරණයකින් යුත් තැනැත්තන් රැකියාවේ වෙනත් ප්‍රවේශපථයන් සොයායන අතර ඒවා බොහෝවිට සොයාගනුයේ රටින් බාහිරව ය. මෙම බුද්ධි ගලනය ද අනාගතයේ ශ්‍රී ලංකාව මුහුණ දෙන වඩාත් සෘණාත්මක ඵල විපාක නිර්මාණය කරනු ඇත.

## ඉ) අසහනය ඉහළ යාම.

නීතිය සහ යුක්තියේ පරිපාලනය ට පීඩා පැමිණවීම මගින් ඕනෑම ආකාරයක අන්ධභක්තිකයෙකු හට සෙස්සන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය සඳහා පොළඹවාගැනීමට පදනම සලසාලයි. සුළු ආගමික කණ්ඩායම් වෙත නිරන්තරයෙන් එහිදී ප්‍රහාර එල්ල කෙරේ. පල්ලි සහ දෙව්මැදුරු වලට ප්‍රහාර එල්ල කළ බවට වාර්තා ඇත. ආගමික කණ්ඩායම්වලට එරෙහි වෙනත් ආගමික කණ්ඩායම් විසින් සිදුකරන වෛරී කථනය ද සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබේ. මේ අනුව, සහනය සහ සාමකාමී සහපැවැත්ම සඳහා අවශ්‍ය කරන වාතාවරණය නීතියේ අර්බුදය විසින් ඉවත් කර තිබේ. එබඳු ප්‍රහාර වළක්වා ගැනීම ආණ්ඩුව අපොහොසත් වන බවට විවේචන නැගෙන විට සුළුතරයන් ආරක්ෂා කිරීම පිළිබඳ යම්කිසි මහජන මතයක් නැගේ. කෙසේ නමුත් සකල නීති පද්ධතියම අවුල් ජාලයක් සහ කැඳ හැළියක් බවට පත්ව තිබෙන විට එවැනි මතයන් නැගීමට ඔබ්බෙන් කිසිවක්ම කිරීමේ හැකියාවක් ආණ්ඩුවට නොමැති වී යයි. කුපිත කරන්නෝ එවිට නීතියේ තිබෙන අර්බුදය සිය වාසියට යොදාගනිති.

## ඊ) උතුරු නැගෙනහිර දිග් ගැස්සුණු අරගලය හා සැබැඳි ගැටලු

අරගලය හා සැබැඳි වගවීම සහ සංහිඳියා ගැටලු ඇතුළු උතුරු නැගෙනහිර ට සුවිශේෂී වූ ප්‍රශ්න වලට පිළිතුරු සෙවීමේදී නීතිය හා පරිපාලන ක්‍රමයට සම්බන්ධිත සමස්ත ගැටලුව ඒ සඳහා තිබෙන විශාලතම ප්‍රශ්නය ලෙස පවතිනු ඇත. සිවිල් පොලීසියේ විතැන් වීම, සහ එය හමුදාව විසින් ප්‍රතිස්ථාපනය කිරීම, ඔත්තු සේවාවන් හා විශේෂ නාවික සේවා විසින් උතුරු නැගෙනහිර තත්වය වෙත ගැඹුරු බලපෑමක් සිදුකර තිබේ. සිය මාධ්‍ය නාලිකා හරහා සිදුකරන ආණ්ඩුවේ ප්‍රචාරණ උපක්‍රමය එල්ටීටීඊ ය නැවත හිස එසවිය හැකි බවට වන අතර එය ද මේ තත්වය සඳහා විශාල වශයෙන් බලපෑම් කරයි. නීතිය සමාජ සංවිධානය මත පදනම් නොවන්නේ නම්, එවිට මේ ප්‍රදේශවල ජනතාවට බලපාන ගැටලු, නීතිය ඉදිරියේ සමානාත්මතාවය යන පදනම මත විසඳන්නේ කෙසේද? ශ්‍රී ලංකාවේ නෛතික වාතාවරණයේ තත්වය, ද්‍රවිඩයන් ද ඇතුළු එහි වෙසෙන සියලු සුළුතරයන්ට බලපාන මූලිකතම ගැටලුව වේ. අවාසනාවකට මෙන් මේ ගැටලුව, උතුරු සහ නැගෙනහිර පළාත්වල පවතින ප්‍රශ්නවලට තවමත් තනිව විසඳුම් සෙවීමට අවශ්‍ය ද්‍රවිඩ ඩයස්පෝරාව විසින් උචිත බරපතළ කමකින් යුතුව නගා නැත. කෙසේ නමුත්, නෛතික වතාවරණයේ සමස්ත අර්බුදයම සුලුජාතික ගැටලුවලට විසඳුමක් සෙවීමේදී නොවැළැක්විය හැකි බාධකය බවට පත්ව තිබෙන නිසා මෙබඳු යථා දර්ශනයක් ක්‍රියාවට නැංවීම කළ නොහැකි දෙයකි. එපමණක් නොව සුළුජාතික ගැටලුවලට විශේෂ අවධානයක් ලබාදීම ට විරුද්ධ වන්නෝ නීති ක්‍රමයේ පවතින අර්බුදය සුලුජාතීන් ට අවාසියක් කිරීම සඳහා මෙහෙයවති. රටේ අතිශය කුපිත කරවනසුලු දේශපාලන වාතාවරණය ඉදිරියේදී උදාවීමට නියමිත කාලයන්හිදී ද රට තුළ ගැටලු නිර්මාණය කිරීමට සමත් වනු ඇත.

## උ) උගත් පාඩම් හා සංහිඳියා කොමිසමේ (LLRC) නිර්දේශ ක්‍රියාවට නැංවීමක් නැත.





Photo Courtesy :
srilankabrief.org

උගත් පාඩම් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ පූර්ව කොන්දේසිය වන්නේ නීතියේ ආධිපත්‍යයයි. මේ වාර්තාවේදී නැවත නැවතත් පෙන්වා දී ඇති පරිදි යුක්තියේ පරිපාලනය සම්බන්ධ සමස්ත අර්බුදය නීතියේ ආධිපත්‍යය සමග අසංගත වේ. උගත් පාඩම් හා සංහිඳියා කොමිසමේ නිර්දේශ ක්‍රියාවට නැංවීමේදී මේ අසංගත භාවය බලපානු ලබන්නේ සාමය හා සංහිඳියාව සඳහා ආණ්ඩුව සහ අන්තර්ජාතික ප්‍රජාවේ ඉල්ලීම් අතර පවතින තරගකාරී ගැටලුවේ හරයට ය.

## ඌ) නීතිය හා යුක්තිය පරිපාලනය පිළිබඳ අර්බුදයේ සමස්ත සෘණාත්මක මනෝවිද්‍යාත්මක බලපෑම සහ සකල ජනගහනය තුළ අනාරක්ෂාව ජනනය වීම.

නොපනත්කම සහ පරිපාලනමය කාර්යපටිපාටික ක්‍රමයක් හරහා ආරක්ෂාව නොලැබීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සකල ජනගහනයම මානසික වශයෙන් පීඩනයට ලක්ව සිටිති. මේ මනෝවිද්‍යාත්මක තත්වය ජනතාවගේ සෞඛ්‍යය සඳහා බලපායි. සෑම අයෙක්ම අයහපත් ලෙස බලපෑමට ලක්වන විට එහි නරකම බලපෑමට නතුවන්නේ ළමුන් ය. ධනාත්මක මානුෂ අගයන් පදනම් ව සිය පෞරුෂයන් වර්ධනය කරගත හැකි වාතාවරණයක් ඔවුන්ට ඌන වේ. මෙකී මානසික තත්වයන්ගෙන් ඇති වූ කැළැල් මේ දරුවන්ගේ අනාගතයන් වෙත කල්පවත්නා බලපෑම් සිදුකරනු ඇත. සරසවිවල ඉගෙනුම ලබන

සිසුන් මෙකී මානසික වාතාවරණයෙන් දැඩි බලපෑමකට ලක් වේ. ආණ්ඩුව නිතරම ශිෂ්‍යයන් සලකන්නේ ආරක්ෂාවට තර්ජනයක් ලෙසිනි. දැඩි ලෙස බාධනය කරනු ලැබූ වාතාවරණයක් මෙම සිසුන්ගේ එදිනෙදා ජීවිතයට ද ඔවුන්ට අහිමි කරන අතර සිය ශාස්ත්‍රීය කටයුතුවල යෙදීමේදී ඔවුන්ව විවිධ දුෂ්කරතාවලට නිරාවරණය කරයි. අනාරක්ෂාව ජීවිතයේ සාමාන්‍ය ආකාරයක් බවට පත්ව තිබෙන මෙම වාතාවරණය තුළ ස්ත්‍රීහු විශේෂයෙන් එහි බලපෑමට ලක් වෙති. මේ අනුව සෑම  අයෙක්ම සෑම කල්හිම අප්‍රසන්න සහ සන්ත්‍රාසමය තත්වයකට මුහුණ දෙන අතර එයින් ගැළවීමට මගක් නැත.

**පරිශීලන**


1) Fernando, Basil, Gyges' Ring -- The 1978 Constitution of Sri Lanka, Asian Human Rights and Rehabilitation (AHRC) and Research Centre for Torture Victims (RCT), August 2011
Internet link:
http://www.humanrights.asia/resources/books/AHRC-PUB-002-2011/GygesRingSL.pdf/view

2) Fernando, Basil, Recovering the authority of public institutions - a resource book on law and human rights in Sri Lanka, Asian Human Rights Commission, 2009
Internet link:
http://www.humanrights.asia/resources/books/AHRC-PUB-002-2009/RecoveringTheAuthorityOfPublicInstitutions.pdf

3) Kishali Pinto-Jayawardena and Jayantha de Almeida Gunaratne, Habeas Corpus in Sri Lanka; Theory and Practice of the Great Writ in Extraordinary Times, Law & Society Trust, January 2011
Internet link: (Click Here <http://www.lawandsocietytrust.org/PDF/HABEAS%20CORPUS%20IN%20SRIL%20LANKA %20THEORY%20AND%20PRACTICE%20OF%20THE%20GREAT%20WRIT%20IN%20EXTRAORDINARY%20TIMES.pdf>)

4) Fernando, Basil, The privileging of impunity in Sri Lanka's prosecutorial process and legal system, LST Review- Vol.306 and 307 in May 2013

5) Fernando, Basil, 'Sri Lanka; The politics of habeas corpus and the marginal role of the Sri Lankan Courts under the 1978 Constitution', LST Review Issue 275 &276, Vol. 21, September and October, 2010, pp 20-34, Law & Society Trust, 2010.

6) THE IMPEACHMENT Documenting the Rajapaksa Regime's Scheme, Compiled by. Asian Human Rights Commission, March 2013
Internet link:
http://www.humanrights.asia/resources/books/the-impeachment-motion-against-shirani-bandaranayake/AHRC-PRL-052-2012.pdf/view

7) Fernando, Basil, Narrative of Justice in Sri Lanka: told through stories of torture victims, Asian Human Rights Commission, 25th June 2012
Internet link:
http://www.humanrights.asia/resources/books/narrative-of-justice-in-sri-lanka/narrativeofjusticesl.pdf

8) AUTHORITY WITHOUT ACCOUNTABILITY: The Crisis of Impunity in Sri Lanka, International Commission of Jurists Report, 2012

9) WRITTEN SUBMISSIONS ON BEHALF OF THE 12TH RESPONDENT-RESPONDENT ON MAIN ARGUMENTS for the application of the Attorney General in case No: SC Appeal No. 67/2013

10) AMICUS CURIAE WRITTEN SUBMISSIONS ON BEHALF OF THE COMMONWEALTH LAWYERS ASSOCIATION AND THE BAR HUMAN RIGHTS COMMITTEE OF ENGLAND AND WALES for the application of the Attorney General in case No: SC Appeal No. 67/2013

11) SRI LANKA: Rapid fall into Dictatorship, Sri Lanka Chapter, in the Annual State of Human Rights Report of the Asian Human Rights Commission 2012

12) SRI LANKA: International Human Rights Agencies failed to notice the Collapse of the Sri Lanka’s Public Institutions of Justice, Sri Lanka Chapter, in the Annual State of Human Rights Report of the Asian Human Rights Commission in 2011

13) Constitutionally entrenched impunity, Sri Lanka Chapter, in the Annual State of Human Rights Report of the Asian Human Rights Commission in 2010


14) Abysmal lawlessness & zero status of citizens, in the Annual State of Human Rights Report of the Asian Human Rights Commission in 2009

15) The loss of the supremacy of the law, in the Annual State of Human Rights Report of the Asian Human Rights Commission in 2008

16) Human rights violations rise further in 2007, in the Annual State of Human Rights Report of the Asian Human Rights Commission in 2007

17) SRI LANKA: The Situation of Human Rights in 2006, in the Annual State of Human Rights Report of the Asian Human Rights Commission in 2006

18) SRI LANKA: Deliberate neglect of U.N. treaty body recommendations adds to general lawlessness in Sri Lanka, in the Annual State of Human Rights Report of the Asian Human Rights Commission in 2005





වැරදි කරන මිනිසුන් අතින් සිදුවනවාටත් වඩා
වැඩි විනාශයක්
ඔවුන් වැරදි කරනවා නුදුටු දෑසින්
නිහඬව සිටින මිනිසුන් නිසා
මේ ලෝකයට සිදුවේ.

\- ඇල්බට් අයින්ස්ටයින් (1879-1955)

# අලුත් පොත්

සාහිත්‍ය මාසය වෙනුවෙන්
ආසියානු මානව හිමිකම් කොමිසම විසින්
එළිදැක්වූ ප්‍රකාශන දැන් **සියලුම සරසවි/ ස්ටැම්ෆර්ඩ් ලේක් ශාඛාවන්ගෙන් ලබාගත හැක**
ඔබේ පිටපත අදම වෙන් කරවා ගන්න

| හඬනු මැන දේශය - බැසිල් ප්‍රනාන්දු<br>කවි - මිල රු 300 | පොලීසිය වධකාගාරයක්<br>මිල රු 200 | Narrtive of Justice – 2nd print<br>Rs 1000 |
|---|---|---|
|  |  |  |







බැසිල්ගේ කවිකමෙහි එන ලංකාව, ඔහුගේ නිර්භය නිර්මාණශීලීත්වය විසින් දකිනා, ආශ්වාස කරනා, නැවත සිහිකරනා, විරෝධය පානා සහ ගායනා කරනා පලුදු සහිත නමුත් සිත ඇදගන්නා සුලු මරකත මැණිකකි. කවියේ මෙහෙවර ජාතිය විස්තර කිරීම, යථාර්ථය විස්තර කිරීම සහ දුගීම ජන බහුතරයේ ජාතිය විස්තර කිරීම බව බැසිල් සිතයි. යුක්තිය පිළිබඳ නව ප්‍රජාතන්ත්‍රවාදී දැක්මක් සහිත යුක්තියේ කවියාගේ හඬ සැබෑ සමාජ අත්දැකීම්වල විසල් අවකාශයෙන් පිරී යයි. විසිවන සියවසේ දේශපාලන කවීත්වයේ හෘදයාංගම මූලයන් එම කවිකමට තිබේ.

- ඉන්දියානු මහාචාර්ය කේ.ජී. සංකර පිල්ලෙයි - හඬනු මැන දේශය කාව්‍ය සංග්‍රහයේ පසු වදනින්

‘This is a publication which is most timely and bold. It reminds us that a cross section of Sri Lankans have been subject to the most inhuman treatment while most of us were going about our daily bussiness. That these acts of violence have been cmmited by the very authorities who exist for the safety and protection of our citizens is an indictment on all Sri Lankans'

- Duleep de Chickera (14th Anglican Bishop of Colombo)

- from the Back Cover of 2nd Edition, Narrtive of Justice in Sri Lanka




# අඩු වී තිබුණේ මෙච්චරයි!

*මේ බූට් සපත්තුව යට ඉතා සැපදායක ය!*

Photo Courtesy :
lankaenews

# නීතිය හා සාමයටත් අමාත්‍යංශයක්

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් ආචාර්ය නවනීදන් පිල්ලේ ලංකාවට පැමිණෙන්නට තදාසන්න වූ විටදී ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා කඩිමුඩියේ තවත් අමාත්‍යාංශයක් පිහිටවූයේය. ඒ අනුව නීතියක් **හෝ** සාමයක් නැති රටකට නීතිය **හා** සාමය අමාත්‍යාංශයක් ලැබුණේය. මෙම අමාත්‍යාංශය පිහිටුවීමට යන බව නිවේදනය කළ විට ආසියානු මානව හිමිකම් කොමිසම ඒ පිළිබඳ විමසා බැලූයේ මෙසේ ය.

ජනාධිපතිවරයා යටතේ නීතිය හා සාමය අමාත්‍යාංශයක් ස්ථාපිත කරන බව නිවේදනය කර තිබේ. මේ අමාත්‍යාංශයේ ලේකම් වන්නේ, වාර්තාවන්ට අනුව විශ්‍රාමික හමුදා නිලධාරියෙකු වන මේජර් ජනරාල් (විශ්‍රාමික) නන්ද මල්ලවාරච්චි ය. මේජර් ජනරාල් මල්ලවාරච්චි ශ්‍රී ලංකා යුධ හමුදාවේ හිටපු මාණ්ඩලික ප්‍රධානියා ය. පසුව ඔහු ඉන්දුනීසියාවේ සිටි ශ්‍රී ලංකා තානාපති බවට පත්විය. මැලේසියානු ආරක්ෂක අංශවල උදව් ඇතිව එල්ටීටීඊ යේ කුමරන් පද්මනාදන් හෝටලයකින් පැහැරගෙන ගොස් ගුවන් තොටුපොළ වෙත ගෙන ඒමේ සිද්ධියේදී ඔහු ප්‍රධාන භූමිකාවක් ඉටු කළ බව වාර්තා වේ.

මේ අමාත්‍යාංශය පිහිටුවීම උගත් පාඩම් හා සංහිඳියා කොමිසමේ (LLRC) නිර්දේශයක් අනුව සිදුකරන්නේ ය යන බොරු හේතුව මත සාධාරණීකරණය කර තිබුණ ද මෙයින් නිසැක ලෙසම පෙනී යන්නේ මිලිටරීකරණය හෙවත් හමුදාකරණය වෙත ළං වන තවත් පියවරකි.

LLRC නිර්දේශයන් සිදුකරන්නේ නීතියේ ආධිපත්‍යයේ රාමුව තුළ සිට ය. නීතියේ ආධිපත්‍යය යටතේ නීතිය හා සාමය මගින් සරල ලෙසම අදහස් කරන්නේ නීතියේ ප්‍රධානත්වය හෝ ආධිපත්‍යය ස්ථාපිත කිරීමයි. තවද සිවිල් පොලීසිය, අභිචෝදක වශයෙන් ස්වාධීන නීතිපති දෙපාර්තමේන්තුවක් සහ ස්වාධීන අධිකරණයක් යන නීත්‍යානුකූල අධිකාරීන් හරහා නීතිය බලාත්මක කිරීමයි. නීතියේ ආධිපත්‍යය යටතේ හමුදාව සිටිය යුත්තේ බැරැක්ක තුළ ය. රටට තර්ජනයක් ඇතිවිට පමණක් ඔවුන්ව සේවය සඳහා කැඳවේ. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ දැන් සිදුවන්නේ නීතිය හා සාමය පවත්වාගෙන යාමේ බොරු හේතුව දක්වමින් හමුදාව පෙරමුණට ගැනීමයි.

වැලිවේරියේදී පිරිසිදු ජලය ඉල්ලීම පමණක් සිදුකළ ගම්වැසියන්ගේ සාමකාමී උද්ඝෝෂණයකට හමුදාව මැදිහත් වූයේ කෙසේදැයි රටම දුටුවේය. සොල්දාදුවන් ලෙස ක්‍රියාකළ ස්නයිපර් තුවක්කුකරුවෝ අසරණ ජනතාව වෙඩි තබා ඝාතනය කළහ. සෙසු සොල්දාදුවෝ පල්ලිය වත්තට පවා ඇතුලු වූහ. දේවස්ථානයේ රැකවල් ලබමින් සිටි ජනතාවට තාඩන පීඩන කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස පල්ලිය වත්තේදී එක් අයෙක් මිය ගිය අතර පුද්ගලයන් ගණනාවක්ම තුවාළ ලැබූහ. ඝාතනය කළ තවත් දෙදෙනෙක්, විරෝධතාවය සමග කිසිදු සම්බන්ධතාවක් නොතිබූ වයස අවුරුදු දහසයේ සහ දහඅටේ පසුවූ යොවුන් දරුවන් ය. මේ ගැන පරීක්ෂණය පැවැත්වීමට නියම වුණේද හමුදාවටම ය. හමුදා පරීක්ෂණය මෙහෙයවන නිලධාරියා යුධ අපරාධ සිදුකිරීමේ චෝදනාව සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් සැක කරන්නෙකි.



විශ්‍රාමික මේජර් ජනරාල් නන්ද මල්ලවාරච්චි
අමාත්‍යාංශ ලේකම් ලෙස දිවුරුම් දෙයි
Photo Courtesy : news360.lk

මේ තත්වය යටතේ පුරවැසියාගේ සිවිල් නිදහස සහ රටේ නීතියේ අනාගතය පිළිබඳ සැලකිලිමත් වන්නන් 'නීතිය හා සාමය' යන්නේ අඹරවා පටලවා තිබෙන තේරුම බරපතළ ලෙස අධ්‍යයනය කළ යුතුය. මේ ගැටලුව සම්බන්ධයෙන් සිදුකළ බරපතළ අධ්‍යයනයන් තිබේ. උදාහරණයක් වශයෙන්, රට හමුදාකරණය කිරීම උදෙසා 'නීතිය හා සාමය' යන යෙදුම භාවිතා කළ එක් රටක් වූයේ, ජනරාල් නී වින් ගේ හමුදා ඒකාධිකාරය පැවති සමයේ මියැන්මාරය (බුරුමය) යි. 1962 සිට 1988 දක්වා වූ ඔහුගේ පාලන කාලයේදී 'නීතිය හා සාමය' යන්න, මියැන්මාරයේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයක් පවතින විට ස්ථාපිත කර තිබූ මූලික නෛතික ව්‍යුහය නොරැකීම පිණිස වන සටන් පාඨය විය. මෙහිදී ඉතා ස්වාභාවික ලෙසම, හමුදාමය ආයතනද ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් විසින් මෙහෙයවනු ලැබීය. එය ඊනියා අධිකරණවලට හමුදාවෙන් විනිසුරුවරුන් පත්කිරීම දක්වාම දුරදිග ගියේය. අද මියැන්මාරයේ සිටින අගවිනිසුරු පවා හිටපු හමුදා නිලධාරියෙකි.

ඔස්ට්‍රේලියා ජාතික විශ්ව විද්‍යාලයේ (Australian National University (ANU)) ආචාර්ය නික් චීස්මන් විසින් 'The politics of law and order in Myanmar' ('මියැන්මාරයේ නීතිය හා සාමයේ දේශපාලනය') යනුවෙන් මේ පිළිබඳ අධ්‍යයනයක් සිදුකර තිබේ. මේ අධ්‍යයනයේදී, 'නීතිය හා සාමය' යන යෙදුම, නීතියෙන් 'සාමය' යැයි කියන දෙය වියෝ කිරීමට හෙවත් වෙන් කිරීමට පාවිච්චි කරන ආකාරය ඔහු විසින් දක්වා ඇත. මේ ක්‍රියාවලිය මගින් ආණ්ඩුවේ නියෝග 'නීතිය' යන තත්වය අත්පත් කර ගනියි. නීතියේ ආධිපත්‍යය පවතින ක්‍රමයක් තුළ නීති සාදන්නේ පාර්ලිමේන්තුවක් හරහා වන අතර එය නීත්‍යානුකූල බව ලබාගැනීමට නම් නීතිය මගින් නියම කළ උපමානයන් අනුගමනය කළ යුතුය. එපමණක් නොව නීතියේ ආධිපත්‍යය පවතින තත්වයක් තුළ නීතිය අවසාන වශයෙන් අධිකරණයේ අර්ථනිරූපණයට බඳුන් වේ. කෙසේ නමුත් හමුදාමය සන්දර්භයක් තුළ පවතින නීතිය හා සාමයක් යටතේදී ආණ්ඩුවේ නියෝගවලට අධිකරණය ද ඇතුලුව සැවොම හිස නැමිය යුතුය. මෙහිදී අධිකරණ ද හමුදා නියෝග ක්‍රියාත්මක කරන හුදු උපකරණ පමණක් බවට පත්වන ආකාරය ආචාර්ය චීස්මන් විසින් විදහා දක්වයි.

දැන්, LLRC නිර්දේශ ක්‍රියාවට නංවන බවට බොරු හේතුව ඉදිරිපත් කරමින් හමුදාකරණය තවදුරටත් නොනැවතී සිදුවෙයි. සමහරවිට, 'නීතිය හා සාමය' යන යෙදුම යොදාගෙන ඇත්තේ LLRC නිර්දේශයක් ක්‍රියාවට නංවා ඇතැයි ශ්‍රී ලංකා සංචාරයේදී ආචාර්ය නවී පිල්ලේ (එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්) ගේ සිතට කාවැද්දවීමේ අදහසින් විය හැකිය. මහ කොමසාරිස්වරිය ශ්‍රී ලංකාවට පැමිණෙන වැදගත් අවස්ථාව ද හමුදාකරණය නීත්‍යානුකූල කිරීම සඳහා යොදාගැනීම, රට යන අත පෙන්වන ලකුණකි.




## නොපැකිළ කරමි එම පව

**රටේ දුක**
**කියන එක**
**පාපයක් නම්**
**කවියකු නොකළ යුතු**
**වරක් නොව දහස් වාරයක්**
**කරමි මම**
**එම පව**
**නොපැකිළ**

\- බැසිල් ප්‍රනාන්දු
\- චීන ගෙදර කිරිල්ලියගේ ගීතය - පිටුව 67

පරම (අන්ත) සිංහල බෞද්ධ
යැයි කියා ගන්නා මේ
ආණ්ඩුව මේ වන විට දශක
තුනක යුද්ධය අවසානයේ
අවස්ථා තුනකදී මහජාතියට
හොඳහැටි සලකා තිබේ,
හලාවතදී, කටුනායකදී සහ
වඩාත්ම මෑත කාලයේ
රතුපස්වලදී ය. රතුපස්වල
නැඳුන්ගමුව ගම්වාසීන්
ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේ
පිරිසිදු ජලය මිස වෙන
අහවල් දෙයක් නොවේ.
ජලය ඉල්ලූ විට ඔවුන් ට
උණ්ඩ ලැබුණේය. හමුදාව
දරුවන් මැරුවේ කාගෙන්
අසාදැයි සැවොම දනිති. ඒ
අතරම කිසිවෙක් එය
නොදනිති. දැන් මේ රටෙහි
හැටි එසේ ය.




SRI LANKA: Shifting the burden of proof on the people

# ශ්‍රී ලංකාව: ඔප්පු කිරීමේ භාරය ජනතාවට මාරු කිරීම

- **ආසියානු මානව හිමිකම් කොමිසමෙන් ප්‍රකාශයක්**

වැලිවේරිය, රතුපස්වල ඝාතන විසින් ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය තියුණු නාභිගත වීමකට ලක් කර තිබේ. හමුදාවේ ක්‍රියාවන් මගින් ඝාතනයට ලක්වීම හෝ සෙසු ආකාරයකින් බරපතළ ලෙස තුවාල ලැබීම පිළිබඳ චෝදනා ඔප්පු කිරීමේ භාරය දැන් ජනතාව මතට මාරු කර තිබේ. මේ අතර හමුදාව විසින් සිදුකළ මේ හිංසාවන්ගේ ඇසින් දුටු සාක්ෂිකරුවන් වීම හේතුවෙන් ජනතාව භීතියෙන් ජීවත් වෙති.

සියලු අපරාධ රජයට එරෙහි අපරාධ ය යන්න මූලිකම මූලධර්මයන්ගෙන් එකකි. ඒවා සිවිල් වැසියන් විසින් සිවිල් වැසියන්ට එරෙහිව සිදුකළ ඒවා වුවත්, පොලීසිය හෝ හමුදාව වැනි රජයේ නියෝජිතයන් විසින් සිවිල් වැසියන්ට එරෙහිව සිදුකළ ඒවා වුවත් විමර්ශනය කිරීමේ සහ වරදකරුවන් ට දඬුවම් පැමිණවීමේ භාරය තිබෙන්නේ රජය වෙත ය.

වරදකරුවන් රජයේ නියෝජීයන් බවට චෝදනා නැගෙන විට එකී චෝදනා නිසි ලෙස විමර්ශනය කිරීමටත් අපරාධකරුවන් හැකිතාක් විගස අධිකරණ ඉදිරියට ගෙන ඒමටත් රජයට විශාල භාරයක් තිබේ. මෙකී මූලික බැඳීමට ද ශ්‍රී ලංකාව ව්‍යතිරේඛයක් සේ ය. රාජ්‍ය නියෝජීයන් විසින් සිදුකළ අපරාධ ඔප්පු කිරීමට සිදුව තිබෙන්නේ ද ජනතාවට ය.

ඒ, ඔවුන් තාඩන පීඩනවලටත් තර්ජනයන්ටත් ලක්වන අතරතුරම ය.

රාජ්‍ය නියෝජිතයන් ඝාතන සහ රජයට එරෙහි වෙනත් අපරාධවලට සම්බන්ධ බවට චෝදනා පවතින විට එම ගැටලු විමර්ශනය කිරීම සඳහා රජයට තමන්ගේම නියෝජිතායතන තිබේ. එබඳු විමර්ශනයන් සිදුකරන ක්‍රමවේදය හමුදා මෙන්ම පොලිස් අත්පොත්වලද මනා ලෙස දැක්වේ.

හමුදා මෙහෙයුමකදී සිදුකළ අපරාධ පිළිබඳ සාක්ෂි පහත දැක්වෙන නියම කර තිබෙන කාර්යපටිපාටීන්ගෙන් ලෙහෙසියෙන්ම අල්ලා ගන්නට පුලුවන. මෙහෙයුමට නායකත්වය දුන් අය එයින් අපේක්ෂා කළේ කුමක්ද යන්නත් මෙහෙයුමට සහභාගිවූවන් ක්‍රියාකළ යුතුව තිබුණේ කුමන නීති රෙගුලාසි යටතේද යන්නත් දනිති. උල්ලංඝනයන් සිදුව තිබේ නම්, ඒ උල්ලංඝනයන් මොනවාද යන්න සඳහන් කිරීමත් ඉන් පසුව එකී උල්ලංඝනයන් සිදුවූයේ කෙසේදැයි මෙහෙයුමට දායක වූවන්ගෙන් ප්‍රශ්න කිරීමත් මෙහෙයුම ට නායකත්වය දුන් අයගේ රාජකාරියයි.

රාජ්‍ය නියෝජිතයන් වන අය, සිදුවූයේ කුමක්දැයි ස්වකීය ප්‍රධානීන් හට හෙළිකිරීම ඔවුන්ගෙන් බලාපොරොත්තු වන දේවල් අතරින් එකකි.

මෙය පවා කළ නොහැකි නම් රජය සහ මෙහෙයුම ට නායකත්වය දුන් අය සහ මෙහෙයුමට සම්බන්ධ වූ අය අතර පවතින සම්බන්ධතාවයම ප්‍රශ්නකාරී වේ.

ඒ මට්ටමේ විනයක්වත් සහතික කළ නොහැකි නම් රජයේ නියෝජිතයන් ඔවුන්ගේ බැඳීම් නිසියාකාර ලෙස පවත්වාගෙන යන බවට සහතික වීම ආණ්ඩුවේ නායකත්වයේ වගකීමයි.

එසේ වුවත්, ඉහතින් දැක්වෙන කාටූනය පෙන්වන්නේ ශ්‍රී ලංකාවේ හැම දෙයක්ම තනිකරම ඔලුවෙන් හිටවී ඇති බවයි. තවද ඒ තත්වයට බිලිවී ඇති **ජනතාවම තමන්ගේ විමර්ශකයන් සහ අභිචෝදකයන් බවට පත්වන තත්වයට ඇද දමා ඇති බවයි.**








රතුපස්වල අමානුෂික ප්‍රහාරයට එරෙහිව රටේ සිවිල් සංවිධාන සහ ජනතාව අගනුවර විරෝධතාවල නිරත වී සිටි අයුරු

# Killology

# ඝාතනවේදය




71 ජවිපෙ කැරැල්ලේ සිට රතුපස්වල දක්වා සිදුකළ ඝාතනවලදී සන්නද්ධ හමුදාවේ මානසිකත්වය අධ්‍යයනය කළ යුතු නම් ඝාතනවේදය හෙවත් ඝාතන විද්‍යාව නමැති විෂයය ලංකාවේ පර්යේෂකයන්ට විෂය විය යුතුය. පහත දැක්වෙන්නේ *ශ්‍රී ලංකාව : ඝාතනවේදය (Killology) පිළිබඳ අධ්‍යයනයන් හඳුන්වාදීමේ වැදගත්කම*
යනුවෙන් ආසියානු මානව හිමිකම් කොමිසම අගෝස්තු 12 වැනිදා ඉදිරිපත් කළ විශේෂ වාර්තාවයි.

**අවුරුදු 16 සහ 18 වයස්වල පිරිමි ළමුන් දෙදෙනෙකුව, ඝාතන අරමුණ ඇතිව මරාදැමීම සඳහා සොල්දාදුවෙකුට හැකියාව ඇති කරන්නේ කුමක්ද?**

වැලිවේරිය, රතුපස්වලදී සිදුවූයේ එයයි.


සත්‍ය වශයෙන්ම ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාව, විශේෂයෙන්ම 1971 ජවිපෙ කැරැල්ල සහ එයින් ඔබ්බට ක්‍රියාකර තිබෙන ආකාරය බලන විට එවැනි ඝාතන විශේෂ දෙයක් නොවේ. ඔවුන් විසින් සිදුකළ එවැනි ඝාතන දස දහස් සංඛ්‍යාත විය හැකිය. එය එසේ සිදුවූයේ කෙසේදය යන ගැටලුවට පිළිතුරු සෙවීම, ශ්‍රී ලාංකේය සිවිල් සමාජයේ බොහෝ ක්ෂේත්‍ර වෙතට විශේෂයෙන්ම, සන්නද්ධ හමුදාව පෝෂණය කර තිබෙන මානසිකත්වය පිළිබඳ යම්

අවබෝධයක් ලබාගැනීමට හැකිකරනු ඇත. එවැනි අධ්‍යයන අයත් වන්නේ දැන් 'ඝාතනවේදය' හෙවත් 'ඝාතන විද්‍යාව' (Killology) යැයි කියනු ලබන ක්ෂේත්‍රය තුළට ය.

'ඝාතනවේදය' හෙවත් 'ඝාතන විද්‍යාව' යන මේ යෙදුම බිහිකළේ ඝාතනවේදය පිළිබඳ පර්යේෂණ කණ්ඩායමේ ලුතිනන් කර්නල් ඩේව් ග්‍රොස්මන් (විශ්‍රාමික) විසින් 1995 දී ප්‍රකාශිත "*On Killing: The Psychological Cost of Learning to Kill in War and Society* " ඔහුගේ ග්‍රන්ථයෙනි. ග්‍රොස්මන්ගේ කාර්යය දැවැන්ත අවධානයක් දිනාගත් අතර සෙස්සන්ගේ පර්යේෂණ කාර්යයන් රාශියක් සඳහා ද මග පෙන්වීය. ඔහුගේ අදහස් පිළිබඳ අදහසක් ලබාගැනීමට කැමැති අයට යූ ටියුබ් වෙබ් අඩවිය හරහා එය සිදුකළ හැක.



ලුතිනන් කර්නල් ඩේව් ග්‍රොස්මන් (විශ්‍රාමික)




*On Killing: The Psychological Cost of Learning to Kill in War and Society*

මීට පෙර සිදුකළ ඇති අධ්‍යයනවලින් පෙනී යන පරිදි යුධ බිමේදී පවා බොහෝ සොල්දාදුවෝ ඝාතන සිදුකිරීමට පැකිළෙති. සමහර අධ්‍යයනවලින් පෙනී යන්නේ මරා දැමීම සඳහා කැමැත්තෙන් වෙඩි තබන්නේ 20%ක ප්‍රතිශතයක් පමණක් වන බවයි. ඝාතනය කිරීම සඳහා වන එම අකමැත්ත, ඕනෑම විශේෂයක් තමන්ගේම විශේෂයේ සාමාජිකයන් මරාදැමීම වෙත දක්වන අරුචිය හෝ පිළිකුල නිසා ආරෝපණය වන්නකි. ඝාතනය සඳහා වන අකමැත්ත විශ්වීය ගතිලක්ෂණයක් බවට පත්වන විට, අනෙක් අයව මරාදමන පුද්ගලයන් බරපතළ පසුතැවිල්ලකට ලක්වෙයි. එය, විවිධ අධ්‍යයනවලින් පෙන්වා දී ඇති පරිදි, එම පුද්ගලයන්ව බරපතළ මානසික කැළඹීම්වලට ගොදුරුවීමට මග පෙන්වයි.

ඇමරිකානු සන්නද්ධ හමුදාව සහ පසුකාලීනව සෙසු සන්නද්ධ හමුදා අරබයා මෙම මනෝවිද්‍යාත්මක දැනුම, යුද්ධයේදී වඩාත් ඵලදායී ලෙස මරා දමන්නේ කෙසේද යන්න පිළිබඳ විවිධාකාරයේ පුහුණුවීම් සිදුකිරීමට සහ තාක්ෂණයන් සකස් කර ගැනීමට මග පෙන්වීය. මේ අනුව, ඝාතනය කිරීමට විරුද්ධව උපදින ප්‍රතිරෝධය මැඩපැවැත්විය හැකි සහ විවිධ තාක්ෂණික ක්‍රම උපයෝගී කරගෙන මානව ප්‍රතිරෝධය මැඩලමින් ඉහළ ඝාතන වේගයක් අත්කර ගත හැකි ක්‍රම සොයාගැනීම හමුදා මනෝවිද්‍යාව තුළ දැඩි ලෙස අවධාරණය කෙරිණි.



"මේ අනුව, ඝාතනය කිරීමට විරුද්ධව උපදින ප්‍රතිරෝධය මැඩපැවැත්විය හැකි සහ විවිධ තාක්ෂණික ක්‍රම උපයෝගී කරගෙන මානව ප්‍රතිරෝධය මැඩළමින් ඉහළ ඝාතන වේගයක් අත්කර ගත හැකි ක්‍රම සොයාගැනීම හමුදා මනෝවිද්‍යාව තුළ දැඩි ලෙස අවධාරණය කෙරිණි."

මෙහිදී ඇසිය යුතුව තිබෙන ප්‍රශ්නය වන්නේ, වැලිවේරිය රතුපස්වල පිරිමි ළමුන් දෙදෙනෙක් වැනි ඝාතන ශ්‍රී ලංකාවේ හමුදා සොල්දාදුවන් අතරින් සමහරෙකුට කළ හැකි වූයේ කෙසේද යන්නයි. රතුපස්වල සිද්ධියේදී වූ පරිදි සෘජු ලෙස වෙඩි තැබීම මගින් පමණක් නොව, පැහැර ගැනීම් හා බලහත්කාරයෙන් සිදුකරන අතුරුදන්වීම්වලින් පසු ඝාතනය කිරීම සඳහා ලබාදෙන්නේ කුමනාකාරයේ පුහුණුවක්ද සහ පෙළඹවීමක් ද යන්න බරපතළ අවධානයක් යොමුකළ යුතු ගැටලුවකි. අතීතයේ සොල්දාදුවන් ලෙස කටයුතු කළ අය අතර ඝාතනය කිරීම් නිසා හටගන්නා මානසික කැළඹීම් හා ආබාධ පුළුල් ලෙස පවතින ගැටලුවක් බව සඳහන් වුවද, මේ විෂය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ බරපතළ අධ්‍යයනයක් සිදුවී නැත. කහවත්තේ සිදුවූ ඝාතන සම්බන්ධයෙන් අතීතයේ සොල්දාදුවෙක්ව සිටි අයෙක් වගකිව යුතු වූ බවට වාර්තා වැනි සමපේක්ෂණයන් පමණක් මේ සම්බන්ධයෙන් දැකගත හැකිය.







Photo Courtesy : The Sunday Leader



Photo Courtesy : Lanka Thruth

මෑත භාගයේ කටුනායක ඝාතන සිදුවිය. තවද පෙට්‍රල් මිල ඉහළයාම පිළිබඳ උද්ඝෝෂණයකට සහභාගී වීමට සිටි මීගමුවේ ධීවරයෙක් ද ඝාතනය කරනු ලැබීය. මේ අවස්ථා දෙකේදීම වෙඩි තැබීම සිදුවූයේ දුර සිට නොව ආසන්නයේ සිට ය. තවද ඒවාට ගොදුරු වූවෝ තමන්ට වෙඩි තැබූ සොල්දාදුවන්ට කිසිදු ආකාරයක තර්ජනයක් විදහා දැක්වූ අය නොවූහ. මේ හා සමානව, පොලීසියට පහර දීමට උත්සාහ කළා යැයි කියමින් පොලිස් භාරයේ සිටියදී වින්දිතයන් ඝාතනය කිරීමේ සිද්ධිවලදී ද පොලීසිය කියන කතාව ස්වාධීන සාක්ෂිවලින් තහවුරු කර ගැනීමට හැකි වූ එක් සිද්ධියක් හෝ හමු නොවේ. එම පුද්ගලයන්ව වෙඩි තබා මැරීම සඳහා පොලීසිය දක්වන කැමැත්ත ද මෙවැනි සිද්ධිවලදී විද්‍යමාන වේ.

**"**

**මිනිසුන් වෙනත් සත්ව විශේෂ මෙන්ම**
**තමන්ගේ විශේෂයේ අය ව මරාදැමීමට**
**පැකිළීම යන මූලික විශ්වාසය ට**
**එරෙහිව යන ක්‍රියාවන්ට මගපෙන්වන**
**මෙබඳු මානසික තත්වයන් නිර්මාණය**
**කිරීමට හේතුවූ සත්‍ය ආශ්‍රිත කරුණු,**
**අධිකරණ විමර්ශනය සඳහා**
**කිසිදිනෙක විෂය වී නැත.**

**"**

මිනිසුන් වෙනත් සත්ව විශේෂ මෙන්ම තමන්ගේ විශේෂයේ අය ව මරාදැමීමට පැකිළීම යන මූලික විශ්වාසය ට එරෙහිව යන ක්‍රියාවන්ට මගපෙන්වන මෙබඳු මානසික තත්වයන් නිර්මාණය කිරීමට හේතුවූ සත්‍ය ආශ්‍රිත කරුණු, අධිකරණ විමර්ශනය සඳහා කිසිදිනෙක විෂය වී නැත. මෑත භාගයේ දැකගත හැකි වූ පරිදි, බොහෝ මහේස්ත්‍රාත් පරීක්ෂණවලදී සිද්ධිවලට අදාළ පොලිස් අනුවාද එසේම පිළිගත් අතර මරණ පිළිබඳ සැබෑ විමර්ශයනයක් සිදුකරනු නොලැබීය. වින්දිතයන්ගේ පවුල්වල අය ද බියපත් වූයේ, ඔවුන් පොලීසියේ හෝ වෙනත් ආරක්ෂක ඒජන්සිවල එකටෙක කිරීම් හෝ පළිගැනීම්වලට ගොදුරු බවට පත්විය හැකි නිසා ය. අපි උදාරහණයක් වශයෙන් නාලන්දා විද්‍යාලයේ මෙන්ම කොළඹ ක්‍රිකට් සමාජයේ ද ක්‍රිකට් ක්‍රීඩකයෙකු වූ සඳුන් ලසිත කුමාර විතාන ගේ සිද්ධිය ගනිමු. සිය පුතා ඝාතනය කර ඇතැයි චෝදනා නගන ඔහුගේ මවගේ ප්‍රකාශයට අනුව සඳුන්, නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන (වෙනත් මිනීමැරුම් නඩු නිසා මේ වන විට අත්අඩංගුවේ පසුවන) ට අයත් යම්කිසි දේපළක් බලාකියාගෙන සිටි අයෙකි. මෙම දේපළ, වාර්ගික ප්‍රචණ්ඩත්වය හේතුවෙන් පළාගිය දමිළ පවුලටක අයත්ව තිබී බලයෙන් අත්පත් කර ගත්තක් වේ. සඳුන්ව අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔහුව බැලීමට ගිය ඔහුගේ මව පැවසුවේ, අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහුව ඝාතනය කිරීම එම දේපළ ගනුදෙනුවලට අදාළ සාක්ෂි මකාදැමීම සඳහා උත්සාහ කිරීමක් බවයි. පරීක්ෂණ පවත්වන්නැයි ඉල්ලීම් කර තිබියදී ද කිසිදු පරීක්ෂණයක් නොපැවැත්විණි.

සන්නද්ධ හමුදාව සහ පොලීසිය මෙම ඝාතන සිදුකිරීම සඳහා මෙවැනි ඉතා සැහැල්ලු සහ කලබල රහිත (easy going) ප්‍රවේශයක් ලබාගෙන තිබෙන්නේ කෙසේද යන ගැටලුව, සුදුසු පුද්ගලයන් ට පමණක් සිදුකළ හැකි මනෝවිද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයන්ට විෂය වන්නකි. අධිකරණ පරීක්ෂණ සිදුවූවත් ඒවායේ සාමාන්‍යයෙන් එවැනි අස්වාභාවික මානසිකත්වයන් නිර්මාණය වීම පරීක්ෂා කර බැලීමක් නැත.

තමන්ගේම අය ඝාතනය කිරීමට පැකිළීමේ සාමාන්‍ය මනුෂ්‍ය විශ්වාසය ට පටහැණි වන මෙවැනි සිදුවීම් වල බරපතළභාවය සලකා බලා පොලිස් සහ හමුදා බලකායන් තුළ මෙවැනි අධ්‍යයන සිදුකිරීම වහාම කළ යුත්තකි. මෙවන් ගැටලු අධ්‍යයනය නොකර අත්හැර දැමීම මගින් සිදුවන්නේ ඊටත් වඩා නරක ප්‍රතිඵල ඇතිවීම පමණි.

කෙසේ නමුත්, තමන් විසින්ම සිදුකර තිබෙන උල්ලංඝනයන් පිළිබඳ මෙවැනි අධ්‍යයනයන්ට ආණ්ඩුව ඉඩ දේය හෝ ආණ්ඩුව විසින් ඒවා දිරිමත් කරනු ඇත යන්න සිතිය නොහැකිය. එය සිදුවනු ඇත්තේ ඒ සඳහා මහජනයාගෙන් ඉල්ලීමක් තිබේ නම් සහ පීඩනයක් එල්ල වේ නම් සහ ඒවා අනතුරුව පොදු දැනුම සහ මහජන විවාදය වෙත මගපෙන්වන්නේ නම් පමණි.




ජනාධිපතිවරයා සහ රතුපස්වල වැලිවේරිය සිද්ධියේ නියෝජිතයන් අතර සිදුවූ සාකච්ඡා පුවත්පත් විසින් පළ කර තිබිණි. ඩිප්ඩ් ප්‍රඩක්ට්ස් පීඑල්සී සමාගමේ අනුබද්ධ ශාඛාවක් වන වෙනිග්‍රෝස් ලිමිටඩ් වර්තමානයේ පිහිටා ඇති ස්ථානයෙන් ඉවත් කර වෙනත් ස්ථානයක පිහිටුවීමට ඉඩ ඇතැයි ද සඳහන් විය. නමුත්, අඩු වශයෙන්

පුද්ගලයන් තුන් දෙනෙක් මරා දමා, තවත් බොහෝ ගණනකට සොල්දාදුවන් විසින් තුවාළ සිදුකිරීම පිළිබඳ ඒ වාර්තාවන්ගේ වචනයක් හෝ සඳහන් වූයේ නැත.



*නමුත්, අඩු වශයෙන් පුද්ගලයන් තුන් දෙනෙක් මරා දමා, තවත් බොහෝ ගණනකට සොල්දාදුවන් විසින් තුවාළ සිදුකිරීම පිළිබඳ ඒ වාර්තාවන්ගේ වචනයක් හෝ සඳහන් වූයේ නැත.*



ajapaksa also stated that any new factory that will be
a BOI zone to prevent these types of problems in the

der
the
ldy
to
the

**President Gives Solutions to Weliweriya Water Issue: Factory to be Relocated Despite Outcome of Report; New Factories Must Be Constructed in BOI Zones**

nts
resolve the problem. President Rajapaksa urged the
n hands if a problem arises in the future and requested
igh discussion.

aksa, Minister of Water Supply and Drainage Mr. Dinesh
Felix Perera, Secretary to the President Mr. Lalith

පැහැදිලිවම, අගතියට පත් පාර්ශවයේ නියෝජිතයන් සමග ජනාධිපතිවරයා පැවැත්වූ මේ වැදගත් රැස්වීමේදී සලකා බැලිය යුතුව තිබූ ප්‍රධානතම ගැටලුව වූයේ පුද්ගලයන් තුන් දෙනෙකු ඝාතනය කිරීමයි. වයස අවුරුදු 16 සහ 18 බැගින් වූ අකිල දිනේෂ් සහ රවිෂාන් පෙරේරා යන පිරිමි ළමුන් දෙදෙනා ඇතුළු මේ අහිංසක තැනැත්තන් තිදෙනාගේ මරණ ගැන ජනාධිපතිවරයා ද දුක්නොවී නම් එය අස්වාභාවික ය. එසේම, මේ මරණවලට බලපෑ ආශ්‍රිත කරුණු දැන් හොඳින් ප්‍රකට ය. අකිල දිනේෂ් සැබෑ උද්ඝෝෂණයෙන් සැලකිය යුතු දුරක සිටි අයෙක් වූ අතර තමන් හොඳින් දැන හඳුනන ගම් වැසියන් සහභාගි වී සිටි උද්ඝෝෂණය හුදෙක් කුතුහලය නිසාම නැරඹූ අයෙක් විය. රවිෂාන් පෙරේරා ඝාතනයට ලක්වන විට සිට ඇත්තේ වැඩ ඇරී නිවසට එන සිය මව ව කැඳවාගෙන ඒමට යමිනි. ඔවුන් මිය ගොස් තිබෙන්නේ වැරදීමකින් වෙඩි වැදීමක් නිසා නොවේ. රවිෂාන් පෙරේරා මියගොස් තිබුණේ හිසට වෙඩි තැබීම නිසා ය. එයින්, හිතාමතාම ළඟසිට වෙඩි තැබූ බව පෙනේ.

“ සමස්තයක් වශයෙන් ජනතාවගේ අගනා සැලකිල්ලකට යොමුවිය යුතු පැනය වන්නේ සටනකින් බාහිරව මේ සොල්දාදුවන් මරණ සිදුකළේ කෙසේ ද යන්නයි. බොහෝ වාර්තා සහ පර්යේෂණ මගින් හෙළිවන පරිදි, කිසිදු රටක සොල්දාදුවන්ට, සටනකදී පවා ලෙහෙසියෙන් ඝාතන සිදුකිරීමට හැකියාවක් නැත. පර්යේෂණවලින් පෙනී යන පරිදි, තීව්‍ර යුධමය තත්වයන්හිදී පවා නියත වශයෙන්ම සිතා මතා, මැරෙන සේ වෙඩිතබන්නන් හැරුණු විට ඝාතන සිදුකිරීමෙන් වැළකී සිටිති. ”

මේ ඝාතන සහ සෙසු තුවාළ සිදුකිරීම් පිළිබඳ ගැටලුව එම ප්‍රදේශයේ ජනතාව පමණක් නොව මුළු මහත් ජාතියේම අවධානය දිනාගත්තේය. ආරක්ෂක හමුදාව විසින් සිදුකළ එවැනි ඝාතන සහ තුවාළ සිදුකිරීම් නිසා වූ හානි, නියත වශයෙන්ම එවැනි ඝාතන සිදුවන ඕනෑම ජාතියක මූලික සැලකිල්ලට ලක්වන්නකි.

සොල්දාදුවෝ සහ සටන්කරුවෝ සටනේදී එකිනෙකාව මරාගනිති. කෙසේ නමුත්, වැලිවේරියේදී සිදුවූ දෙය, කිසිම ආකාරයකින් සටනකදී මරණ සිදුවීමක් ලෙසට සිතාගත නොහැකිය.

''දෙවන ලෝක යුද්ධයට පෙර හැම විටම පිළිගත්තේ සාමාන්‍ය සොල්දාදුවෙක් සටනේදී ඝාතන සිදුකරන්නේ හුදෙක්ම ඔහුගේ රට සහ ඔහුගේ නායකයන් එසේ කරන ලෙස කියා ඇති නිසා සහ තමාගේත් සිය මිතුරන්ගේත් ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා එසේ කිරීම අත්‍යවශ්‍ය වන නිසා බවයි. ඔහු එසේ ඝාතන සිදුකර නැතිනම්, එයට හේතුව ඔහු සන්ත්‍රාසයට පත්වීම සහ පළායාම යැයි උපකල්පනය කෙරිණි.

දෙවන ලෝක යුධ සමයේදී ඇමරිකා එක්සත් ජනපද හමුදා බ්‍රිගේඩියර් එස්.එල්.ඒ. මාෂල්, මෙකී සාමාන්‍ය සොල්දාදුවන්ගෙන් ඔවුන් යුධ පිටියේදී කුමක් කළේදැයි විමසීය. ඔහුට සොයාගත හැකි වූ අනපේක්ෂිත ඒකායන කරුණ වූයේ, ආක්‍රමණයක් සිදුවන අවස්ථාවේදී යුධ පෙරමුණේ සිටි සෑම සොල්දාදුවන් සිය දෙනෙක් අතරින් 15 හෝ 20 දෙනෙක් පමණක් 'සිය ආයුධවලින් ඒ සඳහා සහභාගි වූ බව' යි. 'හමුදා ක්‍රියාන්විතය දිනක්, දෙදිනක් හෝ තුනක් පැවතියද' එම තත්වය නිරන්තරයෙන්ම එසේ විය.''

සමස්තයක් වශයෙන් ජනතාවගේ අගනා සැලකිල්ලකට යොමුවිය යුතු පැනය වන්නේ සටනකින් බාහිරව මේ සොල්දාදුවන් මරණ සිදුකළේ කෙසේ ද යන්නයි. බොහෝ වාර්තා සහ පර්යේෂණ මගින් හෙළිවන පරිදි, කිසිදු රටක සොල්දාදුවන් ට, සටනකදී පවා ලෙහෙසියෙන් ඝාතන සිදුකිරීමට හැකියාවක් නැත. පර්යේෂණවලින් පෙනී යන පරිදි, තීව්‍ර යුධමය තත්වයන්හිදී පවා නියත වශයෙන්ම සිතා මතා, මැරෙන සේ වෙඩිතබන්නන් හැරුණු විට ඝාතන සිදුකිරීමෙන් වැළකී සිටිති.



## යුද්ධයේදී හා සමාජයේදී ඝාතනය කිරීමට උගැනීමේ මනෝවිද්‍යාත්මක මිල

කෙසේ නමුත් පසුගියදා රතුපස්වල, වැලිවේරිය සහ සෙසු මහා පරිමාණ ඝාතන සිදුවූ අවස්ථාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අපට තිබෙන ගැටලුව වන්නේ එවැනි ඝාතනයන් සටන්කාරී තත්වයකට පිටින් සිදුවීම ය. මේ ගැටලුව දෙස කුමන ආකාරයෙන් බලන ඕනෑම අයෙකු දැකිය යුතු ගැටලුව මෙයයි. උදාරණයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම මේ සිදුවීම සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමට නියමිත ය. එහිදී කොමිසම සෙසු සියලු ප්‍රශ්න පරයා, යුධමය තත්වයට පිටින් සොල්දාදුවන් මේ ඝාතන සිදුකළේ කෙසේද යන ප්‍රශ්නය නැගිය යුතුය. පැහැදිලි ලෙසම ජනාධිපතිවරයා තමන්ගෙන්ම මේ ප්‍රශ්නය අසාගෙන තිබිය යුතුය. රටක සොල්දාදුවන් යුද්ධයකට පිටින් මෙබඳු ඝාතනවලට සම්බන්ධ වන විට ඕනෑම වගකිව යුතු රාජ්‍ය තාන්ත්‍රිකයෙක් ඒ පිළිබඳ බරපතළ ලෙස අපහසුතාවයට පත්විය යුතුය.

සියල්ලටම වඩා චිත්ත වික්ෂේපය දනවන තත්වය වන්නේ මහජනයාට මේ දක්වා ලැබී තිබෙන තොරතුරුවලින් පැහැදිලිවම පෙන්වා දෙන්නේ සොල්දාදුවන් හදිසි චිත්ත කැළඹීමක් මත ක්‍රියා

කළා නොව මනා ලෙස සිතා සැකසූ සැලසුමක් අනුව ක්‍රියා කළ බවයි. සොල්දාදුවන් පැමිණි පසු ඔවුන් විසින් පළමුවෙන්ම කළ එක් දෙයක් වූයේ, වීදි පහන්වලට වෙඩි තබා ඉන්පසු ප්‍රදේශයේ විදුලි බලය විසන්ධි කිරීමයි. අසල පිහිටි දේවස්ථානයට පහර එල්ල වූ බව සිතන්නේද ජෙනරේටර මාර්ගයෙන් පල්ලියේ විදුලි පහන් දල්වා තිබූ හෙයිනි.

**මෙම සොල්දාදුවන්ට සිය ක්‍රියාවන් අන්ධකාරයේ කරගෙන යාමට අවශ්‍ය වූයේ හේතු දෙකක් නිසා විය හැකිය. එක් නිසැක හේතුවක් වන්නේ, ඔවුන්ට තමන් කරන දේවල් සෙස්සන් විසින් දැකීමට අවශ්‍ය නොවීමයි. තවද ඔවුන් කවුදැයි හඳුනාගැනීමට අවශ්‍ය නොවීමයි.** මේ දිනවල ජංගම දුරකථනවලින් සහ පොකට් කැමරාවලින් ඡායාරූප ගැනීම ඉතා පහසු කටයුත්තක් වන හෙයින් තමන් ඡායාරූපවලට හසුනොවීමට ද ඔවුන්ට අනිවාර්යයෙන්ම අවශ්‍ය විය. ජනමාධ්‍යවේදීන් හා කැමරා ශිල්පීන් ට ප්‍රහාර එල්ල වූ බවටද වාර්තා තිබේ.

**කෙසේ නමුත්, ඔවුන් අන්ධකාරයට වඩාත් කැමති වූයේ මන්ද යන්න පිළිබඳ වැඩිදුර හේතු ද ඇත. එය එසේ සිදුවූයේ, ඔවුන්ට සිය ගොදුරු බවට පත්වන පුද්ගලයන්ගේ මුහුණු සහ හැඟීම් නොපෙනීම පිණිස විය හැක. ඝාතන හෝ සෙසු ප්‍රචණ්ඩ ස්වභාවයේ ක්‍රියාවන්හිදී වින්දිතයාගේ මුහුණ දැකීම බාධකයක් සේ ක්‍රියා කරයි.**

පිරිස විසුරුවා හැරීමේ කාර්යය පොලීසියෙන් ඉවත් කර සොල්දාදුවන්ගේ අතට ගැනීම යන කරුණ ද මෙහිදී ඉස්මතු වේ. මෙයින් පැහැදිලිවම පෙනී යන්නේ, පිරිස් විසුරුවා හැරීම යන බොරු හේතුව යටතේ හිතාමතාම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදුකිරීමට සැලසුම් කිරීමයි.

මෙවැනි දෙයක් සිදුකළේ පොලීසිය විසින් නම්, එහිදී ඔවුන් ට තමන් විසින් අනුගමනය කළ යුතු නීති රීති තිබෙන අතර ඔවුන්ට නියෝග කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ද සිටිති. එය පොලීසියේ දෑත්වලින් ඉවත් කර ගැනීම මගින්, සොල්දාදුවන් එතැනට යැවූ අය, එහි පාලනය සියතට ගත් අතර ඔවුන්ට එය තමන්ගේ ක්‍රමයට සිදුකිරීමට අවශ්‍ය විය.

මේ අනුව යුධමය තත්වයකට පිටතින් ඝාතන සිදුකිරීමේ ගැටලුවේදී එසේ සිදුකළ සොල්දාදුවන් කවුද යන්න සම්බන්ධයෙන් පමණක් නොව, ඔවුන්ව මෙහෙයවූයේ කවුරුන් විසින්ද යන ගැටලුව ද මතුවෙයි. එම මෙහෙයවීම සිදුකළවුන්ගේ අරමුණ වූයේ ඝාතන සහ වෙනත් ආකාරවල තුවාල සිදුකිරීමයි.

**ප්‍රධාන අණදෙන නිලධාරියා තමන්ගෙන් අසාගත යුතුව තිබෙන ප්‍රශ්නය, තමන්ගේ නියෝගය යටතේ මෙවැනි දෙයක් සිදුවූයේ කෙසේද යන්නයි.**

කෙසේ නමුත්, වැලිවේරිය රතුපස්වලදී සිදුවූ දෙයට පිළිතුරක් ජනතාවට ලැබෙන්නට නම් මේ ගැටලු වලට පිළිතුරු සෙවීම අත්‍යවශ්‍ය වේ. කර්මාන්ත ශාලාව වෙනත් තැනක පිහිටුවීමට වඩා මේ ගැටලුවට පිළිතුරු සෙවීම අගනේ ය.



## ලංකාවේ පොලිස් වධ හිංසාව ගැන ලක්ෂ්මන් හුළුගල්ලේගේ අලුත්ම සොයාගැනීම

# අහලත් නැත - දැකලත් නැත...???

Narative of Justice in Sri Lanka හෙවත් පොලිස් වධ හිංසා වින්දිතයන්ගේ සාක්ෂි ප්‍රකාශ 400 අඩංගු පොත පිළිබඳ බීබීසී සන්දේශය විසින් විශේෂ වැඩසටහනක් විකාශය කරන ලදී. එහිදී සෑම පාර්ශවයකින්ම කරුණු විමසීමක් කෙරිණි. සාමාන්‍යයෙන් නිතර සිදුවන පරිදි මෙහිදී සමහර අදාළ වගකිවයුත්තෝ ‘මෙහෙම දේවල් අහලත් නෑ.. දැකලත් නෑ..” යැයි කියූහ. පහත දැක්වෙන ලිපිය සැකසෙන්නේ එම වැඩසටහනේ අන්තර්ගතයේ ගලායාම ඇසුරෙනි.

*“අත්දෙකටයි කකුල් දෙකටයි දම්වැල් දාල ගැටගැහුවා මාංචු දාලා.. ඊට පස්සෙ වෘෂණකෝෂ එළියට අරගෙන කොට කෑල්ලක් දාල තැලුවා..”*

‘‘අනෙක් මහත්තයා මගෙ ධනපොල් කටු දෙකට අඩිය තියන් හිටියා... ඒ වෙලාවෙ අපරාධ විමර්ශනයෙ ලොකු මහත්තයා තව තවත් මගෙ ඇස්වලට මිරිස් දානගමන් තමයි, හිටියෙ..”

‘‘මගෙ ඇස්දෙකට කොච්චි දැම්මා..”

ශ්‍රී ලංකාවේ පොලීසිය විසින් වධ හිංසා පැමිණවීමට ලක්වූ පුද්ගලයන්ගේ සාක්ෂි හාරසියයක් අඩංගු පොතක් අද නිකුත් කෙරුණා. මේ සාක්ෂි 400 ගොනු කළේ ආසියානු මානව හිමිකම් කොමිසමයි.

**‘‘අපි ඔය පොතේ නම හැටියට දැම්මෙ ලංකාවෙ පවතින යුක්තිය පසිඳලීමේ ක්‍රමය, වධ හිංසාවට පාත්‍රවූ අයගේ කතා තුළින් කියනවා කියන තේරුම ඇතිවයි... අපි මෙහිදී මූලික වශයෙන් කියන්න උත්සාහ කරන්නෙ ලංකාවෙ අපරාධ නීතිය ක්‍රියාත්මක වීම ඇණහිටීමට විශාල සාධකයක් කියලා, අපරාධ පරීක්ෂන වධහිංසා මාර්ගයෙන් කිරීම.”**

ආසියානු මානව හිමිකම් කොමිසමේ බැසිල් ප්‍රනාන්දු එසේ කීවත් ආරක්ෂක කටයුතු පිළිබඳ රජයේ ප්‍රකාශක ලක්ෂ්මන් හුළුගල්ලේ පවසනේනේ ශ්‍රී ලංකාවේ නම් මෙවැනි දේ කිසිදිනෙක සිදුනොවූ බවයි.

‘‘මම ශ්‍රී ලංකාවෙ ජීවත් වන පුරවැසියෙක් හැටියට මට කියන්න තියෙන්නේ, **එවැනි සිද්ධි ලංකාවෙ නම් අපි අහලත් නෑ.. දැකලත් නෑ...** අනෙක එවැනි ක්‍රියා අද සිදුවෙනව නම් ලංකාවෙ පවතින ප්‍රජාතන්ත්‍රවාදී මාධ්‍ය නිදහසත් එක්ක එවැනි සිද්ධි ලංකාවෙ වාර්තා වෙන්න ඕනෙ පිටරටක වාර්තා වෙන්න ඉස්සරවෙලා. ඉතින් විදේශීය පුද්ගලයන් හරි ලංකාවට නෑවිදින් හරි ඒ වගේ ප්‍රකාශයක් කිරීම ගැන ඉතාම කණගාටු වෙනවා.. මේ ගැන රජයේ නිල ප්‍රකාශකයා හැටියට මම ඒක ප්‍රතික්ෂේප කරනවා... ඒ ආයතනය කියන හැටියට සිද්ධියකට හෝ දෙකකට නෙවෙයි. නමුත් සිද්ධි 400 ක් වගේ ප්‍රමාණයකට පොලීසිය සම්බන්ධ වෙලා තිබෙනවා නම් මේ රට තුළ මීට වඩා උද්ඝෝෂණයක් එහෙම නැතිනම් ජනතා විරෝධයක් ඇති වෙන්න ඕනෙ..’’

- **ලක්ෂ්මන් හුළුගල්ලේ** - ආරක්ෂක කටයුතු පිළිබඳ රජයේ ප්‍රකාශක



‘‘පසුගිය අවුරුදු දොළහක දහතුනක විතර කාලෙදි අපි පරීක්ෂණ කරලා, ඒ ගැන ආණ්ඩුවට ලියලා, ඒ නඩුවලට ඒ මිනිස්සුන්ට උදව් කරලා ඒ විශාල සිද්ධි සංඛ්‍යාව අතරින් තමයි අපි 400 ක් තෝරගෙන තියෙන්නෙ.... ඒ කියන්නෙ අපිට කිසිම සැකයක් නැතිව සාක්ෂි තිබුණු නඩුවලින්..’’ යැයි **බැසිල් ප්‍රනාන්දු** මහතා පැවසීය.

**හිටපු උපපොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු**, මානව හිමිකම් කටයුතු පිළිබඳ විශේෂ උනන්දුවක් දැක්වූ නිලධාරියෙක්. මේ ඔහුගේ අදහස්.

‘‘නමුත් ප්‍රශ්නෙ තියෙන්නෙ, මේ කරල තියෙන පැමිණිලි සියල්ලක්ම සත්‍යද කියන එකයි.. අන්න එතැනදි අපි පර්යේෂණ කරනවා නම් ජනතාවට යම්කිසි මතයක් දෙනව නම් මං හිතන්නෙ සාධාරණ මතයක් දිය යුතුයි, නැතිනම් එක පැත්තකට පමණක්ම ඒ කියන්නෙ පොලිසිය මේ තරම් දූෂිතයි, පොලිසියට කෙනෙක් අල්ලගෙන ගියොත් ඒ තැනැත්තට ගහනවමයි කියන පැත්ත සම්බන්ධයෙන්.. ඒ නිසා මම හිතන විදිහට සමබර විදිහට මේක බලන්න ඕනෙ..

දශක තුනකට අධික කාලයක් පොලිසියේ සේවය කළ **නියෝජ්‍ය පොලිස්පති අගුණාගොඩ** පවසන්නේ පොලීසිය තුළ සිදුවන අපරාධවලට හේතුව පාලනයේ දුර්වලත්වය බවයි.

**‘‘මේ රටේ ප්‍රථමයෙන්ම මාධ්‍යවේදීන්ට එල්ල වූ ප්‍රහාරයත් සමගම පොලිස් නිලධාරීන් සහ උසස් පොලිස් නිලධාරීන් ගේ මානසික ආකල්පය සම්පූර්ණයෙන්ම වෙනස් වුණා. ඊට පස්සෙ උසස් නිලධාරීන් සහ සුළු නිලධාරීන් ඒ වගේ කටයුතුවලට උදව් කරන්නත් එමෙන්ම ඔවුන් පොලීසිය අතින් යම් මානව හිමිකම් කඩවුණා නම් ඒ අය බේරාගන්නත් පාලක අංශයේ අය ඉදිරිපත් වුණා. ඒක මම බය නැතිව ප්‍රකාශ කරනවා..**

‘‘ගිනි අවි පාවිච්චි කරලා මන්ත්‍රීවරුන් දෙදෙනෙක් වෙඩි තියාගත් බවට කතාවක් දැන් අවුරුදු දෙකක් තිස්සෙ යනවා.. ඒ අවුරුදු දෙකක් තිස්සෙ යම් කෙනෙක් පිටරට ඉඳලා වෛද්‍ය ප්‍රතිකාර රැගෙන ලංකාවට ඇවිල්ලා මාස දෙකෙන්, ඔහුට විරුද්ධව සුදුසු සාක්ෂි නැහැ, ප්‍රමාණවත් සාක්ෂි නැහැ කියල ප්‍රකාශයක් කරනවා.. එතකොට අපේ පොලිස් නිලධාරීන් එතැන් පටන් වැරදි කරන්න බය වෙයිද....‘‘වධ හිංසා කෙරුවත් ලොකු තැනකට කතා කළොත් ඒගොල්ලන්ට බේරෙන්න පුළුවන් කියලා ඒ ගොල්ල දන්නවා.. මොකද සාමාන්‍යයෙන් ඒ

ගොල්ල මේව කරන්නෙ යම් කිසි උඩින් එන බලපෑමක් නිසයි.. නැත්නම් බය නැතිව ඒ වගේ දේවල් කරයිද..? ඒ වගේ දේවල් කරයිද..?''

**- නි.පොලිස්පති අගුණාගොඩ**

පොලීසිය ට එරෙහි මෙවැනි පැමිණිලි කොපමණ තිබුණත් පොලීසියට එරෙහිව මෙවැනි පැමිණිලි කරන පුද්ගලයන්ට වධ හිංසා සහ තර්ජන ගර්ජන එල්ල වන බවද ආසියානු මානව හිමිකම් කොමිසම ප්‍රකාශ කරනවා.

''අධිකරණයට ගෙන ඒම සිද්ධවෙලා තියෙනවා නඩු ගණනාවක..නමුත් අවසාන වශයෙන් දඬුවම් දීමක් කියන එකක් සිද්ධ වෙලා තිබෙන්නේ පස් වතාවක විතරයි... ඒක සිද්ධවෙලා තියෙන්නෙත් අවුරුදු 10, 12, 8 වගේ කාලවල් ගිහිල්ලා.. - **බැසිල් ප්‍රනාන්දු**

https://www.youtube.com/watch?v=x1qJxyZsv1E&feature=youtu.be ඔස්සේ මේ වැඩසටහනට ඔබටද සවන් දිය හැක.



# අපේ ඝාතක භාරකාරයෝ

CID ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙක්
මිනිසෙක් මරා
මළ මිනිය මුහුදට දැමීම ගැන
සැකකරු වේ.

කොපමණ මළ මිනී ද?
කොපමණ වාරයක්ද?
කවුරු කවදා දැනගනීවිද?

පුරවැසියන් රකින්නට
ඉන්නේ කවුරුද?
රැකවලුන් මිනී මරණ විට.

පුදුමයක් නැත ජාතියට අවැසි ය
සිය ජීවිත කාලය සඳහාම වන විධායක ජනපතිවරයෙක්
රැකවලුන්ට මිනී මරන්නට ඉඩ දෙන.

- **හඬනු මැන දේශය - බැසිල් ප්‍රනාන්දු කාව්‍ය සංග්‍රහය (2013) - පිටුව 75**



# නීතියේ ආධිපත්‍යය බිඳ වැටුණු දා

- බැසිල් ප්‍රනාන්දු විසිනි.


1983 ජූලි 23 දා සිදුවූ දෙය, ඉතිහාසයේ එක් තනි දවසක සිදුවීම් සමුදායක් නොවේ. එදවස බලපෑම තවමත් ජීවමාන අතර ගෙවී යන සෑම දිනයකදීම රටේ නීතියේ ආධිපත්‍යය තව තවත් නරකම අතට හැරෙයි.

නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදායේ සම්ප්‍රදායයන්ට අභියෝග කරන සිදුවීම් ගණනාවක් එදා පටන්ම පැතිර තිබිණි. හිටපු අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය ට සහ ඇගේ සමීප ක්‍රියාකාරීන්ට විරුද්ධව ගෙන ආ නඩු තිබිණි. රටේ ප්‍රකටම බුද්ධිමතෙකු වූ නැසී ගිය ආචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර හට පහරදීම ඇතුළත්ව විරුද්ධ පාක්ෂික දේශපාලන රැස්වීම්වලට නිරන්තරයෙන් එල්ල වූ ප්‍රහාර විය. ඉන්පසු 1980 මහා දීප ව්‍යාප්ත වැඩවර්ජනයට සහභාගි වූ සියලු සේවකයන් අවසාන වශයෙන් රැකියාවලින් පහ කර දමමින් වෘත්තීය සමිති ව්‍යාපාරය වෙත නිරන්තරයෙන් ප්‍රහාර එල්ල විය. පුවත්පත් නිදහස වෙත දිගින් දිගටම නිර්දය ප්‍රහාර එල්ල කෙරුණේය. ඉන්පසු මහමැතිවරණය වළක්වාළමින් 1977 දී තේරී පත්වූ පාර්ලිමේන්තු සාමාජිකයන්ට තවත් සය වසරක් බලයේ රැඳී සිටින්නට ඉඩ දෙමින් 1982 වසරේ ජනමත විචාරණයක් විය.

මේ සියල්ල සහ ජේ.ආර්. ජයවර්ධනගේ රෙජීමයේ පාර්ශවයෙන් වූ තවත් බොහෝ ක්‍රියාවන් විසින් ප්‍රජාතන්ත්‍රවාදයේ සහ නීතියේ ආධිපත්‍යයේ පදනම් සසල කරනු ලැබීය







කෙසේ නමුත් පැරණි සම්ප්‍රදායන් ලෙහෙසියෙන් නොමැරෙයි. නීතියේ සහ ප්‍රජාතන්ත්‍රවාදයේ පැරණි රාමුව තවමත් වලංගු බව මිනිස්සු එවිටද විශ්වාස කළහ. එනිසා ජේ.ආර්. ජයවර්ධනගේ ක්‍රමයට එරෙහිව ප්‍රබල ප්‍රතිරෝධයක් විය.

උතුරේ සොල්දාදුවන් 13 දෙනෙකු එක සිට මරාදමා ඇති බවට ප්‍රවෘත්තිය ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ කන වැටුණු විට ඔහු එය දුටුවේ 'සිය ක්‍රමය තවත් ශක්තිමත් කළ හැකි තවත් කදිම අවස්ථාවක්' ලෙස ය. අවමංගල්‍යයන් කොළඹ පවත්වන ලෙස කළ ඉල්ලීම කෝලාහල සඳහා ඇරයුමක් විය. ඔහු එය දැන සිටියේය. ඔහුගේ අගමැති ආර්. ප්‍රේමදාස එවකට කොළඹ පුරපති සිරිසේන කුරේ සමග ජයවර්ධන හමුවීමට ගොස්, අවමංගල්‍ය උත්සව කොළඹ පැවැත්වුවහොත් රට පුරා කෝලාහල හටගනු ඇතැයි අනතුරු අඟවා තිබුණේය. ඔවුන්ගේ ඉල්ලීම වූයේ ජනාධිපතිවරයා වශයෙන් එය වළක්වාගැනීමට පියවර ගන්නා ලෙසයි. මේ සඳහා ජනාධිපතිවරයා එකඟ වූයේ යැයි සිරිසේන කුරේ පැවසුවේය. කෙසේ වෙතත් ජනාධිපති ජයවර්ධන කිසිදාක තමන්ගේ වචනය රකින ජාතියේ මිනිහෙකු නොවේ. ඔහු අවමංගල්‍යයන් කොළඹ පැවැත්වීමට ඉඩ හළ අතර කලින් කී ලෙසටම කෝලාහල හට ගත්තේය. නමුත් එම කෝලාහල පැතිරෙන දුර පුරෝකථනය කිරීමට කිසිවෙක් සමත් නොවූහ. එදා වූ දෙය ශ්‍රී ලංකාවේ නැවත කිසිදා සිදු නොවිය යුතුය. සමහරවිට, එදා සිදුවූ දෙයට යෙදිය හැකි උපමාව ඇමරිකා එක්සත් ජනපදයේ ද්විත්ව කුලුනට එල්ල වූ ප්‍රහාරයයි.

මේ කෝලාහලය ඕපපාතික හෝ නිරායාස සිද්ධියක් නොවේ. රාජ්‍යයේ ප්‍රධානියාම සිය රට තුළ කෝලාහලයක් හටගැනීමෙහිලා ප්‍රධාන භූමිකාවක් ඉටු කළේය. රාජ්‍ය නායකයාගේ භූමිකාව සාමය පවත්වාගැනීම ය යන්නට මෙය අතිශයින්ම ප්‍රතිවිරුද්ධ වේ. අසාමාන්‍ය ආකාරයේ තර්ජනයක් තිබෙන විට සාමය ඇති කිරීම සඳහා ගත හැකි ඕනෑම ආකාරයක පියවරක් ගැනීම ඔහුගේ කාර්යයයි. නමුත් මේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා කළේ ගිනි දලුවලට සුළං පිඹීමයි.



මේ කෝලාහලය ඕපපාතික හෝ නිරායාස සිද්ධියක් නොවේ. රාජ්‍යයේ ප්‍රධානියාම සිය රට තුළ කෝලාහලයක් හටගැනීමෙහිලා ප්‍රධාන භූමිකාවක් ඉටු කළේය. රාජ්‍ය නායකයාගේ භූමිකාව සාමය පවත්වාගැනීම ය යන්නට මෙය අතිශයින්ම ප්‍රතිවිරුද්ධ වේ. අසාමාන්‍ය ආකාරයේ තර්ජනයක් තිබෙන විට සාමය ඇති කිරීම සඳහා ගත හැකි ඕනෑම ආකාරයක පියවරක් ගැනීම ඔහුගේ කාර්යයයි. නමුත් මේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා කළේ ගිනි දළුවලට සුළං පිඹීමයි.



ඒ හැරුණු විට අද මෙන්ම එදත් පොලීසියේ සහ හමුදාවේ රාජකාරිය වූයේ ඕනෑම ආකාරයක සාමය කඩකරන ක්‍රියාවක් නතර කිරීමයි. නමුත් මේ අවස්ථාවේ කෝලාහලවලට මුලපිරුවේ හමුදාවයි. භීෂණය පතුරුවාලීම සඳහා හමුදාව කොතරම් දුරකට දායක වීදැයි පසුව සිදුකළ විමර්ශනවලින් හෙළිදරව් විය. අනෙක් අත බලාගන්නා ලෙසට කෙරුණු ඉල්ලීම්වලට පොලීසිය එකඟ වූ අතර ගිනි නිවීමට කිසිදු පියවරක් ගත්තේ නැත. ද්‍රවිඩ ව්‍යාපාරික ස්ථාන, නිවාස සහ දමිල ජාතිකයන් වෙත එල්ල වූ ප්‍රහාර ස්වභාවිකවම පැතිර ගියේය. ඇත්ත වශයෙන්ම කියන්නේ නම් ලැව් ගින්නක් මෙන් පැතිර ගියේය. අගනුවරින් නැගෙන දුම, ගෙවල් පුලුස්සන ආකාරය සහ තුවාළ ලැබුවන්ගේ පින්තූර ලොවම දුටුවහ.



ඉතා හොඳින් ලේඛනගත වී තිබෙන මෙන්ම ඒ සිදුවීම් අත්දැකීමට තරම් අවසානාවන්ත වූවන්ගේ මතකයේද රැඳී තිබෙන එදවස භීෂණයේ සවිස්තරාත්මක තොරතුරු වෙත නැවත වරක් පිවිසීම අත්‍යවශ්‍ය නොවේ. එදවස සිදුවූ දෙය මගින් නීතියේ ආධිපත්‍යයට සිදුවූ බලපෑම තක්සේරු කිරීමේදී අත්‍යවශ්‍ය වන්නේ මේ ප්‍රචණ්ඩත්වයට මුල පිරුණේ රාජ්‍ය නායකයාගේ ආශිර්වාදය සහ හමුදාවේ සහභාගිත්වය සමගය යන්න සහ හමුදාවේ අකර්මණ්‍ය බව මගින් කැරැල්ලට ලැබුණු සහයෝගයයි. මේ හැරුණු විට ව්‍යාපාරික ස්ථාන, නිවාස සහ දමිල ජාතිකයන්ට ප්‍රහාර එල්ල කිරීම සඳහා පාලක පක්ෂය ක්‍රියාකාරීව සහාය දැක්වූහ. මේ අනුව මෙය, පාලක රෙජීමය විසින් රජයේ නියෝජිතායතනවල පූර්ණ සහභාගිත්වය ඇතිව මුලපිරුණු කැරැල්ලක් බව මුළුමනින්ම සනාථ වෙයි. ශ්‍රී ලංකාව තුළ නීතියේ ආධිපත්‍යය ක්‍රමය නොනැසී පැවතීමේ හැකියාව පිළිබඳ විශ්වාසය අහිමිවීම තුළ ඇති වූ වගවීම සහතික කිරීම සඳහා ආණ්ඩුව විසින් යම්කිසි පියවරක් ගත්තේ මේ සියල්ල සිදුවීමෙන් පසුව ය. රාජ්‍යයේ ප්‍රධානියාම සහ හමුදාව කෝලාහලය හටගැනීම සඳහාත් ඉන් අනතුරුව හටගත් භීෂණය සඳහාත් බරපතළ ලෙස සම්බන්ධ වී සිටි සිටියදී ඇත්ත වශයෙන්ම වගවීම යනු කළ හැකි දෙයක් නොවේ.

එදා පටන් කිසිම ආණ්ඩුවක්, එසේ බිඳ වැටුණු නීතියේ ආධිපත්‍යය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා කිසිදු අර්ථාන්විත පියවරක් ගත්තේ නැත. රටේ අධිකරණය පවා, ඔවුන්ගේ ස්වයං නීත්‍යානුකූලභාවය සහ සිය හැකියාව මත පදනම්ව සිය පැවැත්ම අභියෝගයට ලක්වූ විට එය රැකගැනීමට උත්සාහ ගත්තා මිස රටේ නීතියේ ආධිපත්‍යය සුරක්ෂණය කිරීම සඳහා කිසිදු තීරණාත්මක මැදිහත්වීමක් සිදුකළේ නැත.

"

එදා පටන් කිසිම ආණ්ඩුවක්, එසේ බිඳ
වැටුණු නීතියේ ආධිපත්‍යය
ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා කිසිදු
අර්ථාන්විත පියවරක් ගත්තේ නැත.
රටේ අධිකරණය පවා, ඔවුන්ගේ ස්වයං
නීත්‍යානුකූලභාවය සහ සිය හැකියාව
මත පදනම්ව සිය පැවැත්ම
අභියෝගයට ලක්වූ විට එය
රැකගැනීමට උත්සාහ ගත්තා මිස රටේ
නීතියේ ආධිපත්‍යය සුරක්ෂණය කිරීම
සඳහා කිසිදු තීරණාත්මක
මැදිහත්වීමක් සිදුකළේ නැත.

"

එයින් පසු හටගත් සියලු සිදුවීම්වලින්, බලාපොරොත්තු විය යුතු ලෙසටම තත්වය තවත් නරක අතට හැරුණේය. නීතියේ ආධිපත්‍යය බිඳවැටී ඇති බව සමාලෝචනයට ලක් කරමින් ගත් එකම ක්‍රියාමාර්ගය ලෙස සැලකිය හැක්කේ කලාතුරකින් සිදුවන පරිදි පාර්ලිමේන්තුවේ බහුතර අනුමැතියෙන් යුතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 17 වැනි සංශෝධනය පමණක් විය හැකිය. කෙසේ නමුත්, මේ පරිශ්‍රමය ද බොහෝ ක්‍රමවලත් වැළැක්වුණු අතර අවසානයේ 18 වැනි සංශෝධනය සම්මත වීමත් සමග යහපත වෙනුවෙන් වෙනස් කිරීමට තිබූ ඉඩකඩ පවා එයින් අවසන් විය. මේ අනුව, නීතියේ ආධිපත්‍යය සපුරාම අවතැන් කිරීමක් වූ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රමය පවත්වාගැනීමේ අවශ්‍යතාවය මුදුන්පත් විය. විධායක ජනාධිපතිවරයා කවුරුන් වුවත්, තමන්ට එරෙහිව නැගී සිටින ඕනෑම නීතියකට එරෙහිව කිසිදු බියකින් තොරව අවස්ථාවාදී වීමේ වාසිය ලබාගැනීමට ඔහුට පුළුවන. 1983 ජූලියේ සිදුවීම් පෙළ අතර එදා ලියැවුණු මේ කවි පෙළ නැවත ඉදිරිපත් කිරීම අනුචිත නොවේ යැයි මම සිතමි.

## ධර්මිෂ්ඨ සමාජය

ඔබ ගොඩනැගිලි පුළුස්සා
මා දඟගෙයි ලෑවා.
ළදරුවන් ගින්නට විසි කර
මට අමනුස්සයා කිව්වා.

ඔබ මහ දවාලේ මිනී මරා
ලේ පිපාසයෙන් යැයි
මට දොස් කිව්වා.

ඔබ මගේ අසල්වැසියා
සරණාගතයෙක් කළා.
ඒ ගැන මට වගකියපන් යැයි
ඉනික්බිති කිව්වා.

දුක් මහන්සියෙන් හරි හම්බ කළ ඔහුගේ දේපළ
ඔබ කොල්ල කෑවා.
මට හොරා කිව්වා.

ඔබ ඔහුව සිර කර මරා දැමුවා.
මට තිරිසනා කිව්වා.

ඔබ මැරයන් සමග මිතුරු වුණා
මම ඔවුන්ගේ ගොදුර වුණා
නමුත් ඔබ මා චූදිතයා කළා.

මගේ පාසල් සගයා,
මගේ අසල්වැසියා, මගේ මිතුරා,
මගේ ගුරුතුමා සහ රැකියාවේ සගයා
සැහැසි ජනයාගෙන් බේරෙන්නට පළා යනවිට,
සැඟවුණු විට, මැරුණු විට,
මමයි වැළපුණු කෙනා.

හිස් අතින් ඔහු
වෙනත් රටකට නැව් නගින විට
යන්න එපා යැයි කියමින්,
ඔහුගේ අත අල්ලාගෙන
මමයි වැළපුණු කෙනා..
දැන් මමලු මේ නින්දාවට වගකිවයුතු

අහිංසකයාට වරද පටවන විට
නුඹ එයට සාමය කියනවා.

නුඹ වරදකරුවන් රකින විට
එයට චිරස්ථිතිය යැයි කියනවා.

නුඹ වාර්තා සඟවන විට
එයට අවංකකම යැයි කියනවා.

ජාතීන් අතර බොරු පතුරවමින්
පරීක්ෂණ නිහඬ කරනවා.

බෙදුණු, තුවාළවුණු, කලබල රටක
මහ හඬින් නුඹ සිනාසෙනවා.

හරි හොඳට නුඹ නිදාගත්තත්
මට නිදන්නට බෑ.

හරි හොඳට නුඹ කෑම කෑවත්
මට කුසගින්න නෑ

නුඹ දිනුම් යැයි නුඹ හිතනවා
නමුත් මා දන්නවා
පරාජයේ වණය
සහ මේ නින්දාවේ මතකය
මා සමගම තව බොහෝ කල්
ජීවත් වෙනවා.



# අඳුරුතම යුගයකදී පහන් දැල්වූ ගැහැනිය



## සිවිල් සහ මානව හිමිකම් ක්‍රියාකාරිනී සුනිලා අබේසේකර ගේ වියෝව වෙනුවෙන් ආසියානු මානව හිමිකම් කොමිසම නිකුත් කළ ප්‍රකාශය

සිමානාත්මතාවය, නිදහස සහ මානව හිමිකම්වල ලිබරල් අගයන් වෙනුවෙන් සිය රටෙහි අතිශය අඳුරු කාලපරිච්ඡේදයකදී පෙනී සිටියාය. 1962 වසර වන විට, එනම් ඇයට වයස අවුරුදු දහයේදී රටේ ප්‍රභූ පන්තියේ කොටසක් හමුදා කුමන්ත්‍රණයක් සිදුකිරීමට වෑයම් කළහ. මෙම කුමන්ත්‍රණය, රටේ ප්‍රභූ පන්තියෙන් කොටසක් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ දැරූ දුර්මතයන් ඉවත් කිරීම සංකේතවත් කළේය. යම්කිසි ආකාරයක ඒකාධිපති භාවයක් රට ට අවශ්‍ය බව මේ කුමන්ත්‍රණ උත්සාහය මගින් විදහා දැක්විණි. එය අසාර්ථක වුවද, ප්‍රජාතන්ත්‍රවාදයට වඩා ඒකාධිකාරී භාවය රටට හොඳින් ගැළපෙන බවට වූ මතය වියැකී නොගියේය. 1972 වන විට කම්කරුවන් නියෝජනය කළ දේශපාලන පක්ෂ පවා, සභාග රජය තුළින් යම්කිසි ආකාරයක වාමාංශික අධිකාරීභාවයක් සඳහා පර්යේෂණාත්මක උත්සාහයක නිතර වූහ. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අධිකරණ සමාලෝචන බලය ඉවත් කිරීම දක්වා ඔවුහු දුර ගියහ. මෙය, අධිකරණයේ ස්වාධීනත්වය වෙත එල්ල වූ ප්‍රථම විවෘත ප්‍රහාරයයි. 1978 වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා ද වඩාත් පරිපූර්ණ ආකාරයේ ඒකාධිකාරී බවක් පළ වන්නට විය. එවක පටන්, රටේ දේශපාලනය සදා අඳුරු ඒකාධිපතිත්වයක් වෙත ගමන් කළේය. වැඩිහිටි සුනිලා අබේසේකර ජීවත් වූයේ මේ මුඩුම කාල පරිච්ඡේදයේ ය. ප්‍රජාතන්ත්‍රවාදය සහ යුක්තිය වෙනුවෙන් නැගී සිටි අය සමග ඇය ද නැගී සිටියාය. මේ කාණ්ඩයට අයත් වූවන් නිරන්තරයෙන් අපකීර්තියට පත්වූ අතර ඔවුන් ද්‍රෝහීන් ලෙස සැලකිණි. දේශප්‍රේමිත්වය ලෙස සැලකුණේ ඒකාධිපතිත්වය වෙත සහාය දැක්වීමයි. තමන්ගේම මිනිසුන් විසින් සිදුකළ මේ අවසැලකීම හමුවේ ඇය ඇද නොවැටුණාය. අවසන් මොහොත දක්වාම, ප්‍රජාතන්ත්‍රවාදයේ පරමාදර්ශනයන් වෙනුවෙන් නැගී සිටියාය.

සිය ජීවිතයේ අවසන් වර්ෂයන්හිදී ඇයට පිළිකාවට එරෙහිව සටන් කිරීමට සිදුවූ බව සංකේතාත්මක විය හැක. ඇතැම් විට එය, සිය ජීවිතයේ හොඳම කාලයේදී ඇය අත්දුටු-සෙස්සන් සමග තමන්ට හැකි අයුරින් සටන් කළ සමස්ත රට තුළ වඩාත් ගැඹුරු ලෙස පැතිර තිබූ පිළිකාවක සංකේතයක් වූවා විය හැක.

මෙය, ඇගේ ජීවිතය පිළිබඳ සවිස්තරාත්මක තක්සේරුවක් කිරීම සඳහා අවස්ථාව නොවේ. කෙසේ නමුත්, ඇය විසින් සිදුකළ වඩාත්ම සුවිශේෂී දායකත්වයන්ගෙන් එකක් අප විසින් මෙහිදී වාර්තා කළ යුතුය. එය නම්, භීෂණ යුගයේදී, විශේෂයෙන්ම 1987-1991 අතර කාලයේදී මහජන ප්‍රකාශිකාවක් බවට ඈ පත් කළ ඇගේ ධෛර්යයයි. මෙය, බලහත්කාරයෙන් සිදුකරනු ලබන අතුරුදන්වීම් මහා පරිමාණයෙන් රටේ සිදුවෙමින් පැවති කාලපරිච්ඡේදය විය. එය, බොහෝ පුද්ගලයන් නිහඬ කරවීම සඳහා උත්තර්ජනයන් එල්ල වූ සමය විය.

" සිය ජීවිතයේ අවසන් වර්ෂයන්හිදී ඇයට පිළිකාවට එරෙහිව සටන් කිරීමට සිදුවූ බව සංකේතාත්මක විය හැක. ඇතැම් විට එය, සිය ජීවිතයේ හොඳම කාලයේදී ඇය අත්දුටු-සෙස්සන් සමග තමන්ට හැකි අයුරින් සටන් කළ සමස්ත රට තුළ වඩාත් ගැඹුරු ලෙස පැතිර තිබූ පිළිකාවක සංකේතයක් වූවා විය හැක. "



ආචාර්ය මනෝරානි සරවනමුත්තු

මේ සමයේදී අතුරුදන් වූවන්ගේ මව්වරුන් වෙනුවෙන් ආචාර්ය මනෝරානි සරවනමුත්තු, සුනිලා අබේසේකර සමග එක්ව මහජන කථිකයෝ බවට පත්වූහ. *Three Women Speak* යනුවෙන් නිමල් මෙන්ඩිස් විසින් නිෂ්පාදනය කළ වාර්තා චිත්‍රපටය, රට පුරා සිටි අතුරුදන්වූවන් ගේ පවුල්වල අය වෙනුවෙන් ඔවුන් පළ කළ ධෛර්යවන්ත සහ සානුකම්පිත කැපවීමට සාක්ෂි දරයි. ආචාර්ය මනෝරානි සරවනමුත්තු ද මේ සමයේ රටේ සිටි ප්‍රශංසා නොලැබූ වීරවරියක වූ අතර සුනිලා ඇය සමග නැගී සිටියාය. අතුරුදන්වූවන්ගේ මව්වරුන් විසින් ගෙන ගිය මුල් සහ සැබෑ සමාජ ව්‍යාපාරය, දැනට වඩා හොඳින් සිහිපත් කර මතකයට නංවා ගත යුතුය. දුෂ්ට පුද්ගලයන් මේ ව්‍යාපාරයෙන් වාසි ලැබීම සහ සිය සීමිත දේශපාලන අරමුණුවලට ළඟාවීමට උත්සාහ කිරීමේදී එයට සතුරුකම් කිරීම අවාසනාවන්ත තත්වයක් විය.

ඇගේ මිතුරු මිතුරියන් සමග
ආසියානු මානව හිමිකම් කොමිසම සුනිලාට ආචාර කරන අතර අපි ඇගේ පවුල වෙත අපේ ශෝකය පළ කර සිටිමු.



## ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදයේ

# මූලික ව්‍යූහය විනාශ වීම

**අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝගය සම්බන්ධයෙන් ආචාර්ය මාක් කුරේගේ විත්තිවාචකයට ප්‍රතිචාරයක්**

- බැසිල් ප්‍රනාන්දු විසිනි

*''අපගේ අධිකරණ ක්‍රමය ලෝකයේ බොහෝ කොටස්වල පිළිපදින බව සම්බන්ධයෙන් ආඩම්බර විය හැකි හැම හේතුවක්ම අප වෙත තිබේ. එහි හරයෙහි තිබෙන්නේ ආණ්ඩුව එකඟ නොවන මත දරන සෑම අයෙකු සම්බන්ධයෙන් ම පවතින සාධාරණත්වය සහ අධිකරණ ස්වාධීනත්වයයි. මේ අමුද්‍රව්‍ය වලින් තොරව විනිසුරු ප්‍රතිශීර්ෂ පැළඳීම, නියාලු කරුණු දැක්වීම් සහ සාමි මන්ත්‍රී මණ්ඩලයේ අධිකාරීන් උපුටා දැක්වීම යල් පැන ගිය සිරිත් සහ ඇඳුම්වල අරුත්සුන් උඩගු ප්‍රදර්ශනයක් වනු ඇත.''*

- *ශ්‍රීමත් ජෝන් මෝටිමර් QC*



ශ්‍රීමත් ජෝන් මෝටිමර්, QC

ආණ්ඩුවේ හොරණෑව ලෙස සැලකෙන 'ඩේලි නිව්ස්' පුවත්පත විසින්, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියගේ දෝෂාභියෝග ගැටලුව පිළිබඳ කොටස් තුනකින් පළ කළ ලිපියක් දැන් කුඩා පොතක් වශයෙන් ප්‍රකාශනය කර තිබේ. මේ ලිපිය එම ප්‍රකාශනය පිළිබඳ ප්‍රතිචාරයකි.

ශ්‍රීමත් ජෝන් ක්ලිෆඩ් මෝටිමර්, CBE, QC (1923 අප්‍රේල් 21-2009 ජනවාරි 16) ගේ උක්ත කෙටි කියමන නියත වශයෙන්ම ආචාර්ය මාක් කුරේ ගේ ලිපියට සැහෙන තරමේ පිළිතුරකි. ජෝන් මෝටිමර් අතීතයේ පැවති බ්‍රිතාන්‍ය යටත් විජිත ගණනාවක චූදිතයන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා කැඳවූ බ්‍රිතාන්‍ය බැරිස්ටර්වරයෙකු විය. මේ විශේෂිත සඳහන සිදුකරන ලද්දේ සිංගප්පූරුවේ නීති ක්‍රමයට අදාළව ය. කෙසේ නමුත් ශ්‍රී ලංකාව ද ඇතුළුව අධිරාජ්‍ය යුගයේ බ්‍රිතාන්‍යය යටතේ පැවති සෙසු බොහෝ අධිකරණ බලප්‍රදේශයන්ටද එය එක හා සමාන ලෙස යෙදේ. *'විනිසුරු ප්‍රතිශීර්ෂ පැළඳීම, නියාලු කරුණු දැක්වීම් සහ සාමි මන්ත්‍රී මණ්ඩලයේ අධිකාරීන් උපුටා දැක්වීම'* යන්න, මෙකී අතීත යටත් විජිත සමහරක 'යුක්තික ක්‍රම' පිළිබඳ ඔහුගේ නිරීක්ෂණය වූ ස්වාධීන අධිකරණ ක්‍රමයක් පවතින බවට ලකුණු නොමැති බව හඟවයි.

ආචාර්ය මාක් ප්‍රනාන්දුගේ ලිපිය එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ ඕස්ට්‍රේලියාවට අනුකූල කරුණු රාශියකින් සමන්විත වේ. ඔහු නිරීක්ෂණ කිරීමට අසමත් වන දෙය නම්, මෝටිමර් විසින් සඳහන් කරන මූලික අමුද්‍රව්‍ය නොමැතිව, ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය ඉහතින් සඳහන් කළ අධිකරණ බලයන් සමග සැසඳිය නොහැකි බවයි. මේ තැන් තුනෙහිම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය තිබේ. එය පරිපූර්ණ ලෙස නොතිබෙන්නේ විය හැකි වුවත් මූලික වශයෙන් ගත්කල දේශපාලනමය සහ නෛතික වශයෙන් ඔවුන් සතුව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයන් පවතියි. නමුත් ශ්‍රී ලංකාවේ තවදුරටත් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයක් පවතින්නේ නැත.

> "
> ආචාර්ය මාක් ප්‍රනාන්දුගේ ලිපිය එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ ඕස්ට්‍රේලියාවට අනුකූල කරුණු රාශියකින් සමන්විත වේ. ඔහු නිරීක්ෂණ කිරීමට අසමත් වන දෙය නම්, මෝටිමර් විසින් සඳහන් කරන මූලික අමුද්‍රව්‍ය නොමැතිව, ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය ඉහතින් සඳහන් කළ අධිකරණ බලයන් සමග සැසඳිය නොහැකි බවයි.
> "

## සදෝෂී වීමේ දර්ශනය

සෑම ක්‍රමයකම අඩුපාඩු තිබෙන බවත් ඒ අනුව එම පරිපූර්ණ නැති සෑම ක්‍රමයකටම සමවීමට උත්සාහ කරන බවත් හුදු වශයෙන් පැවසීම මගින් ආචාර්ය මාක් කුරේ මේ ප්‍රශ්නයෙන් හිතා මතා මග හරියි. ඔහු මෙසේ ලියයි. "ශ්‍රී ලංකාවට ඇත්තේ දෝෂ රාශියක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. 1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිපූර්ණ එකක් නොවීය. 1948 ආණ්ඩුක්‍රමය පරිපූර්ණ නොවීය. 1972 ආණ්ඩුක්‍රමය පරිපූර්ණ නොවීය. 1978 ආණ්ඩුක්‍රමය පරිපූර්ණ නොවීය. පරිපූර්ණ ව්‍යවස්ථාවක් ඔබ සොයාගන්නේ කුමන දිව්‍යලෝකයෙන්ද..?"

එවැනි තැනකින් පරිපූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සොයාගැනීමේ අවශ්‍යතාවයක් කොහෙත්ම නැත. කෙසේ නමුත්, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයක ආණ්ඩුක්‍රමයක් සහ එසේ නොවන එකක් අතර වෙනස වටහාගැනීමට අපට පුළුවන. මෙහිදී වඩාත් වැදගත් වන්නේ සහ අනුකූල වන්නේ එම අර්ථ දැක්වීමයි.

දෝෂයන් පිළිබඳ මෙම අනුකූලතාවයන් සම්බන්ධයෙන්, අප ඇසිය යුත්තේ අසාධ්‍ය පිළිකාවක් වැළඳුණු පුද්ගලයෙක් සහ නිරෝගී සුවයෙන් පසුවන පුද්ගලයෙක් යන දෙදෙනාම එක සේ පරිපූර්ණ නොවේ ද යන්නයි. එසේත් නැතිනම් වෙයිමර්ගේ ආණ්ඩුක්‍රමය අපරිපූර්ණ ද සහ ඇඩොල්ෆ් හිට්ලර්ගේ පාලනය සිදුකළ ආණ්ඩුක්‍රමය ද එක සේ අපරිපූර්ණ ද යන්නයි. එසේත් නැතිනම් ජෝසප් ස්ටාලින් සෝවියට් සංගමය පාලනය කළ ආණ්ඩුක්‍රමය සහ ඒ යුගයේ ඇමරිකා එක්සත් ජනපදය පාලනය වූ ආණ්ඩුක්‍රමය ද අපරිපූර්ණ වීද යන්නයි. අපරිපූර්ණතාවය පිළිබඳ මෙබඳු අදාළකර ගැනීම් වලින් කිසිවක්ම නොහැගවෙන අතර එහිදී එකී සැසඳීමට ලක්කරන තත්වයන් දෙකෙහි පවතින සැලකිය යුතු වෙනස්කම් නොසලකා හරියි.

**1948 සහ 1972 ආණ්ඩුක්‍රමයන් 1978 ආණ්ඩුක්‍රමය සමග සැසඳීමේදී තිබෙන වෙනස්කම වන්නේ 1978 ආණ්ඩුක්‍රමය මගින් රට එහි ලිබරල් ප්‍රජාතාන්ත්‍රික පදනමෙන් ඉවත්කිරීම සහ අර්ධ ඒකාධිපති ක්‍රමයක් නිර්මාණය කිරීමයි. පාර්ලිමේන්තුව උත්තරීතර බවටත් අධිකරණය අප්‍රධාන ආයතනයක් බවටත් වැරදි සංකල්පනයක් නිර්මාණ කිරීම මගින් 1972 ආණ්ඩුක්‍රමය 1978 ආණ්ඩුක්‍රමයට මග පාදා දුන්නේය.**

“

පාර්ලිමේන්තුව උත්තරීතර බවටත් අධිකරණය අප්‍රධාන ආයතනයක් බවටත් වැරදි සංකල්පනයක් නිර්මාණ කිරීම මගින් 1972 ආණ්ඩුක්‍රමය 1978 ආණ්ඩුක්‍රමයට මග පාදා දුන්නේය.

”

## දෝෂාභියෝගය සහ අධිකරණයේ ස්වාධීනත්වය

ආචාර්ය කුරේ මෙසේ සඳහන් කරයි. *"1948 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උදාසීන එකක් වූ අතර අධිකරණයේ ස්වාධීනත්වයට අදාළ බ්‍රිතාන්‍ය සම්මුතීන් පිළිපදිනු ලැබීය. ඉන්පසු පැනවූ ආණ්ඩුක්‍රම මගින් සිතාමතාම අධිකරණයේ ස්වාධීනත්වයට පීඩා එල්ල කරන ලදී".* ඔහු වාද කරන්නේ, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය අත්තනෝමතික ලෙස ඉවත් කිරීම, සිතාමතාම පීඩාවට පත් කර ඇතැයි ඔහු කියන අධිකරණ ස්වාධීනත්වයේ වැඩිදුර පුරසාරමක් (ඇතැම්විට අවසන් පුරසාරම ලෙස) ලෙස ගණන් ගැනීමයි.

කෙසේ හෝ, මේ සුවිශේෂී දෝෂාභියෝගය පිළිබඳ විවාදය තුළ තිබෙන ගැටලුවේ වැදගත්ම දෙය වන්නේ එයයි. දෝෂාභියෝගයට එරෙහි වූ සියල්ලන්ගේම ස්ථාවරය වූයේ මෙය, ආණ්ඩුවට එරෙහිව සමහර නඩු තීන්දු ලබාදුන් අගවිනිසුරුවරයෙකු/වරියක ඉවත් කිරීම පිණිස වූ ආණ්ඩුවේ අත්තනෝමතික දේශපාලනමය ක්‍රියාවක් බවයි. දිවිනැගුම පනත් කෙටුම්පතට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේදී විශේෂිත සඳහන් කෙරිණි.

දෝෂාභියෝගය ගෙන ඒමට පෙර සිද්ධි රාශියක් සිදුවිය. අගවිනිසුරුවරිය විසින් ජනාධිපතිවරයා මුණ ගැසෙන ලෙස කළ ආරාධනාව ප්‍රතික්ෂේප කිරීමෙන් පසු, අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයාට පහරදීමෙන් පසු අධිකරණ සේවා කොමිසම විසින් දූෂණ චෝදනා මත දිසා විනිසුරුවරයෙකුගේ වැඩ තහනම් කිරීම මෙම සිද්ධිවලට ඇතුළත් ය. ආණ්ඩුවේ ඉල්ලීම්වලට අනුගත නොවී ඒවාට ප්‍රතිරෝධය දැක්වූ හෙයින් අගවිනිසුරුවරිය සහ අධිකරණ සේවා කොමිසමේ සාමාජිකයන් ඉවත්කිරීමට ආණ්ඩුවට අවශ්‍ය විය. දෝෂාභියෝගයට එරෙහි වූවන්ගේ චෝදනාව වූයේ ආණ්ඩුවට අධිකරණයේ පාර්ශවයෙන් වඩාත් ඍජු 'පන්දම් ඇල්ලීමක්' සහ අධිකරණ ස්වාධීනත්වය අවසන් කිරීමක් අවැසි වූ බවයි. ආචාර්ය කුරේ විසින් දෝෂාභියෝගයට එරෙහි වූවන්ගේ මෙකී ඉතා හොඳින් දන්නා ස්ථාරවයන් ඉතා පහසුවෙන් නොතකා හරියි.

"

ආණ්ඩුවේ ඉල්ලීම්වලට අනුගත නොවී ඒවාට ප්‍රතිරෝධය දැක්වූ හෙයින් අගවිනිසුරුවරිය සහ අධිකරණ සේවා කොමිසමේ සාමාජිකයන් ඉවත්කිරීමට ආණ්ඩුවට අවශ්‍ය විය. දෝෂාභියෝගයට එරෙහි වූවන්ගේ චෝදනාව වූයේ ආණ්ඩුවට අධිකරණයේ පාර්ශවයෙන් වඩාත් ඍජු 'පන්දම් ඇල්ලීමක්' සහ අධිකරණ ස්වාධීනත්වය අවසන් කිරීමක් අවැසි වූ බවයි. ආචාර්ය කුරේ විසින් දෝෂාභියෝගයට එරෙහි වූවන්ගේ මෙකී ඉතා හොඳින් දන්නා ස්ථාරවයන් ඉතා පහසුවෙන් නොතකා හරියි.

"

1978 ආණ්ඩුක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමේ ප්‍රතිඵලය වූයේ සියලු මහජන ආයතන දේශපාලනීකරණය කිරීම සහ එයින්, නීතියේ ආධිපත්‍යය සහිත ක්‍රමය පැහැදිලි ලෙසම අක්‍රිය කිරීමයි. මේ ගැටලුවේදී, 2001 අවුරුද්දේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 17 වන සංශෝධනය සම්මත කරන විට ස්වාධීන ලෙස ක්‍රියාකරන මහජන ආයතන බිහිකිරීමට හැකිවේ යැයි පාර්ලිමේන්තුවේ එකඟතාවක් විණි.

ආචාර්ය මාක් කුරේ සෙසු අධිකරණ බල ප්‍රදේශයන්ගේ, විශේෂයෙන්ම එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ ඔස්ට්‍රේලියාවේ අධිකාරීන් ගණනාවක් උපුටා දක්වයි. මේ රටවල මහජන ආයතනයන් ශ්‍රී ලංකාවේ මෙන් අකර්මණ්‍ය වී තිබේදැයි අපි ඔහුගෙන් අසන්නෙමු. එසේත් නැතිනම් ආචාර්ය මාක් කුරේ එබඳු අකර්මණ්‍ය මහජන ආයතනයන් 'හුදු අපරිපූර්ණ' ආයතන ලෙස සලකන්නේද?

ශ්‍රී ලංකාව ගතවූ වර්ෂවලදී මුහුණ දී ඇත්තේ සිය මහජන ආයතයන්ට හිතාමතාම පීඩා පැමිණවූ දුර්දාන්ත පාලනයයි. එක් අගවිනිසුරු කෙනෙක් බලහත්කාරයෙන් ඉවත් කර විධායකයට විශ්වාසවන්ත තවකෙක් පත් කිරීම සිදුකළේ මේ දුර්දාන්ත පාලනය ශක්තිමත් කිරීම සඳහා ය. මේ අනුව, දෝෂාභියෝගයට සම්බන්ධව පැන නැගි විරෝධය, එකී ඉවත්කිරීම සම්බන්ධව පමණක් නොව අගවිනිසුරු ධුරයට නව පත්කිරීම සිදුකළ ක්‍රමයේ නොවැළැක්විය හැකි ප්‍රතිඵලයන් සම්බන්ධයෙන් ද විය.

## සමාකාර විධිවිධාන?

සෙසු අධිකරණ පාත්‍රතාවයන්ගේ නීතියෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමය වෙත ලැබුණු සමාකාර යැයි කියන ප්‍රතිපාදන ආචාර්ය මාක් කුරේ විසින් උපුටා දක්වයි. උදාහරණයක් වශයෙන්, උතුරු අයර්ලන්තයේ විනිසුරන් ඉවත් කරන රීතීන් නියම කළ 2005 බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පනතේ 133 සහ 135 වගන්ති මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ සිවිල් සහ නෛතික ප්‍රතිපාදන ද ඔහු විසින් උපුටා දක්වයි. ඉන්පසු ඔහු මෙසේ සඳහන් කරයි. "ඇමරිකානුවන් මෙන්ම බ්‍රිතාන්‍යයන්ද ඉහළ අධිකරණයකින් විනිසුරුවරයෙක් ඉවත්කිරීම සඳහා සිතාමතා තීරණයක් ගැනීම පිණිස සිය ව්‍යවස්ථාදායකය කෙරෙහි පූර්ණ විශ්වාසය තබා ඇත්තෝය". මෙබඳු ප්‍රතිසමතාවක්, 1978 ආණ්ඩුක්‍රමය පනවාගත් දා පටන් පැවති ශ්‍රී ලංකාවේ සැබෑ සන්දර්භයට මොනයම් ආකාරයකින් හෝ අදාළ කමක් දක්වන්නේද?

"
උදාහරණයක් වශයෙන්, උතුරු අයර්ලන්තයේ විනිසුරන් ඉවත් කරන රීතීන් නියම කළ 2005 බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පනතේ 133 සහ 135 වගන්ති මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ සිවිල් සහ නෛතික ප්‍රතිපාදන ද ඔහු විසින් උපුටා දක්වයි. ඉන්පසු ඔහු මෙසේ සඳහන් කරයි. " ඇමරිකානුවන් මෙන්ම බ්‍රිතාන්‍යයන්ද ඉහළ අධිකරණයකින් විනිසුරුවරයෙක් ඉවත්කිරීම සඳහා සිතාමතා තීරණයක් ගැනීම පිණිස සිය ව්‍යවස්ථාදායකය කෙරෙහි පූර්ණ විශ්වාසය තබා ඇත්තෝය". මෙබඳු ප්‍රතිසමතාවක්, 1978 ආණ්ඩුක්‍රමය පනවාගත් දා පටන් පැවති ශ්‍රී ලංකාවේ සැබෑ සන්දර්භයට මොනයම් ආකාරයකින් හෝ අදාළ කමක් දක්වන්නේද?
"

ජේ.ආර්. ජයවර්ධන විසින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු සී.වී. විග්නේස්වරන් විසින් මෙයට කීවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විගඩම කියා ය) තැනුවේ, තමන්ට ඒ සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකට අධික බහුතර සහයෝගයක් ලැබෙන බව දැන සිටිමිනි. 1978 ආණ්ඩුක්‍රමයට එබ්බවූ වඩාත් මූලික ක්‍රමෝපාය වූයේ විධායක ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ තිබූ තුනෙන් දෙකක පරම බහුතරය මෙහෙයවිය හැකි බවයි. එබඳු බහුතරයක් නොතිබූ කිසිදු ජනාධිපතිවරයෙකු ට 1978 ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක විය නොහැකි විය. විපක්ෂ සාමාජිකයන් 17 දෙනෙක් අන්තර්ග්‍රහණය කර ගැනීම මගින් (මහජනයාගේ ප්‍රත්‍යක්ෂ අවබෝධය වන්නේ ඔවුන්ව මිලදී ගත් බවයි) වර්තමාන ආණ්ඩුව විසින් තමන් සඳහාම බිහිකර ගත්තේද, පාර්ලිමේන්තුව මෙහෙයවීම සඳහා තමන්ගේම පක්ෂයේ පාර්ලිමේන්තු සාමාජිකයන්ගෙන් දින රහිත ඉල්ලා අස්වීමේ ලිපි ලබාගැනීම අත්‍යවශ්‍ය යැයි ජේ.ආර්. ජයවර්ධන සිතූ (මෙයට සමාන තත්වයක් ආචාර්ය මාක් කුරේ සොයාගන්නේ කොතැනකින්ද...?) ඒ හා සමානම ශක්‍යතාවයකි. වර්තමාන රෙජීමය සම්බන්ධයෙන් කිව හැක්කේ, ආණ්ඩුවට සහයොග්‍ය දක්වන සාමාජිකයන්ට පවා කිසිම විසම්මුතියකට ඉඩක් නැති නිසා මෙබඳු ලිපි අවශ්‍ය නොවන බවයි.

අගවිනිසුරු ඉවත්කිරීම සම්බන්ධයෙන් හෝ වෙනත් සෙසු ඕනෑම ගැටලුවක් සම්බන්ධයෙන්, සිතාබැලූ තීරණයක් ස්වාධීනව ගැනීම සඳහා ව්‍යවස්ථාදායකට හැකි යැයි මහජනයා තුළ විශ්වාසයක් නැත. ආචාර්ය මාක් කුරේ විසින් උපුටා දක්වන රටවල දේශපාලන සංස්කෘතීන් සහ ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය මේ සම්බන්ධයෙන් මූලික ලෙස වෙනස් වන අතර

ලෙස වෙනස් වන අතර එය සලකා බැලීමට තරම් වන කාරණාවකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථගැන්වීම සිදුවන්නේ සැබෑ දේශපාලනයේ සැබෑ යථාර්ථයන් තුළ මිස මූලධර්මයන්ගේ අමූර්ත යෙදීම තුළ නොවේ.

එස්.එල්. ගුණසේකර (වරක් පාර්ලිමේන්තු සාමාජිකයෙකු ද වූ) ගේ පහත දැක්වෙන ප්‍රකාශය මේ සම්බන්ධයෙන් අදාළ වේ.

*''මේ සම්බන්ධ 'පරම නිර්ණායකය' වන්නේ ඕනෑම පක්ෂයක නායකත්වය වෙත එහි සාමාජිකයන් ගේ ස්වාධීන චින්තනය සහ ස්වාධීන මත ප්‍රකාශ කිරීම මුස්ලිම් ජාතිකයෙකුට හෝ යුදෙව්වෙකුට ඌරු මස් මෙන් තහනම් දෙයක් බවට වන වඩාත් අප්‍රසන්න කරුණයි. අපේ දේශපාලන ක්‍රමයේ කර්කශ යථාර්ථය වන්නේ 'සිතීම' අතිශයින්ම පක්ෂ නායකත්වය සතු දෙයක් වන අතර එයට ගැළපෙන පරිදි ක්‍රියාකිරීම සහ ඒ මත පදනම් වී ගනු ලබන තීරණ එහි සියලු සාමාජිකයන්ගේ සහ යම්කිසි විශේෂිත පක්ෂයක පාර්ලිමේන්තු සාමාජිකයන්ගේ මූලිකම බැඳීමක් වන බවයි."*

*Lore of the Law and Other Memories:* පළමු පරිච්ඡේදය, *The intention of the Legislature*, පිටුව 117

## ප්‍රබන්ධය සහ යථාර්ථය

දේශපාලන ප්‍රබන්ධය සහ දේශපාලන යථාර්ථය සහමුලින්ම වෙනස් දේවල් දෙකකි. වත්මන් යුගයේ ශ්‍රී ලංකාව වැනි තත්වයන්හිදී මෙය විශේෂයෙන්ම එසේ ය. දෝෂාභියෝගය පිළිබඳ සකල ගැටලුවම ආචාර්ය මාක් කුරේ විසින් යම්කිසි ආකාරයක ප්‍රබන්ධයක් සේ සලකයි. මේ ප්‍රබන්ධය තුළ පාර්ලිමේන්තු තේරීම්කාරක කමිටුව (PSC), පාර්ලිමේන්තුව සහ ජනාධිපති එකිනෙකින් වෙනස්ම අනුභූතීන් ත්‍රිත්වයකි. ඒ සියල්ලම එකිනෙකාගෙන් ස්වාධීනව ක්‍රියාකරන අතර තමන්ගේ තර්කය හැර අන් කිසි දෙයක් මත පදනම් නොවේ.


නමුත් යථාර්ථය එසේ නොවේ. පාර්ලිමේන්තු තේරීම්කාරක කමිටුව, පාර්ලිමේන්තුව සහ විධායකය එක් ඒකකයකි. පාර්ලිමේන්තු තේරීම්කාරක කමිටුවට හෝ පාර්ලිමේන්තුවට ඉහළින් නියෝග කරන දේ හැර අන්කිසිවක් කිරීමට හැකියාවක් නැත. දෝෂාභියෝගය ආරම්භ වූයේ ඉහළින් ආ නියෝගයක් ලෙස මිස දෝෂාභියෝග පෙත්සම අත්සන් කළවුන්ගේ ස්වයංජාත හෙවත් නිරායාස ක්‍රියාවක් ලෙස නොවේ.

'

*මේ සම්බන්ධ 'පරම නිර්ණායකය' වන්නේ ඕනෑම පක්ෂයක නායකත්වය වෙත එහි සාමාජිකයන් ගේ ස්වාධීන චින්තනය සහ ස්වාධීන මත ප්‍රකාශ කිරීම මුස්ලිම් ජාතිකයෙකුට හෝ යුදෙව්වෙකුට ඌරු මස් මෙන් තහනම් දෙයක් බවට වන වඩාත් අප්‍රසන්න කරුණයි.*

- එස්.එල්. ගුණසේකර

”



සෙසු සියලු පියවර ද ඉහළින් පැමිණි විධානයන් විය. අතිශය දුෂ්ට ලෙස සහ ප්‍රතිපත්තියකින් තොරව මාධ්‍ය මෙයෙවිණ. දෝෂාභියෝගය ආවරණය කිරීම ගුවන්විදුලි, රූපවාහිනී සහ පුවත්පත් හරහා මෙහෙයවුණු, රාජ්‍ය මාධ්‍ය විසින් සිදුකළ වඩාත්ම දුෂ්ට කාර්යය විය. එයට එරෙහි වන ඕනෑම අයෙකු පිළිබඳ ප්‍රසිද්ධියේ, නිතරම නම්වලින්ම ප්‍රකාශ කෙරුණේ ජාති ද්‍රෝහීන් ලෙසිනි. එය එසේ සිදුවන විට සුදු වෑන් රථයක් පැමිණීමේ තර්ජනය අතිශය සැබෑවක් විය. මේ දේශපාලන යථාර්ථයේ ස්වභාවය කිසිවෙකු හට රහසක් නොවේ.

## ආරක්ෂක ප්‍රතිපාදන

මෙම දේශපාලන යථාර්ථයේ තවදුරටත් දැකිය හැකි අංගයක් වූයේ ව්‍යාජ චෝදනා ගොනුකිරීම සඳහා ආරක්ෂක අංශ මෙහෙයවීමයි. ඕනෑම කෙනෙකුට එරෙහිව ඕනෑම චෝදනාවක් නැගිය හැකි සේ ආරක්ෂක අංශ අද මෙහෙයවිය හැකි අතර එවැනි චෝදනා කිසිඳු සත්‍ය සිදුවීමකට කිසිදු සම්බන්ධයක් නොමැති ඒවා වීමට ද පුළුවන. කීර්තිමත් පුද්ගලයන්ට එරෙහිව පසුගියදිනවල නැගුණු චෝදනා, ඕනෑම කෙනෙක් ගොතන ලද චෝදනාවල ගොදුරක් බවට කොතරම් පහසුවෙන් පත් කළ හැකිදැයි සිතාගැනීමට සෑහෙයි.

මේ සන්දර්භය තුළ පැන නැගුණු ගැටලුව වූයේ ආරක්ෂක අංශ හරහා මෙන්ම පාර්ලිමේන්තුව හරහා ද සිදුකෙරුණු එබඳු විධානයන්ට ලක්වූ පුද්ගලයෙකුට ලද හැක්කේ කුමන ආකාරයක ආරක්ෂාවක් ද යන්නයි. දෝෂාභියෝගයේ කේන්ද්‍රීය ගැටලුව වූයේ කුමක්ද? අගවිනිසුරුවරියටවත් එවැනි ආරක්ෂාවක් නොතිබුණු විට සාමාන්‍ය පුද්ගලයෙකුට ලද හැකි ආරක්ෂාව කුමක්ද?

> “
> තමා විසින් උපුටා දක්වන ලද රටවල දේශපාලන සංස්කෘතියේත් තත්වය මෙය යැයි ආචාර්ය මාක් ප්‍රනාන්දු කියා සිටින්නේද? එසේ කියා සිටීම සැබවින්ම න්‍යාය විරෝධී සහ හාස්‍යජනක වේ.
> ”

තමා විසින් උපුටා දක්වන ලද රටවල දේශපාලන සංස්කෘතියේත් තත්වය මෙය යැයි ආචාර්ය මාක් ප්‍රනාන්දු කියා සිටින්නේද? එසේ කියා සිටීම සැබවින්ම න්‍යාය විරෝධී සහ හාස්‍යජනක වේ. මේ රටවල, මෝටිමර් පැවසූ නිදහස් සමාජයක මූලික අමුද්‍රව්‍ය තවමත් තිබේ. කිසිම සමාජයක් තමන් පරිපූර්ණ යැයි කියා සිටින්නේ නැත. ගැටලුවේ වැදගත්ම කොටස වන්නේ, ජනතාවට සිය කැමැත්ත තරයේ කියාසිටිය හැකි නිදහස් සමාජයක තත්වයන් මොනවාද යන්න සහ සමාජයක් නිදහස් නැතැයි පෙන්වන තත්වයන් මොනවාද යන්නයි.

## ඉන්දියාවේ තත්වය/'මූලික' ව්‍යූහය' පිළිබඳ සිද්ධාන්තය

ඉන්දියානු අධිකරණ බලය සම්බන්ධ කිසිවක් ආචාර්ය මාක් කුරේ සඳහන් නොකරයි. කෙසේ නමුත් ඉන්දියනු නීතිය සහ ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිදුකරන එහි අර්ථ දැක්වීම් අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ගැටලුව සමග අතිශයින්ම අනුකූල වෙයි. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන පසුකාලීනව සිදුකළ ආකාරයට අගමැතිනි ඉන්දිරා ගාන්ධි විසින් ඉන්දියාව එම දිශාවට ගෙන යාමට උත්සාහ කරන විට ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණාත්මක ලෙස ඇයව නතර කිරීමට මැදිහත් විය.

*කේසවනන්ද භාරතී නඩුවේදී (කේසවනන්ද භාරතී එ. කේරළ ප්‍රාන්තය සහ තවත් අයෙක්,* 1973 *අප්‍රේල්* 24) ශ්‍රේෂ්ඨාධිකරණය දැරූ මතය වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව උත්තරීතර නොවන බවත්, ඒ තුළ එයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ව්‍යූහය වෙනස් කළ නොහැකි බවත් ය.

> “
>
> ඉන්දියානු අධිකරණ බලය සම්බන්ධ කිසිවක් ආචාර්ය මාක් කුරේ සඳහන් නොකරයි. කෙසේ නමුත් ඉන්දියනු නීතිය සහ ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිදුකරන එහි අර්ථ දැක්වීම් අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ගැටලුව සමග අතිශයින්ම අනුකූල වෙයි.
>
> ”

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සෑම විධිවිධානයක්ම අත්‍යවශ්‍ය යැයි උගත් නීතිපතිතුමා පැවසීය. නොඑසේ නම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමට අවශ්‍ය නොවේ. එය සත්‍යයකි. නමුත් එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සෑම විධිවිධානයක්ම එකම ස්ථානයක නොපිහිටුවයි. සැබෑ තත්වය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සෑම විධිවිධානයක්ම, එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික පදනම සහ ව්‍යූහය ඒ ආකාරයෙන්ම පවතින පරිදි සංශෝධනය කළ හැකි බවයි. එකී මූලික ව්‍යූහය පහත දැක්වෙන ලක්ෂණවලින් සමන්විත වේ යැයි කිව හැක.*

*(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතර බව*
*(2) ආණ්ඩුවේ ජනරජ සහ ප්‍රජාතාන්ත්‍රික ආකෘතිය*
*(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනාගාමික ස්වරූපය*
*(4) ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය අතර බලතල බෙදීම*
*(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෆෙඩරල් ස්වභාවය*

*317. ඉහත ව්‍යූහය ගොඩනැගී ඇත්තේ මූලික පදනම මත ය. උදා: පුද්ගල අභිමානය සහ නිදහස. මෙය උත්තරීතර වැදගත්කමකින් යුක්ත ය. මෙය සංශෝධනයට ලක් කිරීම හෝ විනාශ කිරීම කළ නොහැක."*

## ව්‍යාකූලතාවයේ මූලය

සෝල්බරි ආණ්ඩුක්‍රමය ලෙසද දන්නා 1948 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මූලික ව්‍යුහයක් විය. මේ මූලික ව්‍යුහය ඉන්දියාවේ සහ අතීත බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ ඕනෑම රටක මූලික ව්‍යුහය වැනිම විය. නීතිය උත්තරීතර බව ඇතුළුව ප්‍රජාතන්ත්‍රවාදයක අත්‍යවශ්‍ය සංචරක, නීතියේ ආධිපත්‍ය, බලතල බෙදීම සහ අධිකරණයේ ස්වාධීනත්වය මේ මූලික ව්‍යුහයේ කොටස් විය. මෙම මූලික ව්‍යුහයට බලපාන ඕනෑම සංශෝධනයක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්බල කරන අතර රාජ්‍යයක ප්‍රජාතන්ත්‍රවාදයක් ඉතිරිව තිබීමට තිබෙන සෑම ඉඩකඩක්ම ද එමගින් විනාශ කර දමයි. 1972 සහ 1978 ආණ්ඩුක්‍රමයන් මගින් වෙනස් කෙරුණේ මෙම මූලික ව්‍යුහයයි. අවාසනාවකට මෙන් එවකට ශ්‍රේෂ්ඨාධිකරණය, ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුගමනය කළ ආකාරයේ (උදාඃ මූලික ව්‍යුහය පිළිබඳ සිද්ධාන්තය) මාර්ගයක් අනුගමනය නොකළේය. එය එසේ විණි නම් 1972 සහ 1978 ආණ්ඩුක්‍රමයන්ගේ යම් යම් කොටස් නීතිය බවට සම්මත නොවීමට ඉඩ තිබූ අතර එසේ විණි නම් ශ්‍රී ලංකාව අද සිටින අවුල් ජාලයට පත් නොවනු ඇත.

> “
>
> මෝටර් රථවලට රික්ෂෝ යැයි කිවහැකි වන්නේත්, අධිකරණයට විධායකයේ තීන්දුවලට රබර්මුද්‍රාව ගැසීමට සිදුවන්නේත්, නීතිපති සහ සෙසු සියලු රජයේ නිලධාරීන් ට සිය ස්වාධීනත්වය අහිමි වන්නේත් ඔවුන් විධායකයේ පදයට නටන හුදු රොබෝවන් බවට පත්වන්නේත් එවිට ය.
>
> ”

පාර්ලිමේන්තුවට තමන් කැමති දෙයක් කළ හැකි නම් නීතියට නීතියක් ලෙස පැවතිය නොහැකි වේ. සියලු මනුෂ්‍යයන් ගනුදෙනු කරන ඕනෑම ආකාරයක ප්‍රකාශනයන් තාර්කිකත්වයේ නියමයන්ගෙන් බැඳී තිබෙන හෙයින් පාර්ලිමේන්තු ද, එම මූලික ආකෘතිය විසින් බිහිකරන ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදී නම්, එකී ආණ්ඩුවේ මූලික ආකෘතියේ තාර්කිකත්වයෙන් බැඳී පවතියි. එම තාර්කිකත්වය අත්හළ මොහොතේ සකල නීති ක්‍රමයම අතාර්කිකත්වයේ බලපෑමට නතුවෙයි. මෝටර් රථවලට රික්ෂෝ යැයි කිවහැකි වන්නේත්, අධිකරණයට විධායකයේ තීන්දුවලට රබර්මුද්‍රාව ගැසීමට සිදුවන්නේත්, නීතිපති සහ සෙසු සියලු රජයේ නිලධාරීන් ට සිය ස්වාධීනත්වය අහිමි වන්නේත් ඔවුන් විධායකයේ පදයට නටන හුදු රොබෝවන් බවට පත්වන්නේත් එවිට ය.

අධිකරණයේ ස්වාධීනත්වය, අධිකරණ සේවා කොමිසමේ භූමිකාව සහ සෙසු සියලු ආශ්‍රිත ගැටලු පිළිබඳ වත්මන් විවාදය වඩාත්ම මූලික සංකල්පය වන, අත්හැර දැමූ විට හීන වී යන මූලික ආකෘතියක් ප්‍රජාතන්ත්‍රවාදයට තිබේය යන්නේ ප්‍රතිඵලයයි.

වත්මන් විවාදයෙන් විදහා දක්වන දෙය නම්, 1978 ආණ්ඩුක්‍රමයෙන් කල්පනා කරන ආණ්ඩුවේ ආකෘතිය ඒකාධිපතිත්වයක් විනා ප්‍රජාතන්ත්‍රවාදයක් නොවන බවයි. තමන්ගේ කැමැත්ත ප්‍රකාරව කටයුතු කරන්නැයි ඒකාධිපති විසින් දැන් අධිකරණයට නියෝග කරයි. තවද ඒකාධිපතිගේ අභිලාෂයන් මුදුන්පත් කරවන ව්‍යවස්ථාදායකය අධිකරණයෙන් බලාපොරොත්තු වන්නේ සහ ඉටුකරවා ගැනීමට බලාපොරොත්තු වන්නේද එම ඒකාධිපති කැමැත්තයි.

ප්‍රගතිශීලී බව 1978 ආණ්ඩුක්‍රමයේ මූලිකම ප්‍රතික්ෂේප කිරීමක් වන අතර ඉන්දියාව විසින් සිදුකර ඇති මූලික ව්‍යුහය පිළිබඳ සිද්ධාන්තය නැවත ප්‍රකාශ කිරීමකි. ආණ්ඩුවේ ව්‍යුහය ප්‍රජානත්ත්‍රවාදයක මූලික සැකසුම සමග අනුකූල විය යුතු අතර එම රාමුව තුළ ව්‍යවස්ථාදායකයට කළ හැක්කේ මූලික ව්‍යුහය විසින් කිරීමට ඉඩ හරින දේ පමණි. ශ්‍රී ලංකාවේ අනාගතය සඳහා තිබෙන වරණයන් වන්නේ ඒකාධිපතිත්වය වෙත යොමුවීම හෝ මෙම මූලික ප්‍රතිසංස්කරණය මුදුන් පමුණුවාගෙන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක මූලික ව්‍යුහය නැවත ප්‍රකාශකිරීමයි.

ඉන්දියානු පාර්ලිමේන්තුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු අත්තනෝමතික ලෙස ඉවත්කිරීමට යම්කිසි උත්සාහයක් දරනු ලැබුවේ නම් ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය එම ක්‍රියාව වැළැක්වීම සඳහා මූලික ව්‍යුහය පිළිබඳ සිද්ධාන්තය යොදාගනු ඇත.

> “
>
> විධායකය සහ ව්‍යවස්ථාදායකය විසින් අධිකරණයේ ස්වාධීනත්වයට පීඩා කරන පියවර ගැනීම වැළැක්වීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණයට කළ හැකි කිසිවක් නැති නම් විධායකයෙන් සහ/හෝ ව්‍යවස්ථාදායකයෙන් අධිකරණයේ ස්වාධීනත්වයට එල්ල වන ප්‍රහාරවලින් එය රැක ගැනීම සඳහා පවතින නෛතික යාන්ත්‍රණය කුමක්ද?
>
> ”

## දෝෂාභියෝගය සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ තීන්දු

දෝෂාභියෝගය සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීම, එය විසින්ම නීතිය වරදවා වටහාගැනීමක් යැයිද ලෝකයේ අන් කිසි තැනෙක කිසිදු අධිකරණයක් විසින් මෙබඳු ආඥාවක් කර නැතැයි ද ආචාර්ය මාක් කුරේ කියයි. මෙම මතය මගින් ඔහු අදහස් කරන්නේ, ව්‍යවස්ථාදායකයේ මෙහෙයවීම හරහා විධායකය විසින් අගවිනිසුරුවරයෙකු හෝ ඕනෑම උපරිමාධිකරණ විනිසුරුවරයෙකුව එකලාම දේශපාලන හේතු මත ඉවත්කරයි නම් ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය ඒ සම්බන්ධයෙන් කළ හැකි කිසිවක් නැති බවයි. විධායකය සහ ව්‍යවස්ථාදායකය විසින් අධිකරණයේ ස්වාධීනත්වයට පීඩා කරන පියවර ගැනීම වැළැක්වීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණයට කළ හැකි කිසිවක් නැති නම් විධායකයෙන් සහ/හෝ ව්‍යවස්ථාදායකයෙන් අධිකරණයේ ස්වාධීනත්වයට එල්ල වන ප්‍රහාරවලින් එය රැක ගැනීම සඳහා පවතින නෛතික යාන්ත්‍රණය කුමක්ද?

මනා ලෙස ආරක්ෂිත පවුරු යෙදූ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ පවතින සම්මුතීන් හේතුවෙන් එබඳු උත්සාහයක් සිදුවියහැකි රටවල්වල 'සමකාර' තත්වයන්ගේ භාවිතයන් සොයාගැනීම අසීරු ය. එබඳු ක්‍රමයක් තුළ අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂණය කරන මෝටිමර් කියූ 'අමුද්‍රව්‍ය' සහ ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය කියූ 'මූලික ආකෘතිය' වන්නේ එයයි.

මෙකී මූලික ආකෘතියේ සිද්ධාන්තමය පදනම මත අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ මැදිහත්වීම සාධාරණීකරණය කිරීම, කේසවනන්ද භාරතී ඉන්දියානු නඩුතීන්දුවට අනුකූල වේ. මෙයට අමතරව ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීමෙන් පසු සහ බ්‍රිතාන්‍ය කිරුළට යටත් වීමෙන් පසු පරමාධිකාරී රිට් ආඥාවන්ගේ වලංගුතාවය අහිමිවී ගියේය. මෙකී රිට් ආඥාවන්ගේ විෂය පථය ස්වාධීන ජනරජයක තත්වයෙහිලා අර්ථ දැක්විය යුතුය. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයක් වශයෙන් රජයේ මූලික ව්‍යූහයන් සුරක්ෂය කිරීම පිණිස මෙකී රිට් ආඥාවන් භාවිතා කිරීම අධිකරණවල රාජකාරිය වේ.

1972 දී සහ 1978 දී ශ්‍රේෂ්ඨාධිකරණය සිය ස්වාධීනත්වය සුරක්ෂණය කර ගැනීම සඳහා ක්‍රියා කර තිබිණි නම් ශ්‍රී ලංකාව අද මුහුණ දී තිබෙන විපත වළක්වාගත හැකිව තිබිණි. මෙම අවස්ථා දෙකේදීම ශ්‍රේෂ්ඨාධිකරණය අවසානාත්මක ලෙස ක්‍රියාකිරීමට අපොහොසත් විය. 1978 ආණ්ඩුක්‍රමය පනවා ගැනීමෙන් පසුව නව ශ්‍රේෂ්ඨාධිකරණයක් පත් කළ අතර එහිදී එයට පෙර ශ්‍රේෂ්ඨාධිකරණයේ සාමාජිකයන් බවට පත්ව සිටි විනිසුරන් කිහිප දෙනෙක් අත් හරින ලදී. මෙය නැවත නැවතත් හෙළාදකින ලද අතර විනිසුරුවරුන් ආණ්ඩුක්‍රමය හරහා එළවා දැමීම ලෙස මෙය හැඳින්විණි. ශ්‍රේෂ්ඨාධිකරණය ක්‍රියාත්මක විය යුතුව තිබුණු අවස්ථාව එයයි. නැවත පත්කළ එක් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙක් එයට විරෝධය දැක්වීමක් වශයෙන් ඉල්ලා අස්වූ බව ද වාර්තා විය. කෙසේ නමුත් පසුකාලීනව ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන සමග ගැටුම් ඇතිකරගත් අගවිනිසුරු නෙවිල් සමරකෝන් මෙකී එළවාදැමීම්වලට විරෝධය නොපෑවේය. ඒ මොහොතේ අගවිනිසුරු නෙවිල් සමරකෝන් සහ සෙසු විනිසුරුවරුන් තීරණාත්මක ලෙස ක්‍රියාකර එළවා දැමූ විනිසුරුවරුන් නැවත සේවයේ පිහිටුවන තෙක් දිවුරුම් දීම ප්‍රතික්ෂේප කළේ නම් ශ්‍රී ලංකාවේ ඉතිහාසය මීට වඩා බෙහෙවින් වෙනස් වන්නට ඉඩ තිබිණි.

“ කෙසේ නමුත් පසුකාලීනව ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන සමග ගැටුම් ඇතිකරගත් අගවිනිසුරු නෙවිල් සමරකෝන් මෙකී එළවාදැමීම්වලට විරෝධය නොපෑවේය. ඒ මොහොතේ අගවිනිසුරු නෙවිල් සමරකෝන් සහ සෙසු විනිසුරුවරුන් තීරණාත්මක ලෙස ක්‍රියාකර එළවා දැමූ විනිසුරුවරුන් නැවත සේවයේ පිහිටුවන තෙක් දිවුරුම් දීම ප්‍රතික්ෂේප කළේ නම් ශ්‍රී ලංකාවේ ඉතිහාසය මීට වඩා බෙහෙවින් වෙනස් වන්නට ඉඩ තිබිණි. ”

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම එළවාදැමීම් එකල ප්‍රතික්ෂේප කර තිබිණි නම් එහිදී ජනාධිපතිවරයා සමග ඍජු ගැටමක් ඇතිවිය හැකිව තිබිණි. 1978 ආණ්ඩුක්‍රමය හරහා ජේ.ආර්. ජයවර්ධන එල්ල කළ බරපතළ ප්‍රහාරය පිළිබඳ සැලකීමේදී මෙබඳු ගැටමක් සපුරාම සාධාරණීකරණය කිරීමට ද පුළුවන.

ශ්‍රේෂ්ඨාධිකරණය ඒ ආකාරයට එදා ක්‍රියා කළේ නම් සෙසු නීතිඥවරුන් සහ අධිකරණය ද ඒ සඳහා සහාය දක්වනු ඇත. අධිකරණයේ ස්වාධීනත්වයට එරෙහිව විධායකය විසින් සිදුකළ අයුතු බලපෑමට එරෙහිව ඉදිරිපත් වී සිය විනිසුරුවරුන් වෙත සහයෝගය දැක්වීමේ ස්වකීය අවස්ථාව ජනතාවට ද ලැබෙනු ඇත. අගවිනිසුරගේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ අක්‍රිය යටහත්වීම විසින් ජනතාවට මෙම අවස්ථාව අහිමි කෙරිණි.

අධිකරණයේ ස්වාධීනත්වය අත්පත් කර ගෙන තිබෙන ස්ථානවල එසේ කර තිබෙන්නේ සිය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කළ ජනතාවගේ නිර්දය අගලයන් සහ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම පිණිස සෑහෙන නිර්භය කමක් තිබූ විනිසුරුවරුන්ගේ පරිශ්‍රමයන් හරහා ය. අවාසනාවකට මෙන් 1972 සහ 1978 දී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරන් සිය නිදහස සහ ජීවිත-හෝ සිය රැකියා පවා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් අවදානමට පත් කිරීම සුදුසු යැයි සිතුවේ නැත.


“

අවාසනාවකට මෙන් 1972 සහ 1978 දී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරන් සිය නිදහස සහ ජීවිත-හෝ සිය රැකියා පවා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් අවදානමට පත් කිරීම සුදුසු යැයි සිතුවේ නැත.

”


මෑතකාලීන දෝෂාභියෝග නඩුවලදී, ව්‍යවස්ථාදායකය හරහා සිය ප්‍රධානියා වෙත විධායකය විසින් තාඩන පීඩන එල්ල කරන තත්වයක් තුළ අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ ක්‍රියාවන් නිර්භය ක්‍රියාවන් ය. මෙම නඩු තීන්දු ද්විත්වය ශ්‍රී ලංකාවේ අධිකරණ ස්වාධීනත්වය පිළිබඳ අරගලයේ දීප්තිමත් නිමේෂයක් සේ සැලකිය හැකිය. වැටුණු අමාරුවෙන් ගොඩ ඒම සඳහා විධායකය කුමක් කළද, අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ විනිසුරුවරුන් විසින් පළ කළ අභිමානවත් විරෝධයේ බලපෑම මකා දැමීමට තරම් ඒවා නොසෑහේ. තනතුරට වඩා සුදුසු පුද්ගලයෙකු පත්කිරීම් මුවාවෙන් විධායකය විසින් හිටපු අගවිනිසුරුවරිය පළවා හැරීම සඳහා වූ විධායකයේ ප්‍රකට නිර්ණයනය තුළ සිය රාජකාරිය සිදුකිරීමේ අනිටු ඵලවිපාක ඔවුන් හොඳින් දැන සිටින්නට ඇත.

ආචාර්ය මාක් කුරේ අවනතභාවය පිළිබඳ මෙසේ කියයි. *“රාජ්‍යයක මූලික නීතිවලට අවනත වීම වැදගත් යැයි මම විශ්වාස කරමි. එහි අන්තර්ගතය සමග මා එකඟ නොවිය හැකි නමුත් මම අවනතභාවය විශ්වාස කරමි. දෝෂාභියෝගය පිළිබඳ විවාදය විසින් මෙකී මානයන් බොඳ කිරීමට නැඹුරුවක් ඇති කර තිබේ”.* රාජාණ්ඩුව සහ සෙසු පරම බලය සහිත ආකෘතීන්ට එරෙහිව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයට විකසනය විය හැක්කේ, ආශ්‍රිත කරුණුවලින් අකීකරු වීම පිණිස ඉල්ලා සිටිනු ලබන අවස්ථාවන්හිදී එසේ අකීකරුවීමට තරම් නිර්භය වන්නන්

තවමත් අන්ධකාර යුගය තුළ පවතින්නට ඉඩ තිබිණි. එබඳු මුරණ්ඩුකමක් සඳහා එක් දිදුළන නිදසුනක් වූයේ ශ්‍රීමත් තෝමස් මුවර් සහ තමන්ගේ දස දහස් ගණන් ජනයා මත බලපෑ හැකි බලයට එරෙහිව නැගීසිටි සෙස්සන් ය. අවාසනාවකට මෙන්, ශ්‍රී ලංකාවේ නීති ගණයා අතර, නීතිඥවරුන්, විනිසුරුවරුන් හෝ විද්වතුන් අතරින් මෙවැනි ධෛර්යයක් ප්‍රකට කළවුන් සිටියේ අඩුවශයෙනි. එය එසේ සිදුවූයේ, දිගු කාලයක් මුලුල්ලේ නීතිඥවරුන් සහ විනිසුරුවරුන්ගෙන් බහුතරය ආවේණික වශයෙන්ම සම්ප්‍රදායික ප්‍රභූ පසුබිමකින් පැමිණි නිසා විය හැකිය. කෙසේ නමුත් දෝෂාභියෝගයට සම්බන්ධ නඩු තීන්දු ලබාදුන් ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසුරුවරු එක් මොහොතකට හෝ, එම අකීකරු බවේ ධෛර්යය ප්‍රකට කළහ. එසේම ආචාර්ය ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය ද, තමන්ට ඉල්ලා අස්වීමට සිදුකළ පීඩනයන් ප්‍රතික්ෂේප කරමින් සහ අවසානය දක්වාම සටන් වදිමින් එබඳු ධෛර්යයක් ප්‍රකට කළාය. සමහරවිට ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට, නීතිඥවරුන් සහ විනිසුරුවරුන් අති විශාල සංඛ්‍යාවක් ද දෝෂාභියෝගයට විරුද්ධ වීමේදී සිය අවබෝධයේ ධෛර්යය ප්‍රකට කර සිටියහ.

### අනාගත ලිවීම පිළිබඳ ආචාර්ය මාක් කුරේගේ පොරොන්දුව

*‘‘කුලය, ප්‍රජාව, භාෂාව, ආගම හෝ ජාතිය යන පදනම් මත විධායකය හෝ ව්‍යවස්ථාදායකය විසින් පුරවැසියන්ට එරෙහිව සිදුකළ හැකි වෙනස්කොට සැලකීම්වලට එරෙහිව කාලසීමා රහිතව සංස්ථාපනය වන අධිකරණමය වශයෙන් බලාත්මක කළ හැකි අයිතිවාසිකම් ඇතුළත්ව වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කළ හැකි ශෝධනයන් යෝජනාවන් අනාගතයේ මවිසින් ලියනු ඇත’’.*

ආචාර්ය මාක් කුරේගේ අතීත ශිෂ්‍යයෙකු වශයෙන්, මේ දේවල් ලිවීමෙන් සිය කාලය නාස්ති කරගන්නට උවමනාවක් නැති බව ඔහුට යෝජනා කිරීමේ නිදහස මා සතු ය. අයිතිවාසිකම් බලාත්මක කර ගැනීම සඳහා වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වාතාවරණයක් ශ්‍රී ලංකාවේ නොපවතියි. වඩාත්ම මූලික නෛතික ප්‍රතිකර්මය වන හේබියස් කෝපුස් රිට් ආඥා පවා ශ්‍රී ලංකාවේ තවදුරටත් බලාත්මක නොවේ. මේ බව කිශාලි පින්ටෝ-ජයවර්ධන සහ ජයන්ත ද අල්මේදා ගුණරත්න විසින් රචිත *Habeas Corpus in Sri Lanka; Theory and Practice of the Great Writ in Extraordinary Times* ග්‍රන්ථය මගින් මනා ලෙස විදහා දක්වා ඇත. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ආකෘතිය විනාශ කළ වහා අයිතිවාසිකම් බලාත්මක කර

“

ආචාර්ය මාක් කුරේගේ අතීත ශිෂ්‍යයෙකු වශයෙන්, මේ දේවල් ලිවීමෙන් සිය කාලය නාස්ති කරගන්නට උවමනාවක් නැති බව ඔහුට යෝජනා කිරීමේ නිදහස මා සතු ය. අයිතිවාසිකම් බලාත්මක කර ගැනීම සඳහා වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වාතාවරණයක් ශ්‍රී ලංකාවේ නොපවතියි. වඩාත්ම මූලික නෛතික ප්‍රතිකර්මය වන හේබියස් කෝපුස් රිට් ආඥා පවා ශ්‍රී ලංකාවේ තවදුරටත් බලාත්මක නොවේ.

”

ගැනීම මායාවක් බවට පත්වේ. ඔහු අපට ඉගැන්වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සිද්ධාන්ත අදට වලංගු නොවන්නේ රට ආරක්ෂක අමාත්‍යාංශය විසින් පාලනය කරන ජාතික ආරක්ෂාවේ රාජ්‍යයක් බවට පත්වෙමින් තිබෙන නිසා ය. මේ තත්වය වෙනස් වන තෙක් අයිතිවාසිකම් බලාත්මක කිරීම ගැන ලිවීම හෝ ඒ වෙනුවෙන් සටන් කිරීම ඉතා භයානක දෙයක් වනු ඇත. එබඳු පරිශ්‍රමයක් පවා එල්ටීටීඊයට නව පණක් ලබාදෙන විදේශීය කුමන්ත්‍රණයක් යැයි කීමට ඉඩ තිබේ. ආණ්ඩුව සතුටු වන ආකාරයේ දෙයක් කර ඇති හෙයින් සෙසු පුරවැසියන් ජීවත් වන සාමාන්‍ය තත්වයන්ගෙන් තමන්ට ගැලවීමක් ලැබෙතැයි ඔහු නොසිතිය යුතුය. ආණ්ඩුවට එක් කලෙක සහයෝගය දැක්වූවන් ද ඇතුලුව සෑම අයෙක් සඳහාම සුදු වෑන් රථය බැගින් තිබේ.

ආචාර්ය සුනිල් කුරේ (ඔහුද ආචාර්ය මාක් කුරේගේ අතීත ශිෂ්‍යයෙකි) දෝෂාභියෝගය සම්බන්ධයෙන් ආචාර්ය මාක් කුරේ සමග කළ සංවාදයක් ගැන මා සමග කීවේය. ආචාර්ය සුනිල් කුරේ නගා ඇත්තේ උපකල්පිත පැනයකි. උපකල්පනයක් සේ සිතා කතා කරන්නේ නම්, යම්කිසි පුද්ගලයෙකුට බොරු චෝදනා නගා ඔහුව අගවිනිසුරු තනතුරෙන් ඉවත් කළහොත් එම පුද්ගලයාට කුමක් කළ හැකිදැයි ඔහු ඇසුවේය. එවිට ආචාර්ය මාක් කුරේගේ පිළිතුර වී ඇත්තේ ඊළග මැතිවරණයේදී ආණ්ඩුව වෙනස් කරන ලෙස ය. දැන් හැබෑවට ලියා ඇති දේ වෙනුවට ඔහු එය ලීවා නම් එය වඩාත් යථාර්ථවාදී සේම ප්‍රයෝජනවත් දෙයක් වනු ඇත.

“ ආචාර්ය සුනිල් කුරේ (ඔහුද ආචාර්ය මාක් කුරේගේ අතීත ශිෂ්‍යයෙකි) දෝෂාභියෝගය සම්බන්ධයෙන් ආචාර්ය මාක් කුරේ සමග කළ සංවාදයක් ගැන මා සමග කීවේය. ආචාර්ය සුනිල් කුරේ නගා ඇත්තේ උපකල්පිත පැනයකි. උපකල්පනයක් සේ සිතා කතා කරන්නේ නම්, යම්කිසි පුද්ගලයෙකුට බොරු චෝදනා නගා ඔහුව අගවිනිසුරු තනතුරෙන් ඉවත් කළහොත් එම පුද්ගලයාට කුමක් කළ හැකිදැයි ඔහු ඇසුවේය. එවිට ආචාර්ය මාක් කුරේගේ පිළිතුර වී ඇත්තේ ඊළඟ මැතිවරණයේදී ආණ්ඩුව වෙනස් කරන ලෙස ය. දැන් හැබෑවට ලියා ඇති දේ වෙනුවට ඔහු එය ලීවා නම් එය වඩාත් යථාර්ථවාදී සේම ප්‍රයෝජනවත් දෙයක් වනු ඇත. ”

කෙසේ නමුත් ආචාර්ය සුනිල් කුරේ ට තවත් එක් ප්‍රශ්නයක් නැගිය හැකිව තිබිණි. එය නම්, නිදහස් හා සාධාරණ මැතිවරණ තවදුරටත් පැවැත්විය නොහැකි නම්, එබඳු අයෙකුට තිබෙන විකල්ප මොනවාද යන්නයි. ආචාර්ය මාක් කුරේ ලබාදුන් පෙර පිළිතුර විමසා බලන විට උපකල්පනය කළ හැක්කේ ඔහුගේ පිළිතුර කිසිවක් නැත යන්න වනු ඇති බවයි.

රටේ පැතිර පවත්නා දේශපාලන වාතාවරණය පිළිබඳ සාමාන්‍ය අර්ථකථනයේ සත්‍යවාදී බව පිළිබඳ ආචාර්ය මාක් කුරේ සැක කරන්නේ නම් ඔහුට කළ හැකි දෙයක් වනු ඇත්තේ නීතීඥ වෘත්තියේ නියැළී සිටින ඔහුගේ අතීත ශිෂ්‍යයන් කිහිප දෙනෙකු හමුවී ඔවුන්ගේ වත්මන් සන්දර්භය පිළිබඳ විමසා බැලීමයි. ඔහු එසේ කළේ නම් සහ ඔහුගේ අතීත ශිෂ්‍යයන් ඔහු සමග නිදහසේ කතාකිරීමට තරම් ඔහුව විශ්වාස කරන්නේ නම්, කුඩා පොත් රැසකට සෑහෙන සත්‍ය කතාන්දරයන් ඔහුට අසන්නට ලැබෙනු ඇත. ඔහුගේ එක් ශිෂ්‍යයෙක් වන ජනාධිපති නීතීඥවරයෙක් (PC) මට වාර ගණනාවකදීම කියා ඇත්තේ -

වත්මන් තත්වය යටතේ සිය නෛතික වෘත්තියේ තවදුරටත් යෙදෙනවාට වඩා කුලී රථ සේවයක් පවත්වාගෙන යාම ගැන තමන් බොහෝවිට සිතනා බවයි. සෑම දිනකම අත්‍යන්ත නිෂ්ඵලභාවය පිළිබඳ හැඟීමෙන් යුතුව අධිකරණයට යන තමා ඊටත් වඩා නිෂ්ඵල හැඟීමකින් යුතුව ආපසු නිවසට යන බව ඔහු කියයි. ආචාර්ය මාක් කුරේ හට එස්.එල්. ගුණසේකර විසින් රචිත *Lore of the Law* ද කියවා බැලීමට පුලුවන.

“

ඔහුගේ එක් ශිෂ්‍යයෙක් වන ජනාධිපති නීතීඥවරයෙක් (PC) මට වාර ගණනාවකදීම කියා ඇත්තේ වත්මන් තත්වය යටතේ සිය නෛතික වෘත්තියේ තවදුරටත් යෙදෙනවාට වඩා කුලී රථ සේවයක් පවත්වාගෙන යාම ගැන තමන් බොහෝවිට සිතනා බවයි. සෑම දිනකම අත්‍යන්ත නිෂ්ඵලභාවය පිළිබඳ හැඟීමෙන් යුතුව අධිකරණයට යන තමා ඊටත් වඩා නිෂ්ඵල හැඟීමකින් යුතුව ආපසු නිවසට යන බව ඔහු කියයි.

”

ගතවූ දශකයන් කිහිපයේදී, නීතීඥ වෘත්තියේ මෙන්ම ශාස්ත්‍රයේද ප්‍රකට ප්‍රසිද්ධ පුද්ගලයන් සම්බන්ධව ඉතා පුදුමාකාර සිදුවීම් දැකගන්නට ලැබිණි. 1972 සහ 1978 ආණ්ඩුක්‍රමයන් කෙටුම්පත් කළවුන් සහ එම ආණ්ඩුක්‍රමයන් ට සහයෝගය දැක්වූවන් ට නීතිය උගත් අය බොහොමයක් දෙනා ද ඇතුළත් ය. ඔවුහු අධිකරණයේ ස්වාධීනත්වය සහ නෛතික ක්‍රමය විනාශ කිරීම සඳහා චකිතයකින් තොරව ප්‍රකට භූමිකාවල යෙදුණහ. මෙහිදී මට බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින්ගේ ප්‍රකාශයක් සිහියට නැගෙයි. ‘‘ඉතා උගත් ඔහුට, අශ්වයෙකු භාෂා නවයකින් නම් කළ හැකිවිය. නමුත් පිටේ නැගයාම සඳහා තමන් මිලදී ගෙන තිබෙන්නේ එළදෙනක් බව ඔහු නොදත්තේය’’.

## නිගමනය

අධිකරණයේ ස්වාධීනත්වයට 1972 සහ 1978 ආණ්ඩුක්‍රමයන් මගින් පීඩා සිදුවී ඇති බව ප්‍රකාශ කරන අතරම , නොබෝදා සිදුකළ අගවිනිසුරුවරියගේ ඉවත්කිරීම සහ ඉන්පසුව නව අගවිනිසුරුවරයෙක් පත්කිරීම, අධිකරණයේ ස්වාධීනත්වයට තවදුරටත් පීඩා කිරීමක් (හෝ එසේ නොමැති නම් නියත වශයෙන්ම එය සහමුලින් විනාශ කිරීමක්) බව සලකා නොබලයි. අගවිනිසුරුවරිය ඉවත් කිරීම සබැඳි ගැටලු සංශුද්ධ වශයෙන් තාක්ෂණික අර්ථය දක්වා ඌනනය කිරීමට ඔහු උත්සාහ කරන අතර ශ්‍රී ලංකා පුරවැසියන්ගේ ස්වාධීනතාවයන් විනාශ කරන අවරෝධන මාලාවක වැඩිදියුණුවීමක් ලෙස දැකීමට අපොහොසත් වෙයි. නැග එන අවරෝධනයන් සලකා බැලීම ප්‍රතික්ෂේප කිරීම මගින් ඔහු, ඇතැම්විට නොදැනුවත්වම, එහි සමාව අයදින්නෙකු බවට පත්ව ඇත.

මේ ගැටලු හුදු අපරිපූර්ණතාවයන් ලෙස සහ ඉතා සාමාන්‍ය දේ ලෙස දකින ඔහුගේ දර්ශනය, ශ්‍රී ලංකාව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වකීය පදනමෙන් ඉවතට ගසාගෙන ගොස් ඇති බව සහ විධායකය විසින් අධිකරණයේ පාලනය සියතට ගෙන ඇති බවට වන යථාර්ථය ග්‍රහණය කර ගැනීමට අපොහොසත් වෙයි. විධායකය විසින් 'අධිකරණයට පීඩාකිරීම' සහ පුරවැසියන්ගේ ස්වාධීනතාවයන්ට පහර දීම අතර අන්තර්සම්බන්ධතාවයක් ඔහු නොදකියි.

අධිකරණ නිලධාරීන් විසින් උත්තම්භනය කරනු ඇතැයි අපේක්ෂා කරන අවංකභාවයේ ඉහළ ප්‍රමිතීන් පිළිබඳ කතාකරන අතරම, ශ්‍රී ලංකාවේ විධායකය අධිකරණ නිලධාරීන් පත්කිරීම සහ අස්කිරීම සිදුකරන විට එබඳු අවංකත්වයක් වෙත ලබාදෙන්නේ අඩුම අවධාරණයක් බව ද ඔහු අමතක කරයි. අයිතිවාසිකම් බලාත්මක කිරීම සම්බන්ධයෙන් ලිවීමට පොරොන්දු වන අතරම අධිකරණ ස්වාධීනත්වයකින් සහ ස්වාධීන ලෙස ක්‍රියාකරන මහජන ආයතනවලින් තොරව එබඳු බලාත්මක කිරීමක් කළ නොහැකි බව ද හඳුනාගැනීමට ඔහු අසමත් වෙයි. මහජන ආයතන හරහා හිමිකම් සුරක්ෂණයට ගනු ලැබූ සියලු පරිශ්‍රමයන් අහෝසි කිරීමෙහිලා 18 වන සංශෝධනයේ සුවිශේෂී බව ග්‍රහණය කර ගැනීමට ඔහු අපොහොසත් වෙයි. සිය තර්කයන් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පදනම් කර ගැනීමට වෑයම් කරන අතරම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය ශ්‍රී ලංකාව තුළ කොතරම් අනනුකූල වී ඇත්දැයි වටහාගැනීමට ඔහු අසමත් වෙයි.

ශ්‍රී ලංකාවේ අගවිනිසුරුවරිය ඉවත්කිරීම සහ මෝටිමර් විදහා දැක්වූ පරිදි '*ආණ්ඩුව එකඟ නොවන මත දරන සෑම අයෙකු සම්බන්ධයෙන් ම පවතින සාධාරණත්වය සහ අධිකරණ ස්වාධීනත්වය හරයේ පවතින*' සහ මූලික අමුද්‍රව්‍ය හරහා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයන් තවදුරටත් ක්‍රියාත්මක භාවයේ පවතින සෙසු රටවල් අතර ප්‍රතිසමතාවයක් ගොඩනැගීමට උත්සාහ කිරීමේ සකල අනනුකූලතාවය ඔහු මූලික වශයෙන්ම නොසලකා හරියි.

“ නැග එන අවරෝධනයන් සලකා බැලීම ප්‍රතික්ෂේප කිරීම මගින් ඔහු, ඇතැම්විට නොදැනුවත්වම, එහි සමාව අයදින්නෙකු බවට පත්ව ඇත.

මහජන ආයතන හරහා හිමිකම් සුරක්ෂණයට ගනු ලැබූ සියලු පරිශ්‍රමයන් අහෝසි කිරීමෙහිලා 18 වන සංශෝධනයේ සුවිශේෂී බව ග්‍රහණය කර ගැනීමට ඔහු අපොහොසත් වෙයි.

සිය තර්කයන් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පදනම් කර ගැනීමට වෑයම් කරන අතරම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය ශ්‍රී ලංකාව තුළ කොතරම් අනනුකූල වී ඇත්දැයි වටහාගැනීමට ඔහු අසමත් වෙයි. ”

